
# ශෝභා

Shoba



මනෝරි සිලිකා වික්‍රමආරච්චි
MANORI SILIKA WIKRAMA ARACHCHI

# ශෝභා

මනෝරී සිලිකා වික්‍රමආරච්චි

## මා ලියූ පොත්....

හමුවූයේ වෙන්වන්නද-1
හමුවූයේ වෙන්වන්නද-2
හමුවූයේ වෙන්වන්නද-3
හමුවූයේ වෙන්වන්නද-4
හන්තාන සිහිනේ 1
හන්තාන සිහිනේ 2
සහන මියගියාය
අපිට අපි හරි ආදරෙයි
සංසුන් ප්‍රාර්ථනා
සුලෝචනා
පිං මද්දද මිං පිපුනේ
පෙති හැති මල මම
ඔබ අසමසමයි
ඔබ සඳකි කළුවරයි මම
සෙනෙහා
මල් පොහොට්ටු
නාඩං දාස්පෙති 1
නාඩං දාස්පෙති 2
මුතු පබලු ඉහරි
රත්තරං සුස්මි
නේත්‍රාවි
සඳළු අරන් ඔබ ආවා (වැහිකිරිල්ලී)
හිමිනා - (මල්රේණු)
ආදරය ඔබ
රන්මුතු
සෙනෙහස පහනක්
භූමි (මේ ආදරේ වාසනාවන්)
පිච්චමල්
ශෝබා
දුක් ගීයක්
සඳකි නුඹ මට
රත්තරං මැණික

**කෙටිකතා**
සමාකරන් මට
(2000 යෞවන සම්මාන ප්‍රථම ස්ථානය)
භාවනා කෙටිකතා

**කාව්‍ය**
මගේ පණ ඔබ
ඔබට මා ජය

**විශේෂාංග**
පාරමිතා

**ළමා**
Beautiful Rhymes

**අධ්‍යාපන**
3-4-5 ශ්‍රේණි පරිසර ප්‍රශ්න 2000 ක්



## පෙරවදන.!

අඳුරකට පසු ආලෝකයක් හමුවේ. කඳුළකට පසු සිනාවක් හිමිවේ. මේ සත්‍යයද නොදනිමි. හේතුව මම ඔය ආලෝකයවත්, මම ඔය සිනහවවත් නොදුටුවෙමි.

දැන රිදෙන තුරු ලිවත් දුන් හිත නොසැනසේ. මීට මොහොතකට පෙර මම හාත්සිවි එකසිය පනහක් ලියා අහවර කළෙමි. හිත තව තව රිදුනා මිසක මට සැනසීම නොවේ.

*සැනසීම කොතැනකද?*
*සුදු මල්ලියේ...*
*ඔය සොහොන මැද...*
*ඔය තරම් ලොකු සැනසීමක්*
*නුඹ දුටුවාද?*

නොවේ... මරණය වැළඳගත්තේ ජීවිතයට බය අයය. ජීවිතයෙන් පැනයාමටය. එය නිවැරදි කරන්න මට බැරිය. මේ වේදනාව නුඹට කියාදෙන්න මා පමා වූ ඒ සත්‍යයටය.

- මනෝරි සිලිකා වික්‍රමආරච්චි-

491/3,
පරෝපකාර මාවත,
බොරලැස්ගමුව.
077-6449682

--- පිදුම ---

එදත්..

අදත්..

එකම විදිහට..

මට ලෙංගතු වූ...

මගේ මාර්ගෝපදේශකයාණන් වූ

මල්පියලි අධිපති

අෑ. ලයනල් ද සිල්වා මැතිතුමාණන්ට....



# 1

**වැ**හි වැටෙනවා

දුක හිතෙනවා....

කඳුළක් හොරැහින්

බලනවා...

පාට පාට

මල් හීනෙක

ඔයා ඒවිදැයි

හිතෙනවා...

ඒ මා ලියූ තිසදැසක කොටසකි. පූර්ණ එය කීවේ හඬනගාය. පංතියේ කවුරුත් සිනාසුණහ. ඒ අතර නිම්සරත් වූවේය. මූව අගින් හිනහෙන විට ඔහු ලස්සනය. මට ලැජ්ජාවක් දැනිණ.

"බලපංකො නිම්සර... ශෝබාගෙ ගොන් පාට් එක ගැහිල ගියානෙ මේ හර බර වදන් පේළියෙන්..."

පූර්ණ කීවේ මුළු පංතියම සිනහ ගන්වමිනි. නිම්සර ද ඒ අතර විය. සෝ බර වූ නෙතු මම උපැස් යුවළින් ඇතුළට නමා ගත්තෙමි. පංතියේ ලස්සනම කෙල්ල දහැන්යා නිම්සර ළඟට දිව ආවාය.

"ඔය ගාණ මටත් තේරුණේ නෑ දූහැන්යා... ඕක දන්නේ ශෝබා විතරයි...."

නිම්සර කියනවාත් ඇසිණි. මෙ උසස් පෙළ ගණිත අංශයේ "බී" පංතියයි. ගණිත අංශයේ දක්ෂම සිසුවිය මාය. ඒත් ගැහැනු ළමුන් හෝ පිරිමි ළමුන් මා රිසි වූයේ නැත. ඔවුන් මට එක එක නම් පට බැඳ තිබිණි. 'ගොන්පාට්' කණ්ණාඩි පොළඟි, තෝ ශෝබා කීපයකි. මම තනිව තැවුණෙමි. මා තරම් උගත් නැති කෙල්ලන් සතුටින් ඉද්දී මම තැවුණෙමි.

"ශෝබා.."

ඒ නිම්සරය. මම දැස් පෑවෙමි. දූහැන්යා මට වොක්කක් ඇන්නාය.

"පච් දූහැන්යා...."

නිම්සර කීවේය. මා වෙනුවෙන් මේ පාසලේම ළතෙත් වූ එකම හදවත ඔහුගේය.

"ගොන්පාට් තොදා මේ ගාණ කියලා දෙනව හලෝ..."

දූහැන්යා කීවාය. මම ඒ ගණිත අතටවත් නොගෙන බලා උන්නෙමි.

"බලපංකො තෙරංජි මේකිගෙ තියෙන ගණන්...."

දූහැන්යා කීවාය.

"ගණන් බලන්න ශෝබාගෙ ගෙදර ප්ලයං. තාත්ත පොලිසියෙනෙ..."

තෙරංජි කීවාය.

"කියල දෙනවද නැද්ද..?"

"නෑ.."

මම කෝපයෙන් කීවෙමි.

"ලබන ආත්මෙත් උඹ ගොන් පාට් වෙලාම ඉපදියං..."

ඇසට කඳුලක් නැගිණි.





"මොකද ඔරවන්නෙ.... පොලිස් තාත්තට එන්න කියපං කෙල්ලෙ... අපි බය නෑ..."

"දූහැන්යා යනවා මෙතනින්..."

නිම්සර කීවේය.

"ඔයාට ඉතිං කවදත් දුකනෙ... කසාද බැඳගන්න... හැබැයි පාරෙ බැහැල යන්න බෑ... නේද..."

මම උපැස් යුවළ ගලවා ඇහෙන් කඩා වැටෙන කඳුළු පිස්සෙමි.

"ඔයා අඬනවද.... ඒයි ශෝබා..."

නිම්සර මා ඉදිරියේ පුටුවක් ඇද හිඳ ගත්තේය. මගේ අත් දෙකින් අල්වා ගත්තේය. මම ඩෙස්කුවේ හිස තබාගෙන හැඬීමි.

"ශෝබා... ප්ලීස්..."

මම මොහොතක් හඬා දුක අහවර කෙළෙමි. ඊළඟට හිස ඔසවා ආයේ උපැස් යුවළ පැළඳීමි.

"දෙන්න ගාණ කියල දෙන්න..."

මම කීවෙමි. ඒත් මා දෙස බලා උන්නා මිසක ඔහු ගණන ලියූ කොළය දුන්නේ නැත.

"දෙන්න..."

ආයේ මම කීවෙමි.

"කවුද ඒ නිසැඳැස ලිව්වෙ ඔයාද..?"

නිම්සර ඇහුවේය. මම කතා නොකළෙමි.

"ඔයාද..?"

ඔහු ආයෙත් ඇහුවේය. "ඔව්" කියන්නට මම හිස සැලුවෙමි.

"ලස්සනයි..."

ඔහු කීවේය. මම මදහසක් නැගුවෙමි.

"හරිම ලස්සනයි...."

"ඒක පූර්ණ ළඟද..?"

"නෑ මං ළඟ..."

"දෙන්න..."

මම කීවෙමි.

"තිබුණාවෙ..."

නිම්සර කීවේ මගේ දෙස බලාගෙනය. ඔහු ලස්සනය. කඩවසම්ය. දුහැන්යා හා ඔහු අතර ප්‍රේමයක් වෙතැයි බොහෝ අය සිතති. මම ද සිතමි. ඒත් එය එසේ නොවේවායි පතමි. හැමදාමත් පැතුවෙමි. ඒ ඇයි..? හැමදාමත් මටම නොදනී හැඬෙන පුරුද්දක් මට විය. පුංචි කාලයේ පටන්ම මම එහෙම හැඬුවෙමි.

"ඇයි පුතේ..?"

තාත්තා අසයි.

"මුකුත් නෑ තාත්තා..."

"මගෙ පුතා ඉන්නෙ පොලිස්කාරයෙක්ගෙ ගෙදර... මට හොරා අල්ලන්න පුළුවන්... කියන්න කවුද මගෙ දූවව ඇඬෙව්වෙ..?"

"තාත්තා මට කණ්ණාඩි දාන්නෙ ඇයි..?"

"පුතාගෙ ඇස් දුරට ටිකක් පේනවා මදි ඒකයි..."

"තාත්තා මං කැතද..?"

"ලෝකෙ ඉන්න ලස්සනම දූ මගෙ දූ.."

"තාත්තා ළමයි මට නම් කියනවා... කණ්ණාඩි පොළඟා කියනවා.... මෝඩි මෝඩි කියනවා..."

ඒ පුංචි මම තාත්තා බදාගෙන හඬන්න තරමට බොළඳ වූයෙමි. තාත්තා මට කිසිවක්ම නොකියා පාසලේ මගේ පංතියට ඇවිත් මට වද දෙන ළමයින් ගැන මගේ ගුරුවරියට පැමිණිලි කළේය. ගුරුවරිය ඒ ළමුන්ට දඬුවම් කළාය.





"ටීචර් කියනවා මගෙ දූ දක්ෂ නිසා ළමයි චූට්ටක් ඉරිසියාලු.. ඕව දෙමව්පියො ළමයින්ගෙ ඔළුවට දාන ඒවනෙ පුතේ..."

තාත්තා කීවේය. හොරණ තක්ෂිලාව මට මනරම් තැනක් නොවුණේ එහි උන් සමහර ළමුන් නිසාය. සමස්ත දරු දැරියන්ම මට සිනාසෙනවාය. ලැජ්ජා කරනවාය. මා හෙළා දකිනවාය යන බර දුකක මම පැටලීගෙන විඳවූවෙමි. වීටෙක කැඩපත ඉදිරියට වී මගේම විදිහ බලාගෙන උන්නෙමි. මා උසය. සුදුය. හැඩය. ඒත් දුහැන්යා වාගේ නොවේ. මම කඩිසර නොවීමි. කා සමඟවත් සුහද වන්නට මට බැරි විණි. කිසිවකු මා සමඟ ඉක්මනට හෝ පහුව් මිත්‍ර නොවුණේ ඇයි..?

"ඔළුව ඉදිමිලා..."

සමහරු කීහ. මම පංතියේ හැමදාම පළමුවැනියා වූයෙමි. ඒත් කොන් වූයෙමි. දාංගලයක් වූ දුහැන්යා පංතියේ පහ හය වෙනියා උනත් පාසලේ කැපී පෙනෙන ශිෂ්‍යාවක වූවාය. හදවතේ තිබුණේ මා ගැනම අප්‍රසන්න බවකි. මා මටම වැදගත් නැති කෙනෙකු වාගේ පෙනිණී.

"මොකද කල්පනාව..?"

නිම්සර ඔහු මගේ කල්පනාව බිඳ දැම්මේය. මම ඒ මුහුණ බැලුවෙමි. ඇත්තටම මා බොහෝ වෙලා කල්පනා කෙරුවා නොවේද..?

"ඔය තරම් හිතන්න එපා... සැහැල්ලුවෙන් ඉන්න ශෝබා.."

"මට මං ගැනම දුක හිතෙනවා..."

මම මුල්ම වතාවට මා ගැන නිමසරට කීවෙමි.

"ඔයා ඔයා ගැන සතුටු වෙන්න..."

"නිමසර.... ඔයාවත් කියන්න. මං අමුතුද..?"

මම ඇහුවෙමි. නිම්සර මගේ දෙස බැලුවෙමි.

"ඔව් අමුතුයි... වැඩිය හිනාවෙන්නෑ වැඩිය දඟලන්නෙ නෑ... හොඳට ඉගෙන ගන්නවා... ඒ සේරම අමුතුයි..."

නිමසර කිවේය. හැමදාමත් මගේ හිත හැදෙන්නේ නිමසර නිසාය. මා එක්ක එක වචනයක් දෙඩුවේ නිමසරය.

"මට වෙලාවකට හිතෙනවා..."

"මගෙ අම්මා මැරුණෙ මගෙ කාලකණ්ණි කමටද කියල..."

නිමසර මගේ අත උඩින් අත තැබුවේය.

"ඔයාගෙ අම්මා ඔයාව දාල ගියෙ දාල යන්නම උන නිසා... නැත්තං ඔයා වගේ හොඳ දුවෙක්ව ඔයා වගේ දාහකින් හොයා ගන්න බැරි දුවෙක්ව ඔයාගෙ අම්මා කවදාවත් දාලා යන්නෙ නෑ... තව එකක් ඔයාගෙ අම්මා ඇස් දෙක පියාගන්න ඇත්තෙ සතුටින් ශෝබා... එයා මැරෙද්දි සතුටු වෙන්න ඇති මට ඉන්නෙ හොඳ දුවෙක්... එයාව තනි කරල යන්න මං බයවෙන්න ඕනැ නෑ කියලා..."

නිමසර කිවේය. ඇස් පියන් තද කර මම කඳුළු නතර කර ගත්තෙමි.

"එන්නකො නිම්..."

දුහැන්යා නිමසරගේ අතින් ඇද්දාය. එය එසේ නොවුණේ නම් හොඳ යැයි මට සිතුණේ නිමසර මගේ ළඟ උන්නා නම් මට පාළු නැති නිසාය. මගේ දුක අඩුවන නිසාය. ක්‍රීඩා පාසල් තරඟ ළඟ නිසා නිමසර ද ක්‍රීඩා පිටිය දෙසට දිව ගියේය. පංතියේ කවුරුත්ම නැත. මම නිමසරගේ පුටුව ඇද හිඳ ගත්තෙමි. ඔහුගේ පොතක් ගෙන අන්තිම පිටුව පෙරලුවෙමි.

"ඇසට කඳුලක් ඇවිත්
මං ගැනම දුක හිතෙන
මේ සුළං බිඳ තරම්
නොවටිනා කෙනෙකි මම...
මතක තිබුණෙත් දිනෙක්
මෙ සොඳුරු නැති දසුන
මඳහසක් නගනු මැන
ඒ ඇසිය මට හිතෙන.."





මම ඔහුගේ පොතේ පිටුවක එහෙම කුරුටු ගෑවෙමි. හිතුණේ එය වරදක් ලෙසය. පිටුව කඩා දමන්නට ආයේ සිතිනි. ඒත් ඒ සිතිවිලි පරාද වූයේ නිමසර පංතිය දෙසට එනු දුටු නිසාය. මම ඉක්මනට මගේ පුටුවේ හිඳ ගත්තෙමි.

"යං ග්‍රවුන්ඩ් එකට.."

"බැහැ..."

"ඇයි.."

"නිකං..."

"මං දුවනවා එන්නැද්ද බලන්න.. ඔයාව එක්ක යන්නමයි ආවෙ..."

බෑ කියන්නෙ කොහොමද... මම නැගිට ගත්තෙමි.

"හේයි... අද වහියි පුටුවෙන් නැගිටිනවා..."

නිමසර සිනාවිණි. මම ඔහු එක්ක එකට අඩි තැබුවෙමි. ඔහු මගේ දිග කොණ්ඩ කරළක් අතට ගත්තේය.

"ඔයාට ශෝක් කොණ්ඩයක් තියෙනවා..."

ඔහු කීවේය. මම සතුටු වූයෙමි. මගේ කුමක් හෝ ලස්සනක් තියේ. මම මගේ සුදුමැලි වූ අත් දෙස බැලුවෙමි. මොන ලස්සනක්ද..? දුහැන්යා කහ පාටය... කිරිගරුඬ පිළිමයක් වාගේය. මා සුදුමැලිය.

"මම දිනයිද පරදියිද..?"

නිමසර ඇසුවේය.

"දිනනවා..."

මම කීවෙමි.

"ඇත්තටමද..?"

"හැම ආත්මෙකම දිනයි..."

මට කියවිණි. ඔහු මගේ කොණ්ඩය බැඳි පීත්ත පටිය ලිහාගෙන එය ඔහුගේ අතේ ගැටගසා ගත්තේය.

"හැමතිස්සෙම තනිවෙන්න එපා... එන්න දූහැන්යා ළඟට යං.."

"මට බෑ..."

"ප්ලීස් මං නිසාවත්..."

බෑ කියන්නේ කොහොමද... මම දූහැන්යාගේ කණ්ඩායම වෙත ගියෙමි.

"කොහොමද බං ඔය මල් ගහ ඉස්සුවේ..."

පූර්ණ ඇසුවේය.

"උඹල කවුරුවත්ම ශෝබාට වචනයක්වත් කියන්නැත්නම් මං කැමතියි..."

නිම්සර කීවේය. කහ පාට දූහැන්යා අමුතු මදහසක් නැගුවාය.

"මං දිනලමයි එන්නෙ..."

නිම්සර ක්‍රීඩා පිටිය තුළට දිව ගියේය.

"මූට මොනව වෙලාද..?"

පූර්ණ ඇසුවේ දූහැන්යාගෙනි.

"කවුද දන්නෙ... මොනවට උණු වෙලාද කියල..."

"හරි හරි ශෝබා අපි අද ඔයා ගානෙ අයිස්ක්‍රීම් කමු..."

පූර්ණ කීවේය.

"මං සල්ලි ගෙනාවෙ නැතෙ..."

මම කීවෙමි.

"ඔයාට කතා කරන්න පුළුවන්නෙ ශෝබා... ඒක දූනගත්තෙත් මේ දූන්..."

සුපුන්යා කීවාය.

"ගාණක් ඇහුවම තියෙන ගනකම..."

දූහැන්යා කීවාය.





"වදේ නොගහ හිටපං... ඒක නෙමේ දූහැන්යා උඹ ඔය කහපාට වෙන්න කහ ගානවද..."

පූර්ණ ඇහුවේය. දූහැන්යා ඇස් කරකවා බැලුවාය.

"මමද... මම සුදුහඳුන් ගානවා... යෝගට් මූණෙ ගානවා..."

"උඹ පාප්ප ගාන්නැද්ද..."

පූර්ණ කිවේය. කවුරුත් සිනාසුනහ. සුදුහඳුන්... මම සිහියේ තබා ගත්තෙමි.

"සුදු හඳුන් වලට අමුකහයි මීපැණියි දාලා මික්ස් කරනවා..."

දූහැන්යා කීවාය. නිම්සර ඔහුගේ නිවාසය වෙනුවෙන් තරඟ වැද මීටර් සියය ජයග්‍රහණය කළේය. කෙටි සුදු ෂෝට් කලිසම හැඳ ඔහු ලා නිලට හුරු වී ෂර්ටයක් හැඳ උන්නේය.

"අරුගෙ ලස්සන දූහැන්යා..."

සුපුන්යා කීවාය. මමත් බැලුවෙමි. දූහැන්යා දිව ගොස් නිම්සරව අල්වා ගත්තාය. ඈ ඔහුට සුභ පැතුවේ ඇගේ එකීගෙනය. ඔය තරම් ඇගේ ඇතිලෙන්නට කාරණාවක් වේද...

"සතුටුද මං දිනුම..."

නිම්සර කීවේ මට විතරක්ය. මම ඔව් කියන්න හිස සැලුවෙමි.

"පව් බං නිමසර අමුතු ඇමක් එලනවා..."

පූර්ණ කිවේය. මට ඔවැනි කතා තේරුණේ නැත. ඒත් වෙනදාට වඩා මා ගෙදර ගියේ සැහැල්ලුවෙනි. මම හොඳට බත් කෑවෙමි.

"සුදු බේබී... ඇයි කොළ මැල්ලුම කන්නැත්තෙ..."

"මට එපාවෙලා උක්කු අම්මා..."

"එළවළුවක් කන්නෑ... කොළ මැල්ලුමක් කන්නෑ..."

උක්කු අම්මා හැමදාම වාගේ ඒ දහවලෙත් බැන්නාය. මම බැනුම් නෑසුනා වගේ ඉවසීමි. සිනාවී මග හැරීයෙමි.

"උක්කු අම්මා මට සුදු හඳුනුයි මී පැණියි අමුකහයි අඹරලා ඕන..."

"මොකටද..."

"දෙන්නකො..."

"හා හා මට වෙන රාජකාරී නෑ නොවැ..."

එහෙම කිවත් උක්කු අම්මා මට සුදු හඳුන් මිශ්‍රණය සාදා දුන්නාය. මම එය තලපයක් සේ මුහුණේ තැවරීමි.

"සුදු බේබි... අන්න කවුද ඇවිත් බලන්න..."

"උක්කු අම්මා මට යන්න බෑ..."

"යන්න යන්න... කවුද ඔය මූණ බලන්නෙ..."

මා හිතුවේ තාත්තා සොයා ආ කෙනෙකු නිසාය. තාත්තා හමු වන්නට ඔහුගෙන් උදව් ඉල්ලගෙන එනකෙනෙක් කියා සිතාය. සාලයට දිව ගියේ වේගයෙනි. ඔහු බකස් ගා හිනැහිණි.

"හා.... හා.... හා... පංතියෙ යාළුවෙක් නේද බොලේ..."

උක්කු අම්මා පිටුපසිනි. මම පෙරලාගෙන·දිව්මි.

"ඔන්න බලන්න ළමයො... කොළ මැල්ලුමක් උපන්දා සිට කටේ තියන්නෙ නෑ... එළවළු නෑ.. සුදු බතුයි පරිප්පුයි... මස් මාළු බිත්තර මුකුත් කන්නෙ නෑ. සුදුමැලි වෙනවා..."

මම නාන කාමරයට වැදී මුහුණ සේදුවෙමි. මා සාලයට එද්දී නිම්සර පුරුදු සිනාවෙන්ම උන්නේය. උක්කු අම්මා නිම්සර ඉදිරියේ හිඳගෙනය.

"මං ඒත් බැලුවා අපේ සුදු බේබිට කොහෙද යාළුවො කියල.... මේ ගමට අලුතින් ආව ගාමන්ට් ෆැක්ටරියෙ මහත්තයගෙ පුතාලුනෙ.."

උක්කු අම්මා වතගොත සොයාගෙනය. නිම්සර අපේ පාසලට ආවේ උසස්පෙළ පංතියේදීය. ඒත් ඔහු ඉක්මනට පාසලේ ජනප්‍රිය සිසුවකු වූවේය.





"මං බොන්න මොනා හරි ගේන්නං... සුදු බේබිගෙන් ගණන් අහගන්නලු ආවෙ කියන්නෙ..."

උක්කු අම්මා සාලයෙන් නික්ම යන අතර තුර කීවාය. මම ලැජ්ජාවෙන් බලා උන්නෙමි. ඔහු හිනැහේ.

"දූහැන්යාට කියන්න එපා."

මම කීවෙමි.

"දූහැන්යා කිව්ව අද මං බෝලයක් බැස්සුවා බොරුනං අදම ශෝබාගෙ ගෙදර ගිහින් බලන්න කියලා..."

නිම්සර කීවේ ඉවත බලාගෙනය. මගේ ඇසට කඳුළු නැගිණි.

"ඇයි තමන් ගැනම අවතක්සේරුවෙන් හිතන්නෙ..? ඔයා මොන තරම් ලස්සනද... ඒක ඔයා පිළිගන්න.."

ඇහි පියන් මත වූ කඳුළු කඩා වැටිණි.

"බබා වගේ හැම එකටම අඬන්න එපා..."

ඔහු මදක් සැරෙන් කීවේය.

"මම සුදුමැලියි..."

"සුදුමැලි නම් අර උක්කු අම්මා කිව්වා වගේ කොළ මැල්ලුම් ටිකක් එළවළු ටිකක් කන්න..."

නිම්සර කීවේය. මම මගේ ඇහේ කඳුළු අතින් පිස දැමුවෙමි.

"මේකයි ශෝබා දූහැන්යා ඔයාට වඩා ලස්සනයි... ඒක ඇත්ත.. ඒත් ඒ ලස්සන ඔයාට ගන්න බෑ... ඒක දූහැන්යාගෙ... ඔයාට දෙයක් ලැබිලා තියෙනවා ඔයා ඔයාගෙ ලස්සන ගැන සතුටු වෙන්න..."

නිම්සර කීවේය.

"මං දන්නවා මං කැතයි... ඔක සැරින් සැරේ මතක් කරල දෙන්න ඕන නෑ... ඒත් මාත් කොහොම හරි ලස්සන වෙනවා..."

"මෝඩි... උගත් මෝඩි... බලද්දි ළමයි දාල තියෙන නමුත් බොරු නෑ..."

නිම්සර කීවේය. මම හඬමින් කාමරයට දිව ගියෙමි. උක්කු අම්මා බිම අරගෙන ආවාය.

"අර මොකෝ..."

"පිස්සුනෙ අත්අම්මා..."

"ඒකනං හැබැව... අපේ පොලිසියෙ මහත්තයම ඉවසනව ළිසක් මෙයාගෙ තොදොලෙ මට නම් බොරු කියන්නෙ මොටද වෙලාවකට තරහේ බෑ..."

"මං කතා කරන්නද..."

"නෑ.... නෑ...."

නිම්සර කාමරයට එන හඬ ඇසී මම තවත් කොට්ටය බදා ගත්තෙමි. නිම්සර යහනේ කෙළවරම සිටගෙන සිටියි.

"ඔයා ඔහොම නම් අනිත් ළමයි වගේ මාත් ඔයා එක්ක කතා කරන එක අතාරිනවා..."

නිම්සර කීවේය. මම ඉක්මනට හිස එසවීමි.

"දූත් කඳුළු පිහදාගන්න..."

මම කඳුළු පිහදා ගත්තෙමි. නිම්සර පොත් මේසයේ කෙළවර හිඳ ගත්තේය. මමත් නැගිට එතනට ගියෙමි. ඔහුට අතපසු වුණු අමාරු ගණිත ක්‍රම කියා දුන්නෙමි.

"ඔයා ඔයා ගැන ආඩම්බර වෙන්න..."

නිම්සර කීවේය. මම ඒ මුහුණම බලා උන්නෙමි.

"ඇයි..."

ඔහු ඇසුවේය. මම කිසිවක් නොකීවෙමි.

"කැමතිනම් ඔය හිතේ තියෙන දේ කියන්න... අපට ආශ්‍රේ කරන්න ලේසි වෙයි...."

"හිතේ..."

මම එයම කීවෙමි.





"ඔව්..."

ඔහු කීවේය. කියන්නේ කොහොමද මා ඔහුට ආදරය කරනා බවද.... ඔහු කඩවසම්ම පිරිමි ළමයාය. පාසලේ ලස්සන කෙල්ලන් කී දෙනෙකුගේ බැල්ම ඔහු වෙත ලැබී ඇද්ද.? මා වාගේ ලස්සනක් නැති කෙල්ලක ඔහුට පෙම් කරනවා කියන්නද..?

"කියන්න..."

"මට ඕනෑ ලස්සන වෙන්න..."

කියන්න දෙයක් නැති කමට මම කීවෙමි.

"මට පරක්කුයි මං යනවා..."

නිම්සර යන්න ගියේය. ඉන්පසු නිම්සර අපේ ගෙදර ඒම සාමාන්‍ය දෙයක් විය. අපි හොඳ මිතුරන් වූවෙමු. මා හා නිම්සර නිසා මගේ තාත්තා වූ දෑ. සේ. බණ්ඩාරත් ඩේවිඩ් සේනාධීරත් මිත්‍රයෝ වූහ.

"අපේ තාත්තා කියනවා මගෙ බර්ත් ඩේ පාටි එක ගන්නවලු...."

මම නිම්සරට කීවෙමි.

"ආසද ඔයා..?"

"නෑ... අපි හැමදාම වජිර ළමා නිවාසෙට දානයක් දුන්නා... මේ පාටි එකක් ගැන තාත්තා හිතුවමයි..."

මම කීවෙමි.

"ඉස්කෝලෙ යාළුවන්ට විතරක් කියමු..."

"තාත්තා නෑදෑයන්ටත් කියලා..."

"අන්කල්ගෙත් ආසාවනේ..."

නිම්සර කීවේය. දූහැන්යා අප ළඟට දිව ආවාය.

"මොනවද නිම්සර කොයි වෙලාවෙ බැලුවත් ඔයා ශෝබා ළඟ..."

දූහැන්යා කෝප වූවාය.

"යං...."

නිම්සර මදෙස බලා දූහැන්යා එක්ක ගියේය. නිම්සර දූහැන්යා කී පමණින් යන්නේ ඇයි..? ඔහු ඇට ඔය තරම් බිය ඇයි..? මම මගේ පොතක පිටු පෙරලීමි.

"ඔයාගෙ නිසඳැස ලස්සනයි... ඔයා ඊටත් වඩා ලස්සනයි...."

ඒ ඔහුය. නිම්සරය. ඉස්සරම දවසක මා ලියූ නිසඳැස ඔහු දුක තියේ. මේ දැන් මොහොතකට කලින් ලියූවකි. මගේ කඳුළින් බරවිණි. ඔහුට මා හැමදාමත් ලස්සනය. ඒත් එය ආදරයයැයි වරදවා වටහා ගන්න තරම් මා බොළඳ විය යුතුද...?

එක් හැන්දෑවක මම අඩ නින්දේ උන්නෙමි. විසල් යහනේ කොට්ට තුනක් තුරුලු කරගෙන නින්දේ උන්නෙමි. මා ඇහැරිගත්තේ කිසිවකු මා සිප ගැනීමෙනි. දෙව්යනි - නිම්සරය. ඔහු මා කලුවරේම තුරුළු කරගත්තේය. මා ඉඩ දී උන්නේ ඇයි..?

"නැගිටින්න..."

අනතුරුව ඔහු කීවේය. නිම්සරගේ මුහුණ බලන්න බැරිකමක් මට විණි. මම යහනේ හිඳ ගත්තෙමි. නිම්සර ආයේ මා සිපගත්තේය.

"උක්..කු.. අම්මාත්..."

"උක්කු අම්මා දරට ගියා රබර් වත්තෙ..."

නිම්සරගේ ඇස් පුරා වූයේ දරාගන්නට බැරි ආදරයකි. ඒත් මට උන් හිටි හැටියේ මේ සිදුවූ දේවල් හිතා ගන්නටවත් බැරිය.

"දූහැන්යා ආයෙ ඔයාට කරදර කරන එකක් නෑ.. මං තේරුම් කළා.."

නිම්සර කීවේය. ඔහු බොහෝ වේලා මා එක්ක කාමරයට වී උන්නේය.



# 2

අලුත් දවසකි. සුදු ගවොම ඇඳගත් මම සුදු සපත්තු පැළඳ කොණ්ඩය කරල් ගෙතීමි. උක්කු අම්මා තෙල් බෝතලය රැගෙන දිව ආවාය.

"කෝ දෙන්න මං ගාන්නම්..."

මම කීවෙමි.

"සුදු බේබිට පුළුවන්ද ඔව..? කෝ කෝ මං කුස්සියෙ ඉඳල දුවගෙන ආවෙ.."

"උක්කු අම්මා ඔය තෙල් බෝතලේ තියලා යන්ට.... උක්කු අම්මව දක්කම තේරෙනවා කුස්සියෙ හිටපු බව... මං හිතන්නෙ වළං හෝද හෝද ඉන්න ඇත්තෙ...."

මම හිනැහුණෙමි.

"හොඳට තෙල් ටික ඉහ මුදුනට දාගන්නකො එහෙනම්...."

උක්කු අම්මා ගියාය. ඊයේ පොල් තෙල් ගා නෑ නිසා තවම හිසෙහි යන්තම් තෙල් ගතිය වේ. මම තෙල් නොදා කොණ්ඩා කරල් දෙක ගෙතීමි. බිමට වැටෙන කොණ්ඩය දෙස මම කැඩපතින් බලා උන්නෙමි. වෙනදා වගේ මා සුදුමැලිව මට පෙනුණේ නැත. නිම්සර ඔහුගේ යන්තමට වැවුණු රැවුල් කොට වල පහස තවම

දුනේ. පපුවේ උණුසුමත් එහෙමය. හිතට බිය දැනිණි. ශෝබා වරදක් කළා වත්ද.... අනුන්ගේ මල් වට්ටියක් රහසේ බුදුන්ට පූජා කළා වාගේ පූජා කිරීමෙන් ලැබෙන සංතෘප්තිය මට නොදැනිණි. හෙරකි මා හෙරකි. තාත්තා මා පාසල ළඟින් බස්සවා මගේ හිස අතගෑවේ තාමත් මා අර බොළඳ කෙල්ලමයි හිතාය. ඒත් ඒ බොළඳ කෙල්ල වෙනුවට මට පෙනෙන්නේ දැනුමෙන් ආඪ්‍ය වූ සම්පූර්ණ කෙල්ලෙකි. මම ඇස් අතගෑවෙමි. පුංචි කාලයේ පටන් ඇසට හුරු වූ හුරු කරගෙන උන් උපැස් යුවළ මම ගෙදර දමා ආවෙමි. එය මා කළේ හිතාමතාමය. කිසිවෙකු මගේ වෙනසක් දකිනවාට මා තුටු වූයෙමිද..? පාසල තුළට මා ඇතුළු වූයේ ලතාවකටය. වෙනදා නැති ළගන්නා සුලු බවක් මගේ ගමනේ වූයෙමිද? දණහිසෙන් පහළට ඇඳි සුදු ගවොම අද මා ඇන්දේ දණහිසෙන් අඟලක් ඉහළටය.

"වාව්.."

දුහැන්යාට කියවිණි. මම මුදු මදහසක් නැගුවෙමි. දුහැන්යා මා ළඟට දිවවිත් මට අත පෑවාය.

"අද ඉඳන් අපි යාළුවෝ වෙමුද...? මගෙන් වැරදි වුණා.... දන්නැද්ද මිනිස් ගතිනෙ... සොරි ආ...."

මම ඇගේ අත අල්ලා ගත්තෙමි. හදවතට දැනුණේ සතුටකි. දුහැන්යා මොහොතකටවත් අත අල්ලා ගැනීම සතුටකි. මගේ ලෝකයේ උන් විරවරිය ඈය. ඒත් ඒ සමඟම දුකක් බයක් වාගේ හැඟීමකුත් ඇතිවිණි.

"ඉතිං කියන්න මාව ඔයාගෙ බෙස්ට් ෆ්‍රෙන්ඩ් කරගන්නවාද...?"

දුහැන්යා හුරතලයට ඇසුවාය.

"ඔව්..."

මම කෙටි පිළිතුරක් දුන්නෙමි. නිම්සර පාසල් ආවේ නැත.

"මොකද මෙකා නැත්තෙ..?"

දුහැන්යා කලබල වූවාය. ඇත්තටම ඇයි..? ඔහු පාසල් නොආවේ මට මුහුණ දෙන්නට බැරි වූ නිසාද..? ඔහු කළේ වරදක්





යැයි ඔහුට හැගෙනවාද...? පාසල් වෙලාව තුළ මම බොහෝ දුර සිතුවෙමි. වෙනදා වගේ පංතියේ ළමුන් මා තළා පෙළා දැමමේ නැත.

"මේ ගාණ කියලා දීපං බං.."

පූර්ණ මා ළඟට ඇවිත් කීවේය. මම ඔහුට විතරක් නොවේ පංතියේ කාටත් මා දන්නා දේ කියා දුන්නෙමි. කාගේත් හිත්වල මා ගැන තිබුණු එක එක වැරදි අදහස් නැතිවී ගියේය. පංතියේ අනෙක් ළමුන්ගේ තරමට මට ද ස්ථානයක් හිමි වූයේ දුහැන්යා නිසා වන්න ඇත. දුහැන්යා ඇගේ හොඳම මිතුරිය ලෙස මා තෝරා ගත් නිසාය. සතියක් ගෙවිණි. මේ සතියේම නිම්සර පාසල් ආවේ නැත. ඉරිදා දහම් පාසලේදීවත් ඔහු හමුවෙතැයි මම සිතුවෙමි.

"මෙකට මක් වෙලාද...? ඉස්කෝලෙ ආවේ නෑ... පංති ආවෙ නෑ... අද දහම් පාසල් ආවෙත් නෑ..."

දුහැන්යා කීවාය.

"ඔය එන්නෙ කියන කොටම...."

පූර්ණ දුර සිටි නිම්සරව පෙන්නුවේය. අපට ඔහු දෙස බලන්නට කතා කරන්නට ඉඩ නොලැබුණේ අස්සජි හාමුදුරුවෝ ආ නිසාය. අස්සජි හාමුදුරුවන් උගැන්වූ කිසිදෙයක් මට මතක උන්නේ නැත. විවේක කාලය එනතුරුම මා උන්නේ හදවතේ දුක තබාගෙනය.

"ඔය දරුවො දැන් අවසානෙ විභාගෙට ලියනවා තව සතියකින් දෙකකින්... ඉතිං මේ ඉගෙනීමෙ කටයුතු ගැන ටිකක් සැලකිලිමත් වෙන්න ඕනේ.... මට තේරෙනවා සමහර ළමයින්ගේ ඉගෙනීම ගිලිහිලා ගිහින්.... කෝ අද නිම්සර ළමයා දහම් පාසලට ආවේ උදේ රැස්වීමෙනුත් පස්සෙ..."

අස්සජි හාමුදුරුවෝ පාඩම් ඉවර කර යන්න කලින් කී සේක. නිම්සරගේ ඇස් කෙළින්ම මට වැටිණි. දුහැන්යා කෝළ බැල්මක් හෙළුවාය. මා හා දුහැන්යා එක ළඟ සිටීම ඔහු තවත් පුදුම කර තිබිණි.

"මොකද නිමසර ලොකු නිවාඩුවක් දැම්මෙ..?"

පූර්ණ ඇසුවේය.

"අපි කොළඹ ගියා.... තාත්තා ආයෙ කොළඹ යන කතාවක් කියනවා.... ඒකයි.... ගිය සතියෙ පුංචිලාගෙ ගෙදර හිටියෙ..."

නිමසර කීවේය.

"නිකං මට කෝල් එකක් දීලා කියල යන්න බැරිවුණා ඔයාට..."

දුහැන්යා කීවාය. නිමසර කිසිවක් කීවේ නැත. ඔහු බලා උන්නේ මා දෙසය.

"මොකද ශෝබා දිහා බලා ඉන්නේ... ශෝබා දූත් ඇස් හතරෙන් බලන්නෙ නෑ... දෙකෙන් බලන්නෙ.... කොණ්ඩෙ තෙල් බේරගෙන එන්නෙ නෑ... ඊයෙ මායි ශෝබයි සැලුන් එකට ගියා අපේ කෙනෙක්නෙ..."

දුහැන්යා සියලු දේ කියවගෙන ගියාය. මම ලැජ්ජාවට පත්ව උන්නෙමි. ලස්සන වන්නට ආශාවෙන් ඉන්න බව දැනගත් පසු දුහැන්යා කළේ මා ඊට පෙළඹවීමයි.

"ඔයා ලස්සනයි... ඔයා ඔයා ගැන හිතන්නෙ නෑ.... ඔයා මට වඩා හුඟක් ලස්සනයි."

දුහැන්යා කීවේ එසේය.

"ලස්සන ගැන ද දූත් උඹල හිත හිතා ඉන්නෙ...? එක්සෑම් ඇනගනිල්ලා. එතකොට කොහොමත් සැලුන් එකක් දාගන්න පුළුවන්..."

පූර්ණ කීවේය. එක වචනයක් නිමසර එක්ක කතා කරන්න තිබුණා නම් හොඳය. ඒත් මම අසමත් වූයෙමි. මා කළේ දුහැන්යා කියන දෙයක් අසා හිඳීම විතරය. නිමසර දෙන පිළිතුරු වලට සවන් යෙදවීම විතරය. මා හා නිමසර මෙතරම් දුරස් කළේ කවුරුද..?

"අද හවස ක්ලාස් එනවා නේද..?"

දුහැන්යා ඇසුවාය.





"ඔව්..."

තාත්තා මා ගෙන යන්නට ඇවිත් උන්නේය. ඒනිසා මම දුහැන්යාගෙන් සමුගෙන ගොස් තාත්තාගේ වාහනයට නැග්ගෙමි.

"දූ මොකද කලබල වෙලා...?"

තාත්තා ඇසුවේ මා බියට පත් කරමිනි.

"එහෙම නෑ තාත්තා..."

මම නිකම් පිළිතුරක් දුන්නෙමි.

"නිමසර ආවෙ නෑ නේද... අපේ ගෙවල් පැත්තේ...? මොකද තරහ වෙලා..?"

"නෑ තාත්තා... එයා කොළඹ ගිහින්.... ඊයේ රෑලු ආවෙ..."

"ආ එහෙමද...?"

එපමණය. ගෙදර එන තුරු ආයේ මමත් තාත්තාත් කතා නොකළෙමි. ගෙදර ඇවිත් කාමරයට වැදී මා හිතුවේ නිමසර මා ගණනකට නොගත් බවකි. ඒ ඇයි..? එදා සිදුවූ දේවල් නරක යැයි ඔහු හිතනවා ඇත. එය මට ඊට වඩා ලැජ්ජාවකි.

"අර නිමසර ළමයා ඇවිත් පංති යන්න...."

උක්කු අම්මා කාමරයට එබී කීවාය. කාමරේට ඇවිත් මා උන්නේ යහනට වීය. මම අකමැත්තෙන් වාගේ අල්මාරිය ඇරියෙමි. කහපාට ගවොම ගෙන යහන උඩට දැම්මෙමි. එය උක්කු අම්මා මැසූ ගවොමක් නොවේ. ඊයේ දුහැන්යා මා සාප්පුවකට එක්ක ගියාය. ඇය කෙටි ඇඳුම් කීපයක්ම ගත්තාය. ඉන් ඇඳුම් දෙක තුනක් මටත් දුන්නාය.

"පිස්සුද..?"

"ඇයි..? මගෙන් මේවා ඔයාට...."

"මේ සල්ලි... අපරාදෙ..."

"නෑ දරුවෝ... මේවා අපේ තාත්තා විනාශ කරන සල්ලි වල හැටියට නිකන් වගේ.... මේව මං ඔයාට අරන් දුන්නෙ ඔයාගෙ

ලස්සන ඔයාටම පෙනෙයි...."

"එපා... දුහැන්යා... මේවා කොටයි.... අනික මං ගවුම විතරයි අඳින්නේ..."

ඊළඟට ඇ ගවොම් දෙකක් තේරුවාය. ඒවා මා අඳිනා විත්ත ගවොම් නොවේ. අත් නැති උරපටි සිනිඳු රෙද්දකින් මැසූ ගවොමය.

"ස්කර්ට් එපා...."

"නෑ ඔයා මේ සේරම අඳින්න ඕන.... නැත්නම් අත්දවනවා... මේ ස්කර්ට් කොට නෑ.... ඔයාගෙ දණහිස තරම්.... බලන්න මේ ටිෂර්ට් ඔයාට ලස්සනට තියෙයි...."

දුහැන්යා ඇහුවේම නැත. මට ඒවා ගෙදර ගෙන ඒමට සිදුවිය. මේ එයින් ගවොමකි. මම ළා කහපාට වූ ඒ ගවොම ඇන්දෙමි. දුහැන්යා කිවේ කොණ්ඩය කරළකට හෝ නොගෙන පිට දිගේ ඉහිරෙන්නටය. මම පෝනි ටේලයක් විතරක් දැම්මෙමි. ගවොම දණහිස් තරමටය. ඊළඟට මම කණ්ණාඩියට එබුණෙමි. මේ මාමද... ඇත්තටම මා මෙතරම් සොඳුරුද..?

"ළමයො පරක්කු නැද්ද..?"

උක්කු අම්මා ආයෙත් කාමරයට එබුණාය. ඇ මා දුටුවාය.

"ඇ.... මේ කොහේ ඇඳුම්ද..?"

"මේවා මගෙ යාළුවා... උක්කු අම්මා අර දුහැන්යා... එයා දුන්නේ...."

"අම්මේ අම්මේ.... අනුත්ගෙ ඇඳුම් අඳින්න ගත්තද බේබි..! ලැජ්ජාව නැතුව.... මහත්තයා දන ගත්තොත් පැලෙයි.... හැම සැප සම්පතම කොහොම හරි දුන්නා නේද...?"

"උක්කු අම්මා... දොඩවන්න එපා.... මේවා එයා මට යාළුකමට ෂොප් එකකින් අරන් දුන්නේ....."

"ෂොප්.... එකකින්...."

"ඔව්..."





"ඇයි එයාට පහළ වෙලාද..?"

"ඒගොල්ලො හරියට සල්ලි විනාශ කරනවලු... මෙක ඒ හැටි දෙයක් නෙවේලු..."

"අනේ මංදා... ඕක ඇඳන් පාරෙ යා හැකිද..? කර සේරම හිස් නොවැ...."

තවත් උක්කු අම්මාගේ බැණුම් අහන්න බැරි කමට මම සුදු පාට සපත්තු පැළැන්දෙමි. මා සාලයට එද්දී නිම්සර මිදුලේ උන්නේය. මා දුටු ඔහු වරක් තිගැස්සිණි. ඔහුට හිනාත් නැගිණි.

"ඇයි...?"

ඔහුගේ හිනාව මට කතා කරන්නට මාර්ගයක් විණි.

"දුහැන්යා එයාගෙ සේරම ටික ටික ඔයාට පතුරුවයි වගේ..."

"යං..."

එහෙම කියා මම ඉස්සර වුණෙමි. ඔහු ආවේ පිටුපසිනි. ඇත්තටම මා ලස්සනයැයි මට සිතුණේ මේ ගවුම ඇන්දාට පසුය. දුහැන්යා කෙට්ටුය. ඇය කෙට්ටු වන්නට නොකා හිඳී. ඇගේ ළැම උකුළ මගේ වාගේ ලස්සනට නැත.

"ඔය ගවුම ඇඟට වැඩියි නෙ ශෝබා..."

නිම්සර කීවේය. මම හිනැහී බැලුවෙමි.

"දුහැන්යා තමයි මෙක තේරුවෙ... "

"ලස්සනයි... ඒ වුණාට ඕකෙ වරද ඔයාට තාම තේරෙන්නෙ නෑ.... පාරට බැස්සම තමන්ගෙ ඇඟ පෙන්නලා ලස්සන වෙන අය ඕනැ තරම්.... ඒත් ඔයා එහෙම කෙනෙක් වෙන්න එපා ශෝබා... ඔයා ලස්සනයි... ඒක ඔහොම පෙන්නන්න ඕනැ නෑ...."

මට ලැජ්ජාවක් දැනිණි. බසයට අප නැගුණේ කතාබහක් නැතිවය. නිම්සරත් මාත් උන්නේ දෙපසකය. මා ළඟ උන් තරුණයා මා හිර කර ගත්තේය. ඔහු මගේ පිටු පස්සේ ඇත්තටු වුවේය. මට හිරිකිත හිතිණි.

"ෂෝක් පස්ස..."

ඔහු කීවේ මගේ හුස්ම හිරකරමිනි. මට කඳුළු නැගිණි.

"මොකක්ද කිව්වේ..?"

නිම්සර වහා හැරිණි.

"ඇයි මොකද..?"

"මොකද...? උඹ මෙතන ජැක් ගහන්න ආවද...? අපිත් ඔව හොඳට දන්නවා...."

නිම්සර තරුණයාගේ බොටුවෙන් අල්වා පහරක් ගැසුවේය. බසය නතර වූණේ වේගයෙන් බ්රේක් ගසමිනි.

"මෙතන රණ්ඩු කරනවද..? බැහැපල්ලා බැහැපල්ලා...."

රියදුරු අසුනෙන් නැගිට ගත් මහත මිනිසා කෑ ගැසුවේය. නිම්සර මා ඇදගෙන බසයෙන් බැස්සේ අර තරුණයාට තවත් පහරක් ගසමිනි. මගේ ඇස් වලින් කඳුළු වැටිණි. නිම්සර කතා කළේ නැත. මට නාඩා ඉන්න කීවෙත් නැත. දෙනෝදහක් ගැවසෙන මහ පාරේ මම හැඬුවෙමි.

"දක්ක නේද..? ඉල්ලං පරිප්පු කෑවා නේද...? තමුසෙ ඉගෙන ගත්තද පාරෙ යන හැටි..? ඇයි ඌ ජැක් එක ගහං එද්දී සතුටෙන් ඉන්න එපැයි..."

අනේ මා මෙවැනි කතා අසා තිබුණේවත් නැත. නිම්සර මට බැන්නේ කොතරම් පහත් විදිහටද..?

"ඉස්සෙල්ලා සමාජෙ ජීවත් වෙන්න ඉගෙන ගන්නවා... දූහැන්යා පස්ස පැත්ත පෙන්න පෙන්න ඇඳන් යන්නෙ... අත කරකවල කොල්ලෙකුට ගහන්න වුණත් දූහැන්යාට පුළුවන් නිසා... ඒත් ඒක හොඳද මං දන්නෑ.... හැබැයි ඔයා එහෙම වෙන්න ඕන නෑ..."

"මං... ගවුමක් ඇන්දෙ.."

"කණ්ණාඩියෙන් බලනව... තමුසෙ හොරණෑ හිටියට පස්ස පැත්ත තියෙන්නෙ යාපනේ..."





"නිම්සර..."

"සමාජෙ ජීවත් වෙන්න පුරුදු වෙයං... ඒකයි කියන්නෙ..."

මේ තරං නිම්සරට කේන්ති ගිය දවසක් මට මතක තිබුණේ නැත. අප පංතියට එද්දී ප්‍රමාද වී තිබිණි. නිම්සර මා එක්ක කතා කළේ නැත. විස්මිත සර්ගේ තියුණු ඇස් මට වැටිණි.

"මොකද දෙන්නා ෆිල්ම් එකක්වත් බලන්න ගියාද..?"

විස්මිත සර් ඇසුවේය. දූහැන්යා මා ඈ ළඟට ඇද ගත්තාය.

"අහල තියෙනවනෙ අර ගිව්ගෙ කතාව.... හොඳ කෙනෙක් ආශ්‍රය කළොත් තමයි ගොඩ වෙන්න පුළුවන්...."

විස්මිත සර් මෙහෙම ඇනුම්පදයක් කියන්නේ ඇයි..? නිම්සර හා දූහැන්යාව ඇසුරු කරනවා ඔහුට සතුටු නැතැයි මට සිතිණි. උගන්වන අතර වාරයේ විස්මිත සර් කීප සැරයක්ම මා ළඟ නතර වූවේය. නිම්සරගේ තරහ මුහුණ මම දුටුවෙමි. නිම්සර මේ තරමට තරහ ගත්තේ ඇයි..? එක අතකින් ඔහුට තරහ ගන්න කාරණයක් නැත. ඔහු තරහ ගන්න උවමනා මා ගැන නොවේ දූහැන්යා ගැනය.

"නිම්සර හරි වෙනස් වගේ ශෝබා..."

දූහැන්යා කීවාය. මම බියවීමි..

"ඇයි...? මට තේරුණෙ නෑ...."

"අනේ මංදා මට හිතෙනවා..."

"ඔය දෙන්නා කතා කරනවද..?"

විස්මිත සර් ඇසුවේය. ඔහු මට ඇහැ ගහගෙන හිදී

"මූට මාර ඇහැක්නෙ තියෙන්නෙ.... ශෝබා දිහාමයි බලා ඉන්නෙ...."

දූහැන්යා කීවාය.

"පිස්සුද..?"

මම දූහැන්යාට කීවෙමි.

"උඹට ඔව තේරෙන්නෙ නෑ... උඹ තාම මෙවට ලාමක වැඩිසි..."

"සර් එහෙම නෑ..."

"සර්... සර්. නරකයි කිව්වෙ කවුද..? මං කියන්නෙ ඇහැ මේ පැත්තෙ කියලා..."

දූහැන්යා කියන දේවල් මට ඒ තරං වැටහුණේ නැත. ඒත් විස්මිත සර් වරින් වර මදෙස බලද්දී දූහැන්යා මගේ අත කෙනිත්තුවාය. මම ඒ ඇස් නොදුටුවා වාගේ උන්නෙමි. පංතිය අවසන් වූ පසු මම විස්මිත සර්ගේ ඇහැ නොගැටී පංතියෙන් එළියට වූයෙමි.

"අද අපේ ශෝබාගේ ලස්සන කොහොමද..?"

දූහැන්යා කීවාය.

"මාත් මේ බැලුවෙ අර ලේඩි හූර හූර හිටිය කෙල්ලද මේ කියලා..."

පූර්ණ හිනාවූවේය.

"ඒ ගෞරවය මට තමයි... මං තමයි කෙල්ල මොඩ් කරලා ගත්තේ..."

දූහැන්යා කීවාය. නිම්සර මේ කිසිවකට කතා කළේ නැත.

"ඒයි... නිම්සර... මොකක්ද අද බස් එකේ වලිය..?"

ප්‍රභාෂ්වර කොහේන්දෝ සිට දිව ඇවිත් ඇසුවේය. දූහැන්යා ඇස් ලොකු කළාය.

"උඹල බස් එකේ මැද හිටියෙ.... වලිය දැක්කට ඒ උඹ කියලා දැක්කේ ශෝබාව ඇදගෙන බස් එකෙන් බහිද්දී..."

ප්‍රභාෂ්වර කීවේය.

"ඒක මේ නිකං... විහිළුවක්..."

"අඩෝ ශෝබාට විහිළු කළාම උඹට ඔය තරං තද වෙනවද..?"

"මේ ප්‍රභාෂ්වර..."





"ඔකේ. ඔකේ..."

ප්‍රභාෂ්වර යන්න ගියේය. පූර්ණ අගනා දිගු බැල්මක් හෙළද්දී දැහැන්යා නපුරු බැල්මක් හෙළුවාය.

"මොකද වුණේ...?"

"මුකුත් නෑ හලෝ... මේ පොඩි..."

"පොඩි හරි ලොකු හරි.... රණ්ඩුව මොකක්ද හේතුව මොකක්ද..?"

"හේතුවද..? තමුසෙ ශෝබාට වල් විදිහට අඳින්න පුරුදු කරලා තමුසෙ කාර් එකේ යනවා.... මං ශෝබා එක්ක එන්නෙ බස් එකේනේ.... ඒකයි හේතුව...."

"හායි.... මෙන්න වැඩක්... මං මේ ශෝබාව මොඩ් කරලා ගත්ත... මෙයාටනේ ඩෝං ගිහින් තියෙන්නෙ...."

"මට ගිය ඩෝමක් නෑ... දූහැන්යා. ඔයාගෙ විදිහට හදන්න එපා ශෝබාව...."

දූහැන්යාගේ මුහුණ අඳුරු විය. මෙහෙම චෝදනා දෙන්න ඔහුට ඇති අයිතිය කුමක්ද..?

"මෙකයි... මං නිසා ඔගොල්ලො රණ්ඩු වෙන්න එපා... මං අඳින්න ඕනැ මං කැමති දේවල්.... මගෙ කැමැත්තටයි මං මේ ඇන්දේ...."

මම කීවෙමි.

"එහෙනං කැමැති විදිහට කරගන්න..."

නිම්සර කෝපයෙන් එහෙම කියා යන්න ගියේය. දූහැන්යා පුදුම වී බලා උන්නාය. ඇ කළේ නිම්සරගේ පිටුපසින් දිව යාමය. මම සසල වී බලා උන්නෙමි.

"දූන් ඔයා යන්නෙ කොහොමද..?"

පූර්ණ ඇසුවේය. විස්මිත සර් යතුරු පැදියට නගිනවා දක මම බියවීමි.

"පූර්ණ තාත්තාට කෝල් කරන්නට ඕනේ...."

මම කීවෙමි.

"ආ ෆෝන් එක.... කතා කරන්න..."

පූර්ණ මට ඔහුගේ ජංගම දුරකතනය පෑවේය. මම තාත්තාට කතා කළෙමි.

"ඇයි පුතේ...?"

"තාත්තා මං ක්ලාස් එකේ.... එන්න..."

"හා පුතේ.. ඇයි අද නිම්සර නැද්ද..?"

"නෑ...."

"මං එන්නං..."

තාත්තා කීවේය.

"පූර්ණ යන්න.... මං ඉන්නං...."

මම කීවෙමි. ඒත් පූර්ණ මා දමා ගියේ නැත. තාත්තා එන්නට විනාඩි පහළොවක් ගෙවුණේ නැත. තාත්තාගේ පොලිස් ජීප් රථය පංතිය ඉදිරියේ නතර වෙද්දී විස්මිත සර්ගේ යතුරු පැදියත් නතර විය.

"ඔයත් යං පූර්ණ..."

"බෑ ශෝබා යන්න...."

"බායි..."

"බායි ශෝබා..."

මම වාහනය වෙත ගියෙමි.

"මේ ශෝබාගෙ තාත්තද..?"

විස්මිත සර් ඇහුවේය.

"ඔව් සර්...."

තාත්තා හිනැහුණේය.





"තාත්තා මේ අපේ සර්..."

"එහෙමද... කොහොමද සර් අපේ කෙල්ල..?"

"එයා තමයි පංතියෙ ඉන්න දක්ෂම ළමයා..."

විස්මිත සර් කීවේය.

"යන්නං සර්..."

"හොඳයි..."

මම ජීප් රියට නැග්ගෙමි. තාත්තා මගේ හිසට අත තැබුවේය. දූහැන්යා පේන්න නැත. ඒත් අතර මඟ නිම්සර උන්නේය.

"මේ ඉන්නෙ ගෝතයා..."

කී තාත්තා වාහනය නතර කළේය.

"මොකද ඉලන්දාරියා..?"

"අන්කල් ඔයා ආවද..? මං මේ ශෝබා බලන්න යන්න හැදුවෙ..."

"ඔහොම බෑ... වගකීමක් නේද මගෙ දුව එක්ක පංති එන්නං කියලා ගත්තේ... මාත් ඉතින් කැමති වුණා ගෙයිම ඉන්න ළමයනෙ... ටිකක් සමාජේ ගැනවත් ඉගෙන ගනී කියලා... එයාව දාලා ගියාම හරිද..? නගින්න. නගින්න..."

නිම්සර ජීප්රියට නැංගේ නැත.

"මං එන්නං අන්කල් යන්න...."

"රස්තියාදු ගහන්න එපා.... පුතා තාත්තට කියන්න මං මතක් කලා කියලා...."

"හා අන්කල්..."

මා හිත පැරී තිබිණි. ඔය තරම් තරහ ගන්න මා කළ දෙයක් නැත.

"අද මගෙ දූ හරිම ලස්සනයි...."

තාත්තා කීවේය.

"තාත්තා ආයෙ යනවද...?"

"ඔව් දූ මං එද්දි ටිකක් රෑවෙයි..."

තාත්තා මා ගේ ළඟින් බස්සවා යන්න ගියේය. මම ඒ සවස් කාලය පාලුවේ උන්නෙමි. නිම්සර ඒවි යැයි සිතුවත් ඔහු ආවේ නැත. පසුවදා දූහැන්යා පාසල් ආවේ නැත. ඒත් ඈ මා බලන්න දහවල් අපේ ගෙදර ආවාය.

"ඇයි ස්කූල් නාවේ...?"

"බෑ කියලා හිතුණා.... නිම්සර ආවාද..?"

"නැහැ..."

"මම හිතන්නේ නිම්සර ඉස්කෝලෙන් අස් වෙන්න යනවා..."

"නෑ..."

"අනේ මන්දා... නිම්සර කොළඹ යන්නලු හදන්නේ..."

"එහෙමද..?"

"නිම්සර මාව මග අරිනවා ශෝබා... මං නිම්සරට ආදරෙයි... ඇයි එයා එහෙම කරන්නේ...?"

නිම්සර අපේ ගෙදර ආවේ අප මිදුලේ කතා කරමින් ඉද්දීය.

"ඔයා විතරයි අඩුවට හිටියෙ..."

මම හිනා වුණෙමි. ඒත් දූහැන්යා හෝ නිම්සර හිනා නොවූහ. අපි බොහෝ වෙලා කතා නොකර උන්නෙමු. උක්කු අම්මා සිරිමල් අතේ කිරි තේ එවා තිබිණි.

"බොන්න..."

මම කීවෙමි. නිම්සර මගේ මුහුණ බැලුවේය.

"ඔයා ඉස්කෝලෙන් අස් වෙනවද..?"

මම ඇහුවෙමි.

"කවුද ඔය බොරු කියන්නේ..."





"බොරුද ඇත්තද කියලා ඔයාම අහගන්න ශෝබා...."

දූහැන්යා කීවාය.

"බොරු හලෝ... මේ විභාගෙට ඔන්න මෙන්න මං යනවද..? හැබැයි විභාගෙ ඉවර උන ගමන් යනවා.... තාත්තාගෙ බිස්නස් වලට පහසුයි.... ඒකයි..."

"අපරාදෙ ඔයා කොළඹ ඉස්කෝලෙකින් මෙහෙ ආවේ..."

මම කීවෙමි.

"කෙල්ලක් නිසා බයවෙලා එන්න ඇති..."

දූහැන්යා කීවාය.

"ඔව් ඔව්.... මං කෙල්ලන්ට බය තමයි..."

නිම්සර මුලදී වාගේ තරහක් නැතිව කීවේය. ඒ මුහුණේ මද හසරැල් තිබිණි.

"මට ඔයා එක්ක කතා කරන්න ඕනෑ... මං ඔයාට හුඟක් ආදරෙයි... නිම්සර...."

දූහැන්යා කීවාය. නිම්සර වහා මගේ මුහුණ බැලුවේය.

# 3

**නි**මසර ගැන හදවතේ පිපුණේ දරාගත හැකි ප්‍රේමයක් නොවේ. උදාවෙන හැම දවසකදීම මම ඒ ආදරය මත්තේ ජීවත් වුණෙමි. ඔහු නැති එක දවසක් ගැන හිතන්නේවත් කෙලෙසද ?

"කොහෙද ඔය යන්නේ...?"

"රබර් වත්ත පහළට..."

"මේ හැන්දෑ වෙන වෙලාවෙ..."

"බලන්න උක්කු අම්මා මේ පරිසරය හරිම ලස්සනනෙ... කවි ලියන්න හිතෙන තරං..."

"අනේ..."

උක්කු අම්මාට මා පිස්සුවක් වන්න ඇත. මට ද එහෙමය. මම රබර් වත්ත දිගේ ඇවිද ගියෙමි. මේ වතුයායම අපේය. රබර් වත්තේ මැද විසල් ගල් තලාවකි. මම ඒ මතට නැග්ගෙමි. ගල් තලාවේ හිදගෙන මොහොතක් ඉද්දී මගේ දෑස වැසිණි.

"ක.. වි... ද..?"

මම බියවීමි. හැදුවේ කෑගසන්නය. ඒත් මේ සුවඳ නිමසරගේය.

"නිමසර.."

නිමසර වහා මගේ දෑස් අත් හළේය. ඔහු බණින්නවත් හිතුණේ





නැත. ඒ සිනහවෙන ඇස් දෙක බලාගෙන ඔහුට බණින්න මා දන උන්නේ නැත.

"ඇයි... ඔහොම බලා ඉන්නේ...?"

"මං මෙහේ කියලා දන්නෙ..."

"උක්කු අම්මා කිව්වා... මට ඔයාව බලා ගන්න කියලා..."

මට සිනහ නැගිණි.

"කොණ්ඩෙ දිග..."

නිමසර කීවේය.

"මං නැවා... ඒකයි..."

මම කීවෙමි. නිමසර මගේ හිසකේ හෙමින් පිරිමැද්දේය. ඔහු වළකන්න බැරි විය. මේ ආදරේය. මේ ආදරේ සඟවන්න බැරිය. නිමසර හෙමින් මා ඔහු වෙත ගෙන සිපගත්තේය.

"අනේ..."

ඒත් ඔහු මා අත්හළේ නැත.

"මං..."

මම මොනවා හෝ කියන්න හැදුවෙමි. ඒත් ඔහුගේ තුරුළට මැදිව උන්නා මිසක මා කී දෙයක් නැත. එය එක් සිදුවීමකි. නිමසර ඊළඟට හැසිරුණේ එහෙමය. පාසල් ගියත් ඔහු සාමාන්‍ය ලෙස හැසිරුණි. එහෙම බැරිවුණේ මටය.

දවසක් දූහැන්යා පංතියටම කේක් බෙදුවාය.

"මේ ඇයි..?"

පූර්ණ ඇසුවේය.

"අපේ ආදරේට අවුරුද්දයි..."

අතට ගත් කේක් කැබැල්ල මට උගුරට ගියේ නැත. මම බියවී බලා උන්නෙමි. නිමසර අප ළඟට එමින් උන්නේය.

"මෙ බලන්නකො නිමසර... මං කිව්වා අපි ආදරේ කරන්න

අරන් අවුරුද්දක් කියල.... මේ ශෝබා බයවෙලා...."

නිමසරට මට මුහුණ දෙන්නට හැකි වුණේ නැත.

"යංකො නිමසර.. අද අපි දෙන්නා ෆිල්ම් එකකට යනවා... ඔකේ..."

නිමසරගේ අතක වෙලී දුහැන්යා යන අයුරු මම බලා උන්නෙමි. පංතිය ඇතුළට යනු වෙනුවට මා කලේ කෙළින්ම ගෙදර ඒමය... තාත්තා ගෙදර උන්නේය.

"දූ ඇයි..?"

"ක්ලාස් නෑ තාත්තා...."

මම බොරු කීවෙමි. නිම්සර එහෙම රඟපෑමක් කලේ ඇයි.? ඔහු දුහැන්යාට ආදරේ කලේ වසරක සිට නම් මා රැවටුවේ ඇයි.?

"තාත්තා මට හිතෙනවා.... ටික කාලෙකට වෙනසකටත් එක්ක නුවර යන්න..."

"නැන්දලාගෙ ගෙදර..?"

තාත්තා මදෙස බැලුවේය.

"ඔව්..."

"හොඳයි පුතේ.. ඒත් ඉතිං ඉගෙනීමෙ වැඩ..."

"එහේ ඉස්කෝල තියෙන්නෙ..."

"කවදද අපි යන්නෙ පුතේ..?"

"හෙට උදේ.. තව එකක් තාත්තා මං ආස නෑ මගෙ යාළුවො කවුරුවත් මං නුවර කියලා දන ගන්නවට... මං ඉන්දියා වල ඉන්න නැන්දි ළඟට ගියා කියන්න..."

"හරි හරි... මං කවදද පුතා කියන දේට අකමැති වුණේ..."

තාත්තා පහුවදා පාන්දරම මා නුවර එක්ක ගියේය. ඇස් වලින් එකම කඳුළක් හෝ ගැලුවේ නම් ඒද ඒයේ රාත්‍රියේය. නිම්සර වාගේ කෙනෙකු වෙනුවෙන් ආයේ හඬන්නේ නැතැයි මම සිතුවෙමි.





"අනේ... කෙල්ල අපිට බලන්න ඇවිත්..."

"බලන්න නෙමේ නවතින්න...."

නැන්දා බොහෝ සතුටින් මා සිප ගත්තාය. මාමා ද එහෙමය.

"කෝ අකී පුතා..?"

තාත්තා ඇසුවේය.

"ඔය කොහේ හරි යන්න ඇති..."

නැන්දා අපට කෑම මේසය ඇරියාය. තාත්තා බඩ පිරෙන්න කෑවේය. තාත්තා මා අතගෑවා පමණි. දුක වැඩිය දැනුණේ තාත්තා ගිය පසුය.

"නුවර ජීවිතේට ඔයා පුරුදු වෙයි... දූන් ඉස්කෝලෙ තමා ප්‍රශ්නෙ.."

"මං මෙහේ ඉස්කෝලෙ යනවා..."

"ඔව් සල්ලි ටිකක් වියදම් කරන්න විතරයි ඕනෑ..."

මාමා කීවේය. මගේ අලුත් පාසල බාලිකාවක් විය. මම ඉගෙනීමේ කටයුතු ගැන විතරක්ම සෙව්මි. මට මිතුරන් නැත. මා උන්නේ තනිවමය. විටෙක නිම්සර හා දුහැන්යා සිහි වුණත් මම ඔවුන් සිහි නොකර උන්නෙමි.

"මොනවද අකී මේ උඹේ වැඩ..? මට නම් දූන් ඇති වෙලා..."

අකී අයියා ආ විට හැමදාමත් ගෙදර රණ්ඩුවකි. ඔහු නැහැදුන සෙල්ලක්කාර තරුණයෙකි. මම හෙමින් සාලයට ගියෙමි. අකී අයියා මදෙස නොබලාම යන්න ගියේය.

මුලදී මගේ මුහුණ වත් නොබැලූ අකී අයියා ටික දිනකට පසු මා සමඟ කතා කළේය. ඔහු ඔහුගේ වාහනයේ මා පාසලට එක්ක ගියේය.

"ඔයා ඇත්තටම ලස්සනයි..."

ඔහු දවසක් කීවේය. මා මෘදුව සිනාසුණා පමණි.

"අකී අද ගෙදර..."

"ඇයි අද මං දැක්කා ටිකක් තමන් ගැන හිතන්න පුරුදුත් වෙනවා අකී.."

මාමත් නැන්දත් සතුටු වූයේ අකී අයියා ගැනය. අකී අයියා වෙනස් වෙමින් උන්නේය.

"දූ ක්ලාස් යන්නැද්ද...?"

"ඔව් නැන්දා..."

"ඉන්න මං ගිහින් දාන්නං..."

අකී අයියා ඉදිරිපත් වේ. ඔහු මා ගැන හිතනවා වැඩි යැයි මට කිහිප විටක්ම සිතිණි. මම ගණනකට නොගෙන උන්නෙමි. මගේ හැම කැපවීමක්ම ඉගෙනීමටය. උසස් පෙළ විභාගය ලියා අවසන් වෙන තුරු මම මගේ පෞද්ගලික සැපය ගැනවත් නොසිතීමි.

"යන්තං ඇති... ශෝබාට නිදහස ලැබුණා..."

නැන්දා සිනා වූවාය. අකී අයියා හෙළුවේ අමුතු බැල්මකි. අවුරුදු දෙකක කාලයක් ගෙවී ගිය ඉක්මන. ආයේ අතීතය දෙස බලා දුක්වන්න වත් දුන් දෙයක් ඉතිරි වී නොවේ.

"ශෝබා මං ඔයාට ආදරෙයි... මේ දේ කියන්න හිටියෙ ඔයාගෙ විභාගෙ ඉවර වෙනකං..."

නුවර ගෙදර වාසය මට එපා වූයේ අකී අයියා එහෙම කී දාය. මම එදාම තාත්තාට දුරකථන ඇමතුමක් දුන්නෙමි.

"මං ගෙදර එනවා..."

තාත්තා එක පයින් කැමති විය. නැන්දාට මාමාට ඔහු ස්තුති කළේය. මම ඔවුන්ගේ දෙපා වැන්දෙමි.

"ආයෙ එන්න..."

හිස සැලුවත් මා ආයේ නොඑන බව මම දැන උන්නෙමි. තාත්තා බොහෝ දේ කීවේය.

"අද මං දුව පුදුම කරනවා..."

"ඒ මොකක්ද..?"





"යංකො.."

තාත්තා මා එක්ක ගියේ පිළියන්දල ප්‍රදේශයේ වූ ඉතා වටිනා සුන්දර දෙමහල් නිවසකටය.

"කාගෙද..?"

"දූගෙ..."

"තාත්තා..."

"උක්කු අම්මා ඔන්න දූවට කෑම ගේන්න..."

උක්කු අම්මා හිනා වී සාලයට ආවාය. මට විශ්වාස වූයේ නැත.

"මේ ගෙට ගෙවැදිල සතියයි... කාටවත් කිව්වෙ නෑ පුතේ... අඩු ගාණෙ ඔයාටවත්..."

මට සතුටු සිතිණි.

"නැන්දත් ඔහොම හිටියට කපටි ගෑනි... ඒකයි.. මට හිතුණෙ මේ ගේ ගැන කියන්න ඕනැ නෑ කියලා..."

තාත්තා කීවේය. පිළියන්දල වූ අලුත් ගෙදර මගේ සිත ගත්තේය.

"කොහොමද පුතේ ජීවිතේ..?"

"එහේ හොඳයි... හැබැයි පාලුයි..."

මම කීවෙමි. තාත්තා හිනැහුණා පමණය. මම අලුත් ගේ පුරා ඇවිද්දෙමි. මිදුලේත් ඇවිද්දෙමි. හරිම සොඳුරුය.

නිම්සර ගැන තොරතුරක් දැන ගන්න හිත ආගාවෙන් උන්නේය. ඒත් උක්කු අම්මා කීවේ මා නුවර ගියාට පසු නිම්සර මා දකින්න දින පහක් පමණ අපේ ගෙදර ආ බවය. මා ඉන්නා තැනක ලිපිනයක් හෝ ඉල්ලූ බවය. මම නිකමට යහනේ නිදා ඉන්නා ගමන් නිම්සරගේ දුරකථනයේ අංක එබීමි.

"හෙලෝ..."

දෙයියනේ නිම්සරය. මම කතා නොකළෙමි. දුරකථනය

විසන්ධි කලෙමි. ඒත් ඔහු දිගටම ගත්තේය. මම දුරකථනය ගත්තෙමි.

"හෙලෝ... ෆෝන් එක කට් කරන්න එපා... ශෝබා නේද..."

බොරු කරන්න බැරි විය. මේ තරම් ඔහු මා හඳුනන්නේ කොහොමද..?

"ශෝබා ප්ලීස්..."

මම දුරකථනය විසන්ධි නොකර උන්නෙමි.

"කියන්න..."

"ශෝබා ශෝබා ශෝබා..."

නිම්සර කීවේය.

"මං ශෝබා තමයි..."

"ශෝබා ඇයි මෙහෙම කළේ..? ඇයි ශෝබා..?"

මොහොතක් ඔහුට හඬන්නට දී මම ගොළු වත රැක්කෙමි. නිම්සර දිගු සුසුමක් හෙළේය.

"මාව මතක් වුණේ නෑ නේද..?"

"නැහැ..."

මම ඇත්තම කීවෙමි.

"මං දන්නවා..."

නිම්සර කීවේය.

"දුහැන්යා කොහොමද..?"

මම තරහ නොපෙන්වා ඇහුවෙමි.

"දුහැන්යායි මායි කසාද බඳිනවා... ගෙවල් දෙකෙන්ම කැමතියි දන්."

"ඇත්තද..?"

මම තොහඬා කීවෙමි. නිම්සර හමු නොවුණා නම් හොඳයැයි මට සිතිණි. අවුරුදු ගණනකට පස්සේ මා සිත පෑරුණා නොවේද..?





නිම්සර අමතක කළා නොවේ. ඒ මතක හදවත ගැඹුරට තබා මා අතින් ඔබාගෙන උන්නා වගේය. අත් හැරි තැන දියෙහි එබූ රබර් බෝලයක් වාගේ වූයේ ඒකය.

"ඉතිං..."

නිම්සර කීවේය. මම මුදු හසරැල් නැගීමි. ඒ හසරැල්ල දුරකථනය නිසා ඔහු නොදැක්කේය. මම තව ටිකක් රිසීවරය කනේ තද කළෙමි.

"ඔයා ඉන්නෙ කොහෙද කියන්න, අපි ටිකක් කතා කරමු..."

"දැන් මොනවා කතා කරන්නද..?"

මට කියවිණි.

"ඔයා තපුරු වෙලා..."

"නැහැ..."

මම උවමනාවෙන් හිනැහුණෙමි.

"ඔයා ඒ දවසට වෛර කරනවද..?"

ඔහු ඇසුවේය. හදවත ගැහිණි.

"මොන..."

"ඔයයි මමයි ඔයාගෙ වත්ත පහළ ගලක් උඩට වෙලා තුරුල්වෙලා හිටිය දවස... ඔයා මගෙ පපුවට ඔළුව තියාගෙන හිටියා..."

ඔහු කීවේය. මට හුස්ම ගැනුණේ නැත. ඇස්වලින් කඳුළු බේරිණි.

"ඇයි කතා කරන්නැත්තෙ ශෝබා ඔයා ඒ දවසට වෛර කරනවද..?"

"ඔව්..."

මට ඉකි ගැහිණි.

"ශෝබා ඔයා අඬනවද..? ප්ලීස්... මට දැන් ඔයා හම්බවෙන්න ඕනෑ..."

මම කතා නොකළෙමි.

"ඔයා දන්නවද..? මගෙ ජීවිතේ ලස්සනම දවස ඒ දවස කියලා..."

"ඔව කියන්නෙ ඇයි..? ඔයා දැහැන්යාගෙ... මට පාඩුවෙ ඉන්න දෙන්න... ඒ එක දවසෙ සිද්ධ වුණු දේට මං අදටත් දුක් විඳිනවා..."

"ශෝබා..."

මම ඉකි බිඳිමි. උක්කු අම්මා දුටුවාය. වහා දිව ආ ඈ මගෙන් දුරකථනය උදුරා ගත්තාය.

"උක්කු අම්මා..."

මම කීවෙමි. ඒත් ඈ දුන්නේ නැත.

"මේ බේබි අඬනවා... ඇයි පුතේ බේබිව බලන්න එයාගෙ කවුරුත් ආවෙ නැති නිසා වෙන්න ඇති..."

උක්කු අම්මා කීවාය.

"ඔව් පුතේ... අපි ඉන්නෙ පිළියන්දල.. එන්නකො ඒව කියන්න..."

උක්කු අම්මා දිගින් දිගට කියවූවා විතර නොවේ. ගෙදර ලිපිනයත් ඔහුට කීවාය. මම තවත් එහි නොරැඳී මගේ කාමරයට ගියෙමි. මේ කාලය පුරා මා ගෙවූ ජීවිතය අර්ථ සුන් වූවා නොවේද..? ඇස් වලින් කඳුළු වැටේ. මම යහනින් නැගිට්ටෙමි. නිම්සර තව පැය කීපයක් ඇතුළත එන බව විශ්වාසය. මම කැඩපතින් මගේ මුහුණ බැලුවෙමි. ඊළඟට නාන කාමරයට වැදී නෑවෙමි. යන්තම් හැන්දෑව රැයකට හැරී තිබිණි. රෝස පාට ගවුමක් හැඳගෙන මම කැඩපතින් මදෙස බලා උන්නෙමි. මගේ උස පහයි පහක් වන්නට ඇත. මා ඉක්මනට උස ගියා නොවේද..? උස වාගේම මා ලස්සනය. ඉස්සර මගේ සුදෙහි වූ සුදුමැලි ගතිය දැන් නැත. උක්කු අම්මා කියන්නේ නුවර ගොස් මා බොහෝ සොඳුරු වී ඇති බවකි.

"අනේ අනේ... කියලා කට ගන්න ලැබුණෙ නෑ... යාළුවා හොයන් ආව නේද..?"





ඒ උක්කු අම්මාගේ හඬය. ඔහු ඇවිත්ය. අවුරුදු ගාණකට පසුව ඔහු ඇවිත්ය. පපුව ගැහේ. මම විදුලි බුබුළ නිවා දැමුවෙමි. ඊළඟට යහනේ අනෙක් පසට හැරී නිදා ගත්තෙමි. දිගම දිග කොණ්ඩයෙන් වතුර බේරී යයි. ඇස් හිනැහේ. නිම්සරගේ සපත්තු ගැටෙන හඬ ඇසේ. ඔහු දැන් ලොකු මිනිසෙකි. නිම්සර මගේ යහන ළඟම නතර විණි.

"ශෝබා..."

ඔහු කතා කළේය. මම අත් දෙක පපුවට තද කරගෙන උන්නෙමි. නිම්සර යහනේ කෙළවර මා ළඟ හිඳ ගත්තේය.

"ඔයා මාව බලන් හිටියා... මං දන්නවා ඔයා නිදි නෑ..."

මට ලැජ්ජාවක් දැනිණි.

"මේ කළුවරේ ඉන්නෙ ඇයි..? මට ඔයාගෙ මූණ බලන්න ආසයි ශෝබා..."

ඇසින් කඳුළක් වැටිණි. නිම්සර පළමුව ඇල්ලුවේ මගේ කම්මුලය. ඊළඟට අනෙක් අත මගේ හිස මුදුනට තබා ඔහු මා හැරවීය. කම්මුලේ වූ කඳුළු ඔහු අතට හසුවන්න ඇත.

"ශෝබා... ප්ලීස්..."

තවත් බොරු කරන්න බැරිය. උක්කු අම්මා ආවොත්.. මම යහනේ හිඳ ගත්තෙමි. ඇඳ විලයට කොට්ටය තබා හේත්තු වූයෙමි. නිම්සරට මා නොපෙනේ. මට නිම්සර නොපෙනේ.

. "මේ ඔයාද ශෝබා... මං ඔයා ළඟ ඉන්නවා... මං... මං හිතුවා ආයෙ කවදාවත්ම මට ඔයාව දකින්න ලැබෙන්නෙ නෑ කියලා.."

මම කතා නොකළෙමි.

"මං හුඟක් විඳෙව්වා... ඔයාව හොය හොය ඇවිද්දා... මට හිතුණා අත්කල් බොරු කියන්නෙ කියලා... ඔයාගෙ කොළඹ නෑදෑ ගෙවලුත් හොයන් ගියා. මං... ඒත් මුකුත්ම දැනගන්න ලැබුණෙ නෑ.. මාව අත් ඇරියද..?"

මම ඒත් කතා නොකළෙමි.

"කතා කරන්න ශෝබා..."

"ඔයා දූහැන්යාගෙ..."

එදා වගේම අදත් මට ඒ වචන ටික කියවිණි. විශ්වාස කරන්න නිමසරට හැකිණි. ඔහු මගෙන් නොඅසා මගේ පපුවට ඔහුගේ හිස තද කරගෙන පොඩි ළමයෙකු වාගේ හැඬුවේය. මම අත් දෙකෙන් ඔහුගේ මුහුණ වත් නොඇල්ලුවෙමි.

"උක්කු අම්මා එයි..."

මට කියවිණි. ඒත් නිමසර හිස ඇද ගත්තේ නැත. මගේ පපුව තදින් ගැහිණි.

"ඔයාගෙ පපුව ගැහෙනවා... ඇයි ඔයා බයවෙලා..?"

"ඔයා මෙහෙම ඉන්න එක හොඳ නෑ..."

මම කීවෙමි. නිමසර හිස ගත්තේය. ඊළඟට මගෙ උරහිස මත අත් තබා මා ඔහුගේ පපුවට ඇද ගත්තේය.

"නිමි.. සර..."

දෙයියනේ... මේ මොනවා වෙලාද..? ඔහු මා කිටි කිටියේ තුරුළු කරගෙන උන්නේය.

"මාව දාලා ගියා නේද..? මං විඳෙව්වා නේද..?"

මගේ මුහුණ ඔහුගේ අත් දෙකට මැදි විණි. ඔහු කට්ට කරුවලේම මගේ මුහුණ සිප ගත්තේය. මගේ දෙතොල් තද කර සිප ගත්තේය.

"මාව මැරුණෙ නැති ටික විතරයි... දන්නවද... දන්නවද..?"

ආයේ මගේ මුහුණ ඔහු ඔහුගේ පපුවට තද කරගෙන කීවේය. කාමරයේ විදුලි බුබුළු දැල්වුනේ එවිටය. දෙයියනේ මම බිය වීමි. තාත්තා කාමරය පාමුලය. නිමසර ඒත් මා අත්හලේ නැත. නිමසර තාත්තා දෙස නොබලා මගේ මුහුණ බැලුවේය.

"ඔයා හරිම ලස්සන වෙලා..."

ඔහු කීවේය. ඒත් මම නම් නිමසරව ළඟ සිටත් නොදුටුවෙමි.





"අතාරින්න තාත්තා..."

මා කීවේ එපමණය. ඒත් නිමසර මා අත්හලේ නැත.

"මොනවද මේ වෙන්නේ..?"

"ශෝබා මුකුත් කළේ නෑ... මමයි..."

"ඔව් ඔයානෙ ශෝබාගෙ කාමරේට ආවේ... දැන්වත් ඔය ළමයව අතාරින්න.."

තාත්තා කීවේය. ඒත් ග්‍රහණය ලිහිල් කළා මිසක නිමසර මා අත්හලේ නැත.

"මාව දාලා අවුරුදු ගාණක් හැංගිලා හිටියා... මං පිස්සෙක් වගේ හෙව්වා අන්කල්.... මේ දුක අන්කල්ට තේරෙන්නෑ... මං අන්කල්ව හොයන් කී පාරක් ආවද..?"

"දූ කිව්වා එයා ඉන්න තැන කියන්න එපා කියලා..."

"මං එයාට මේ තරම් ආදරේ කරද්දී... එයා එහෙම කළේ කොහොමද අන්කල්..? කොහොමද ශෝබා... මගෙ පණ ටික නොගිය ටික විතරයි..."

තාත්තාට සිනා ආවේය.

"අනේ අනේ දූන් කාලෙ හැදෙන කොල්ලො... මං ඉස්සරහම කියනවා මගෙ දූට ආදරේ කළාලු..."

"ඔව් ඒක ඇත්ත..."

"එහෙනම් ඉතින් ඔක හිතන්න දෙයක්යැ.... ඔයා හොඳ ළමයෙක්.. පවුල් හොඳයි... වයස හරි ගිහින් රස්සාවක් කරලා කසාද බඳින්න... හැබැයි පුතෝ ආයෙ ඔහොම හැසිරෙනව නෙමේ..."

නිමසරට සිනා නැගිණි. ඔහුගේ මුහුණේ වූයේ සතුටකි. ඒත් ඒ සතුට මගේ මුහුණේ වූයේ නැත. තාත්තා කාමරයෙන් එළියට ගියේ 'පුතාලත් එන්න' කියමිනි. මට තාත්තා ගැන දුකත් සිතිණි. ආඩම්බරත් සිතිණි. ඔහු හොඳ තාත්තෙකි. ඒත් නිමසර තාත්තාගේ හිත රවටනවා මට බලා ඉන්න බැරිය.

"ඇයි තාත්තට එහෙම කිව්වෙ..?"

"මං ඇත්ත කිව්වෙ..."

"තාත්තා ඔයා මාව බඳියි කියලා දැන් හිතනවා..."

"ඉතිං..."

"නිම්සර ඔයා දුහැන්යාගෙ... ඔයාගෙයි එයාගෙයි කසාදෙ ස්ථිරයි.... නේද...?"

"ඒව මං දන්නෑ..."

"නිම්සර..."

"නිම්සර.. නිම්සර කියල මගෙ නම මතක් කරල දෙන්න එපා... ඔයා මගෙ... මං ඔයාගෙ..."

"දෙයියනේ ඔයාට..."

"මෙන්න මේ නැගිටිනවා... මට ඔයාගෙ උස බලන්න... මටත් වඩා උස ගිහින්ද මංදා..."

නිම්සර මා යහනෙන් නැගිට්ටුවේය. මට සිනා නැගිණි. මා හැඳ උන් කෙටි ගවුමට වඩා මගේ හිසකේ දිගය. නිම්සරත් මමත් සිට ගත්තෙමු.

"හොඳ වෙලාවට මං පහයි දහයක උස කොල්ලෙක් උනේ.."

නිම්සර කීවේය. ඒ නෙත් එදා වගේමය. මුහුණේ පුංචිම පුංචි රැවුල් කොට කීපයකි. කොණ්ඩය මුහුණ පුරා විසිරේ. ඇත්තටම නිම්සර තවත් කඩවසම් වී තියේ. ලස්සන වී තියේ.

"ඉස්සර ශෝබා කෝ දැන්...? දැන් ඔයාව දැක්කොත් දුහැන්යාට ලැජ්ජා හිතෙයි..."

නිම්සර මගේ පිටට අත තබා ආයේ මා ඔහුගේ පපුවට තද කළේය.

"තාත්තා..."

මම කීවෙමි. ඒත් නිම්සර ගණනකට ගත්තේ නැත. ඔහු මගේ මුහුණ ඔහුගේ අත් වලින් අල්ලා බැලුවේය. ඊළඟට අත් නැඹ





ගවොමේ ඉහළ සිට පහළට අතගා බැලුවේය. පිටට තිබූ අත පිට දිගේ පහළට ගියේය. ආයේ නළලේ සිට නහයට නහයේ සිට ගෙළට පපුවට බඩට අත ගෙන ගියේය.

"විකාරද..?"

"ඔයා හුඟක් වෙනස් වෙලා. ඒකයි බැලුවෙ... මට විශ්වාස කරන්න බෑ ශෝබා... ඔයාව මේ ආයෙ මං දකිනවා කියලා..."

"යං එළියට තාත්තා බලාගෙන ඉන්නවා..."

"යං... කියන්න මට ආදරේද..?"

"පිස්සුද මංදා..."

"කියන්න ශෝබා..."

ඔහුගෙන් බේරෙන්න බැරිය. මම කිසිවක්ම නොකීවෙමි.

"අපරාදෙ තාත්තා ආවෙ... තව ටිකක් කළුවරේ තුරුල් වෙලා ඉන්න තිබුණනම්..."

"ඔයානම් මහ වල් කොල්ලෙක් වෙලා..."

නිම්සර සිනා වූවේය.

"ඔයාව දැක්කම එහෙම නොවී තියෙයිද...? මට දැන් කසාද බඳින්නයි හිතෙන්නෙ..."

මම සිනාසෙමින් කාමරයෙන් එළියට ආවෙමි. ඒත් නිම්සර මගේ අතින් අල්වා ගත්තේය.

"යංකො..."

"කියල යන්න.."

නිම්සර ආයේ මා ඔහු ළඟට ගත්තේය.

"මං ඔයාට ආදරෙයි... ඒත් ඔයාට දුහැන්යාගෙ ප්‍රශ්නෙ විසඳගන්න පුළුවන්ද..?"

"පුළුවන්... මං දුහැන්යාට ආදරේ නෑ... තේරුණාද... මං ආදරේ ඔයාට..."

අපි කතා නැතුව සාලයට ගියෙමු. තාත්තා එහි සෙට්යේ හිඳගෙන උන්නේය. ඔහු ආයෙත් අපට හිඳගන්න කීවේය. තත්පර කීපයක් තාත්තා කතා කළේ නැත.

"මේ අහන්න නිමසර... ඔය දෙන්නට මට කියන්න වැදගත් දෙයක් තියෙනවා..."

"මොකක්ද අන්කල්...?"

"ශෝබා නුවර ඉන්න කාලෙ ශෝබාට එහේ කෙනෙක් ආදරේ කළා..."

නිමසර වහා මදෙස බැලුවේය.

"මං කිව්වෙ අපේ දුව නෙමේ. දූ දන්නෙවත් නෑ.... මගෙ අක්කගෙ පුතා.... අකී... එයා ගෙවල් වලටත් දුන් කරදර කරනවලු... මටත් එක දිගට කෝල් කරනවා.... එයා අපේ ශෝබාට ආදරේලු... ශෝබාව කසාද බඳින්න ඕනලු.... මං කිව්වා මං කපල මුහුදක දැම්මත් මගේ දුව දෙන්නෙ නෑ කියල.. ඌ මේ... චණ්ඩියා..."

තාත්තා කතා කළේ වේගයෙනි.

"ඒත් තාමෙහට අහන්නැති එකා නිසා මටත් ටිකක් හිතට සැකයි... අක්කා මට කියනව ඉතිං ශෝබා අකී බැන්දම මොකද වෙන්නෙ කියලා... මං එයාටත් කනේ ඇඟිලි ගහගන්න කියලා දුන්නා... ඔය මැරයා මොනවා කරයිද මංද... දුව පිළියන්දල ඉන්නවා කියලා දන්නෙ නෑ..."

තාත්තා මේ තරම් බියගුලුව හැසිරී නැත. ඔහු පොලිස් නිලධාරියෙකි.

"මං ඌට බය නෑ... ඒත් මට ප්‍රශ්නයක් තියෙන්නෙ ඌත් මගෙ අක්කගෙ පුතා නිසයි... අනික ඌ පාතාලෙ උං එක්ක පවා සම්බන්ධයි... මට බයයි අපේ කෙල්ල ගැන.. ඌ ගෙදර කියනවලු ඌට ශෝබාව ඕනැම කියල..."

නිමසරගේ මුහුණේ සතුටක් තිබුණා නම් එය අතුරුදහන් වී තිබිණි.





"මම දුන් යන්න ඕනැ... මේ අහන්න ඔය දෙන්න ඔහොම හැසිරෙනවට මං කොහොමටවත් කැමති නෑ... ඒත් පුතේ..."

තාත්තා මා දෙස බැලුවේය.

"දන්නවද මගෙ පුතාට ගැළපෙන්නේ නිමසරවයි.... හැන්ඩියානෙ..."

තාත්තා නැගිට ගත්තේ සිනාසෙමිනි. මම තාත්තා ළඟට ගියෙමි. ඔහු මා ඔහුගේ එක අතකට ගෙන පපුවේ එක කෙළවරක තබාගෙන නිමසරට කතා කළේය. ඔහුව අනෙක් අතට ගෙන පපුවේ අනිත් කෙළවරේ තබා ගත්තේය.

"මගේ දූ හොඳට බලාගන්න ඕනැ පුතේ... මං අද නෙමේ මීට අවුරුදු ගාණකට කලින් දන්නවා ඔයා මගේ දුවට ආදරේ කළා කියලා... ඒත් ඒ ආදරේ මැද්දෙ පටලැවිල්ලකුත් තිබුණා කියලා මං දන්නවා... ඔයා කොළඹ මගෙ ඥාතීන් ළඟට ගිහින් දූ ගැන හෙව්වා කියලා දන්නවා... ඔයාට වැඩිය කෙනෙක් මගෙ දූට ආදරේ කරනවා කියලා මං හිතන්නෙ නෑ..."

"මං ශෝබාට හුඟක් ආදරෙයි අන්කල්... ඒ ගැන හිතන්න එපා...."

"මං දන්නවා... එහෙනම් මං යනවා... පුතේ මගෙ දූව බලාගන්න... බලා ගන්නවා කියන්නේ ආදරවන්තයෙක් හැටියට නෙමේ... එයාගෙ ගෞරවයත් ආරක්ෂා වෙන්න ඕනැ... ඔයා එයාට තාත්තෙක් අයියෙක් වෙන්න ඕනැ... එතකොටයි කෙල්ලෙකුට ආදරේ කරන කෙල්ලගෙ ආදරේ සම්පූර්ණ වෙන්නෙ..."

නිමසර කතා කළේ නැත. ඒත් ඔහුගේ බැල්මේ වූයේ ඒ සියලු දේ පිළිගත් බවය. තාත්තාගේ වාහනය පිටවී ගිය පසු නිමසර මගේ අත තදකර අල්වා ගත්තේය.

"අනේ අනේ මහත්තය ගියැයි... මේ කළුවර වැටුණු වෙලේ... මං කෑමත් ලෑස්ති කළා.... එන්න පුතේ එහෙනං කෑම කන්න..."

උක්කු අම්මා නිමසර කෑම කාමරයට එක්ක ගියාය. හිතේ සතුටක්ද නොවේ නම් වන්නේ ප්‍රශ්න වැලක්ද..? මට තේරුණේ

නැත. මේ බලාපොරොත්තු මේ සිහින කවදා ඉටු වේවිද..? මට හිතාගන්නටවත් බැරිය.

"හුඟක් රෑ වුණා..."

කෑම ගැනීමෙන් පසුව ආයේ අපි මිදුලට වී උන්නෙමු. ඇත්තය. සඳ එළිය හොඳින් වැටී තියේ. රෑ නමයත් පහුවී තියේ.

"ඔයාගෙ ගෙවල් කොහෙද නිමසර..?"

"මහරගම..."

නිමසර ඇවිත් තිබුණේ යතුරු පැදියෙනි. ඔහු යතුරු පැදියට නැග්ගේය. නැගත් මා දෙස බලා උන්නේය. මම ඔහු දෙස බලා උන්නෙමි.

"ඔයා නැතුව මට ජීවත් වෙන්න බැරි වෙයි...."

නිමසර කීවේය.

"දැන් රෑ වෙලා. අද ඉඳලා හෙට උදේම යන්න..."

මම කීවෙමි. කියන්නත් කලින් නිමසර යතුරු පැදියෙන් බැස්සේය.

"ඔයා නම්...."

මට සිනා නැගිණි. නිමසර ගෙට ඇතුළු වූවේය.

"මේ රෑ වෙලා යන්න එපා පුතා... ඉඳලා හෙට උදේම යන්න..."

"ඒක තමා උක්කු අම්මා... මේ ශෝබත් කියන්නෙ..."

නිමසරට මගේ කාමරයට එහා කාමරයක් පිළියෙල කළේ උක්කු අම්මාය. අපි බොහෝ රෑ වෙන තුරු කතා කරමින් උන්නෙමු. නිමසරගේ ජංගම දුරකථනය හැඬවිණි. නිමසරගේ මුහුණ අඳුරු විය. 'කවුද' කියා මා ඇහුවේ ඇස්වලිනි.

"කියන්න දැහැන්යා..."

මගේ ප්‍රශ්නයට නිමසරගේ දුරකථන ඇමතුමෙම උත්තර විය.





"ඔව්... මං... මේ... පිළියන්දල ආවා. යාළුවෙකුගෙ ගෙදර ඉන්නේ...."

නිමසර කීවේය. මම නිමසරගේ දුරකථනය ඇදගෙන එය කණේ තබා ගත්තෙමි.

"ඔයා හරි නරකයි නිමසර... මං හවස ඉඳන් බලා හිටියා... ඔයා නැතුව මට පාළුයි... හැමදාම හවසට මාව බලන්න එනවා, අද ආවෙ නෑ... ඔයාගෙ ඔය යාළුවා කවුද..?"

මම ආයේ දුරකථනය නිමසරට දී මගේ කාමරයට ආවෙමි. හේතුවක් නැතිව හිත නරක් වී තිබිණි. නිමසරව මටත් දැහැන්යාටත් බෙදා ගන්නට පුළුවන්ද..? හිතේ බොහෝ දුක් ඇදිණි. මම මගේ පොත් මේසයේ හිඳගෙන කොළයක් කුරුටු ගෑවෙමි.

"අහසින් වැටුණා කඳුළක්...

දුකින් මිදුණු... දුක් ඇසින් වැටුණු....

දුක් කඳුළක්...

ඒ මගේ නොවේ

ඔබෙත් නොවේ...

අපට අයිති නැති කඳුළක්...

ජීවිතේ පුරා...

ඒ කඳුළ මගේ...

පරිස්සමට ළඟ උන්නාවේ..

එය ඔබෙත් නොවේ

එය මගෙත් නොවේ...

ඒ උනත් කඳුළ... මගෙ

මට විතරයි...."

එය ලියවුණේ මටය. ඒත් ලියූ එය කියවූයේ නිමසරය. එය ඔහු තමාගේ සාක්කුවේ රුවා ගත්තේය. මම පුටුවේ හිඳගෙන

මේසයට රවා උන්නෙමි. නිම්සර පිටුපසින් විත් මගේ ගෙලින් පහළට මුහුණ ඔබා ගත්තේය.

"ප්ලීස්... යන්න..."

"ඔයා දුක් විඳිනවා..."

"නැහැ..."

"දූහැන්යා නිසා ඔයා දුක් විඳින්න එපා ශෝබා... මං ඔයාගෙ..."

"මාව රවට්ටනවද... දූහැන්යාව රවට්ටනවද..?"

"දූහැන්යාව..."

"බොරු.. ඔයා හැමදාම හවස දූහැන්යාව බලන්න යනවා..."

"ඔව්... ඒ දූහැන්යා එක්ක ඔයාව මතක් කර කර විඳෝන නිසා දූහැන්යා වචන පහක් කතා කළොත් හතරක් ඔයා ගැන..."

"මොනවද කියන්නෙ..?"

"ඔයා ගැන හැමදේම... හැබැයි දූහැන්යා ඔයාට ආදරෙයි..."

"ඒක තමයි මටත් දුක.. මේක වැරදියි නිම්සර...."

"අපි අපිට ආදරෙයිනෙ ශෝබා..."

ඔහු මගේ ගෙළ සිප ගත්තේය.

"තාත්තා කියපුවා මතකද...?"

මම ඇසුවෙමි.

"මං ඔයාව පරිස්සම් කරනවා.. ඒ ගැන හිතන්න එපා... ඒත් මට ඔයා ළඟදී ඔයාට ගුලි වෙලාම ඉන්නයි හිතෙන්නෙ..."

නිම්සර කීවේය. මට දුකත් හිතේ. බයත් හිතේ. නිම්සර මගේ පුටුව ළං කරගෙන යහනේ හිඳ ගත්තේය.

"මං ආදරෙයි..."

"දත් කීසැරයක් කිව්වද...?"





මම නිම්සරගේ මුහුණ බලාගෙන කීවෙමි.

නිම්සර මගේ අත් දෙක ඔහුගේ පපුවට ඇද ගත්තේය.

"මං ඔයාට මේ තරම් ආදරේ ඇයි...?"

"ආදරේ.. පස්සෙ නැතිවෙයි..."

"පිස්සු හැදෙයි..."

නිම්සර මගේ උකුල මත හිස තබා ගත්තේය.

"නිම්සර..."

"හ්ම්..."

"ඔයා දූහැන්යාව ඉඹල තියෙනවද..?"

"නැහැ..."

"බොරු..."

"විශ්වාස නැද්ද..."

"අනේ මංදා..."

මම කීවෙමි. නිම්සර මගේ මුහුණ බැලුවේය.

"අකී ඔයාව උස්සන් යයිද මංද..."

නිම්සර හිනැහිණි.

"කියන්න බෑ..."

"මං ඌව මරනවා...."

"ඔයාව ඌ මරයි... ඔයා දන්නෑ අකී ගැන..."

"අකී කියන්නෙ උඹෙ මිනිහද..?"

මට හිනා නැඟිණි. නිම්සර කෝපයෙනි.

"ඔහොම කතා කරන්න එපා නිම්සර..."

මම කීවෙමි. ඇස්වලට කඳුළුත් ඇවිත් තිබිණි. නිම්සර වරද නිවැරදි කරන්නට මෙන් මගේ අත් දෙක අල්වා ගත්තේය.

"මං ඔයාට හුඟක් ආදරේ කළා ශෝබා..."

ඒ රැය පහන් වනතුරුම ඔහු කියවූවේය. මට ආදරේ කළ තරමක් මා නැතිව විඳපු හැටිත් මා නැතිව ජීවත් වන්න බැරි බවත් කීවේය. මගේ පපුවට හිස තබාගෙන වරු ගණනාක් මගේ මුහුණ බලාගෙන උන්නේය. ජීවිතය ඉතින් සුවඳ විය.



# 4

"මං කල්පනා කළේ නිමසර අපි ඔයාගෙ තාත්ත එක්කත් ඔය දෙන්න ගැන කතා කළොත් හොඳයි.."

එක හැන්දෑවක තාත්තා නිමසර එක්ක කීවේය.

"ඇයි අන්කල් හදිස්සි වෙන්නේ..? මං හෙමින් තාත්තා එක්ක කියන්නම්... මං තවම බිස්නස් වලට අත තිබ්බා විතරයි... ඉතින් එයා දැන්ම මෙහෙම දේකට..."

"නෑ නෑ පුතා... මට ඕනැ මේ දේවල් ස්ථිර කරගෙන හිත නිදහසේ ඉන්න විතරයි..."

"හරි අන්කල්... තව ටික දවසක් දෙන්න..."

නිමසර මේ තරම් පසුපසට මේ ප්‍රශ්නය ගෙන යන හේතුව මම දැන උන්නෙමි. ඒ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකුගේ එකම දියණිය වන දැහැන්යා එක්ක නිමසරගේ විවාහය තීන්දු වී ඇති නිසාය. මගේ තාත්තා ඔවුන්ගේ ධනය බලය ඉදිරියේ සාමාන්‍ය පුද්ගලයෙකු විතරය.

"අනේ මංදා සුදූ දූ මට පේන්නෙ නිමසරගෙ හිතේ දෙගිඩියාවක් තියෙනවා..."

තාත්තා නිමසර නැති තැනකදී මට කීවේය. මම කිසිවක් නොකියා අඳුරු රාත්‍රිය දෙස බලා උන්නෙමි.

"සමහර විට නිමසරලගෙ තාත්තා දළ සාරයකො... අපි එක්ක

නැදෑකම ඇති කරගන්න අකමැතිද කවුද දන්නෙ..? ඒව උනත් දන්ම දනගන්න එකනෙ හොඳ දරුවෝ... නැත්නම් නිම්සර විතරක් කැමති උනාට දිග යන්න පුළුව නෑ..."

තාත්තා කතා කළේ සොච්නි.

"කෑම ලෑස්තියි මහත්තයො.."

උක්කු අම්මා කීවාය.

"යං පුතේ කන්න..."

"තාත්තා කන්න මං පස්සෙ..."

"මොන පස්සෙද... රෑ උනා යං යං..."

හිතේ දෙගිඩියාවකි. නිම්සර මට ඇත්තටම ආදරේ උනත් හිත අවුලෙනි. වේදනාවෙනි.

"සෝකටත් අපි හෙට යමු පුතා නිම්සරගෙ ගෙවල් පැත්තෙ..."

තාත්තා මා බියට පත් කළේය.

"ඒත් තාත්තා..."

"ඒත් මේත් බෑ.. එහෙනං මේව එකලාස වෙනකම් නිම්සර මෙහේ එන්න බෑ... ඔයා කාගෙන් අහලද මං ගෙදර නැති දවසෙ නිම්සරව මෙහේ නතර කරගත්තේ.... උක්කු අම්මා හෝදිසියෙන් ඉදලා තියෙන්නෙ රෑ එළිවෙනකං නිම්සර දූගෙ කාමරේලු..."

තාත්තා කෑම පිඟාන බාගෙට කා අත සෝදාගෙන යන්න ගියේ නොහොඳිනි. පපුව ඩිග් ඩිග් ගෑවේය. මට ලැජ්ජාවකුත් දුකකුත් දැනිණි. එදා රාත්‍රියේ මා නිම්සරව මගේ කාමරයේ නතර කර ගත්තා නොවේ. ඔහු තමාගේ කාමරයට ගියේ නැත. අපි එළිවෙන තුරුම කතා කළෙමු. ඔහුගෙන් අබැටක වරදක් වූයේ නැත. ඒත් තාත්තා එහෙම හිතාවිද..? රාත්‍රියේ පුරුදු විදිහට නිම්සර මට දුරකථන ඇමතුමක් දුන්නේය.

"ශෝබා..."

"නිම්සර..."





"ඇයි නිකං අප්සට් වගේ...?"

"නැහැ..."

"ඔයා දුකින් ශෝබා..."

"තාත්තා එදා රෑ ඔයා මගේ කාමරේ හිටිය එක වැරදියට හිතල. එයාට ඕනැ ඔයාගෙ ගෙදර එන්න..."

"ප්ලීස් ශෝබා... මේ වෙලාවෙ ඒක කරන්න දෙන්න එපා... දුහැන්යාට අපේ තාත්තා උඩින්ම කැමතියි. අම්මත් එහෙමයි. තාත්තට සල්ලි දේපළ වලට වඩා මුකුත්ම නෑ.."

මගේ ඇස්වලට කඳුළු නැගිණි.

"ඒක නෙමේ... අද මට දුහැන්යාට අමතක වෙලා ඔයා ගැන කියවුණානෙ..."

"ඉතින්..."

"දුහැන්යා උඩ පැන්නා ඔයාව මීට් වුණා කිව්වම... මගෙන් සේරම හාර හාර ඇහුවා... මං කිව්වා පිළියන්දල ඉන්නෙ තැන දන්නෑ කියලා... ටෙලිෆෝන් නම්බර් එක ගත්තා... ඔයා ෆෝන් එක ඕෆ් කරල කියල කිව්වා..."

ඇත්තය. මම හැන්දෑවේ දුරකථනය විසන්ධි කළෙමි. ඒ මා බුදු ගෙට යන වෙලාව නිසාය.

"සමහර වෙලාවට දුන් කතා කරයි... ඔයා කියන්න... මාව පිළියන්දලදි මීට් උනා කියලා..."

මම කිසිත් නොකියා දුරකථනය විසන්ධි කළෙමි. නිම්සර ගැන තරහක් ඇතිවූයේ ඇයි..? නිම්සර දුහැන්යාට මේ තරම් බිය ඇයි...? හිතේ දුක් ගොඩකි. මම දුරකථනය විසන්ධි කොට නැවෙමි. දුහැන්යා එක්ක කතා කරන්න හිතේ සතුටක් වූයේ නැත. සාලයට යද්දී තාත්තා දුරකථන සංවාදයකය.

"ඇයි අක්කේ මේක තේරුම් ගන්න බැරි..? මගෙ කෙල්ල වෙන පිරිමි ළමයෙකුට ආදරේ කරනවා... එයි අකීට කැමති නෑ.. මාත් අකීට කැමති නෑ..."

ඒ තාත්තාය. මම තාත්තාට සවන් දීගෙනම රූපවාහිනියේ හඬ අඩුකර එය දැම්මෙමි.

"අකී හොඳ ළමයෙක් වෙයිද නරක ළමයෙක් වෙයිද කියන එක තෙමේ මෙතන ප්‍රශ්නෙ... මට මගෙ දූව දන දන ඔය නොසන්ඩාල කොල්ලට දෙන්න බෑ.... අනික දූගෙ සතුට තියෙන්නෙ වෙන තැනක... මේ අපේ සහෝදර කමුත් නැතිවෙන පොටක්... අකී මගෙ ඔෆිස් එකට කතා කර කර මට කරදර කරනවා... හොරණ ගෙදරට දවස් දෙක තුනක් ආවා... අකීට කියන්න මගෙ දූව මං ලබන සතියෙ රට යවනවා කියලා..."

තාත්තා දුරකථනය තැබුවේ වේගයෙනි. මම තාත්තා දෙස බලා උන්නෙමි. මා නිසා ඔහු කරදරයෙති. තාත්තා මා දුටුවත් නොදුටුවා වාගේ යන්න ගියේය. මා තාත්තාට මහා වරදක් කර ඇත. නිම්සරව මගේ කාමරයේ තබා ගැනීම වැරදිය. තාත්තා දූත් බුරුලෙන් මා ප්‍රයෝජන ගත්තා කියා ඔහු හිතනවා ඇත. ඒ රාත්‍රිය පුරා මම දුරකථනය ක්‍රියාත්මක නොකළෙමි. ගෙදර දුරකථනය රාත්‍රී එකොළහට විතර හැඬවෙනවා මට ඇසිණි. එවිට මා උන්නේ මගේ කාමරයේය. තාත්තා සාලයට යන හඬ ඇසිණි

"හෙලෝ..."

මම දෑස් හැරියෙමි. තාත්තාගේ කටහඬ වේගය.

"ආ නිම්සර පුතාතෙ... රෑ එකොළහයි පුතා..."

තාත්තා කීවේය. අද තාත්තාගේ හිත හොඳ නැත. නිම්සරට බණීවිද..?

"ආ එහෙමද..? අපේ දූ ෆෝන් ඔෆ් කරන්ද...? මං අද එයාට පොඩ්ඩක් බැන්නා... මං කෙළින් කතා කරන මිනිහෙනෙ පුතා... ඔයා එයා එක්ක රෑ එළිවෙනකම් එයාගෙ කාමරේ හිටිය එකට මං දොස් කිව්වා... මෙව පරක්කු කරන්න බැරි ඒකයි... මම හෙටම ඔයාගෙ තාත්තා මීට වෙන්න වෙනවා.."

මගේ පපුව හෝස් ගෑවේය.

"බුදු සරණයි පුතා..."





මම ඇස් තදින් පියවා ගත්තෙමි. ඒ රාත්‍රිය පුරා මට නින්ද ගියේ නැත. පහුවදා පාන්දර හරියේ මට නින්ද යන්න ඇත. නිම්සර කුමට හමුවුණාදැයි සිතමින් මම නින්දට ගියෙමි. මා ඇහැරුණේ උක්කු අම්මා කාමරයට ආ විටය.

"හරි ෂෝක් ගෑනු ළමයා... උදේ නමයත් පහුවෙලා.."

"එළිවෙනකම් ඇහැරගෙන උක්කු අම්මා..."

මම මේසය මත වූ ගුරුලේත්තුවෙන් වීදුරුවට වතුර දමාගෙන ජනේලය හැර මුව සේදීමි.

"මහත්තයත් උදේම ගියා..."

මම වහා උක්කු අම්මා දෙස බැලුවෙමි.

"ගියා..."

"ඔව් නිම්සර ළමයලයි ගෙදර යනවය කිව්වෙ..."

"දෙයියනේ කීයටද..?"

"උදේ හත වෙද්දි ගියේ... දැන් ගිහිනුත් ඇති.."

මම ඉක්මනට දුරකථනය ක්‍රියාත්මක කළෙමි. නිම්සරගේ අංකයට කතා කළෙමි. ඒත් එය විසන්ධි කොටය.

"මොනව වෙලා ඇද්ද..?"

දහවල වෙද්දී හිතේ වේගය වැඩි විය. තාත්තාගේ වාහනයේ හඬත් ඇසිණි. මම කාමරයෙන් සාලයටත් සාලයෙන් මිදුලටත් දිව ගියෙමි. වාහන දෙකක් මිදුලේ නතර විණි. එකකින් තාත්තාත් අනෙක් වාහනයෙන් දුහැන්යා හා නිම්සරත් බැස්සාහ. මගේ දෙපා පණ නැතිව් තිබිණි. මම සාලයේ වූ උළුවස්සේ තදින් එල්ලී ගත්තෙමි. දුහැන්යා හිනැහීගෙන දිව ආවාය. නිම්සරගේ තොත් හඬන්න ළගය. තාත්තා දුක හිතෙන බැල්මකින් මදෙස බලා ගෙතුළට වැදිණි.

"අනේ අනේ කෙල්ලෙ... නොකියම හැංගුණා නේද..?"

දුහැන්යා මා වැළඳ ගත්තාය. ඩෙනිම් කලිසමක් හා සුදු කළු වී ෂර්ටයක් හැඳ උන් ඈ මා වැළඳගෙන උඩ පැන්නාය.

"මං මොන තරම් දුක් උනාද..? කොහොමද බබෝ...?"

"යං ගෙට..."

"ඔන්න අද අන්කල් උදේම නිමසරගෙ ගෙදර ආවා... ඊයෙ නිමසරලගෙ ගෙදර බණනෙ... ආච්චිඅම්මගෙ. ඉතින් මාත් එහේ හිටියෙ... අන්කල් ළඟට ආව ගමන්ලු..."

"ඉඳගන්න..."

"ඉඳගන්න බැරියැ... කෝ.. කැරකෙනවා රවුමක්... බලන්නකො නිමසර ශෝබා බෝනික්කි වෙලානෙ.. කෝ ඉස්සර හිටපු සුදුමැලි නාවර කෙල්ල..."

දූහැන්සා හිනැහේ. බයාදු බැල්මක් හෙළූ නිමසර හිඳගත්තේය.

"උක්කු අම්මා අපට බොන්න මොනා හරි...."

මම කීවෙමි. තාත්තා පොලිස් ඇඳුම ඇඳගෙන සාලයට ආවේය. දුරකථනය නාද විණි. එය ගත්තේ තාත්තාය.

"මේ අකී මගෙන් කුණුහරුප අහගන්න එපා උඹ... උඹට දෙන්න ගෑනු මං ළඟ නෑ... මගෙ කෙල්ල හෙට අනිද්දම රට යනවා තේරුණාද...?"

තාත්තා ගුගුලේය. දූහැන්යා බියව උන්නාය. මගේ මුහුණ බැලුවේය.

"උඹේ පාතාල ලොක්කන්ට මං බය නෑ... උඹ මගෙ අක්කගෙ පුතා හින්දා මං මේ හොඳින් කියන්නෙ... මගෙ දූ ගැන අදහස අතඇරපන්..."

තාත්තා දුරකථනය දඩස් ගා තබා සාලයෙන් පිටවී ගියේය. උක්කු අම්මා සාලයට බෙල්ල දමා ආයේ මුළුතැන්ගෙට දිව්වාය.

"අන්කල්ට තදවෙලා.. මොකක්ද ප්‍රශ්නෙ බං..?"

"ඒක දිග කතාවක්.."

මම කීවෙමි.

"කවුරු හරි කොල්ලෙක් උඹව ඉල්ලනවා..."





"අතැරලා දාන්න දූහැන්යා... තාත්තා මොනවද එහේ ඇවිත් කිව්වේ...?"

"මුකුත් නෑ... ළඟට ආව ගමන්ලු... අපේ තාත්තයි නිමසරගෙ තාත්තයි එක්ක කතා කළා.. අපි දෙන්නා එන්ගේජ් වෙලා ඉන්නෙ කියලා අන්කල්ට කිව්වම ඩිම් උනා... අපි තාම පොඩි නිසා වෙන්න ඇති... ඒක නෙමේ උඹ දූන් කැම්පස් යනවද...?"

"ඔ... ව්..."

මට තාත්තා ගැන දුක සිතිණි. උක්කු අම්මා කේක් හා තේ රැගෙන ආවාය.

"කෑම ලෑස්ති කරන්න උක්කු අම්මා..."

මම කීවෙමි.

"ඒක ඇත්ත... අපි අද කාල බීල තමයි යන්නෙ..."

දූහැන්යා කීවාය. දූහැන්යා හොඳ මිතුරියකි. ඇ මා ඇදගෙන මිදුලට ගියාය.

"ලස්සනට මල් වවලා..."

"ඔව්... කම්මැලිකමට මමයි උක්කු අම්මයි.."

"ෂෝක් අනේ... හරිම ලස්සන වත්ත..."

"ඔයා හොරණ නෙමේද ඉන්නෙ දූහැන්යා...?"

"මොන... මං නිමසරගෙ ගෙදර ඉඳන් වර්ක් කරනවා... නිමසරගෙ කම්පනි එකේම ප්‍රයිවට් සෙක්‍රි..."

දූහැන්යා ඇස් නැටවූවාය. පපුව තදට රිදිණි. නිමසර එහෙම දෙයක් කීවේ නැත. ඔහු මා රැවටුවේ ඇයි...? මට දුක සිතිණි. දූහැන්යා නිමසර ඉදිරියේම එය කියද්දී නිමසර රතුවී උන්නේය. මම එක සැරයක්වත් නිමසර දෙස නොබලා උන්නෙමි. මගේ ආදරය වැඩක් නොවේ. මා කවුද..? නිමසරගේ ලෝකයේ ඉන්නේ ඇය..

"අපිට කන්න බොන්න දුන්නා... දන් ඉතිං මං හැමදාම

මෙහෙ එනවා... ඕකේ... එක්කො කසාද බඳිනකම් නිමසරගෙ ගෙදර ඉන්නවට වඩා හොඳයි අන්කල් එක්ක කතා කරලා මෙහේ හිටියනම්..."

දුහැන්යා කීවාය.

"යමුද...?"

නිමසර කීවේය.

"යං යං.... මොනවද හලෝ කාලෙකින් යාළුවා මීට් වෙලත් කතා කලේ නෑ හරියට..."

දුහැන්යා නැගිට ගත්තාය. මම ඔවුන් රියට නගින තුරුත් රිය ගෙමිදුලෙන් ඈත් වන තුරුත් බලා හිඳ මගේ කාමරයට දිව ගියෙමි. කඳුළු මටම උරුම කඳුළු කඩා වැටිණි. ආයේ වාහනයක හඬ ඇසිණි. තාත්තා වේලාසනම. මම කඳුළු පිහිදාගෙන යහනට වැටුණෙමි. තාත්තාට මුහුණ දෙන්නේ කොහොමද...? තාත්තා මට මුහුණ දෙන්නේ කොහොමද..?. නිමසර අපව රැවටුවායැයි තාත්තා කෝපයෙන් බව ස්ථිරය.

"අනේ දෙයියනේ... බුදු දෙයියෝ..."

ඒ උක්කු අම්මාගේ හඬය. මම ඇඳෙන් බිමට පැන සාලයට දිව ගියෙමි. පොලිස් නිලධාරීහු කිහිප දෙනෙක් වූහ. ඒ අතර තාත්තාගේ මිතුරා ජෙරාඩ් අන්කල් ද වූවේය.

"පුතේ තාත්තා ඇක්සිඩන්ට් වෙලා..."

මට ඇසුණේ එපමණය. මම පුටුවකට ඇද වැටුණෙමි. රෝහලට ගියේ කොහොමද කියාවත් මතක නැත. මම හඬමින් නිමසරට නොවේ දුහැන්යාට කතා කළෙමි.

"තාත්තා ඇක්සිඩන්ට් වෙලා..."

"මයි ගෝඩ් අපි එනවා... දැන්ම..."

කවුරුන් හෝ ළඟක වීම සතුටකි. කිසිවකු නැතිව මේ දුක දරා ගන්නේ කොහොමද...?

"ශෝබා..."





දුහැන්යාත් නිමසරත් ආහ. ඒ විතර නොවේ ඔවුන්ගේ දෙමාපියෝද සිටිති. මට ඒ ගැන සිහියක් වූයේ නැත. තාත්තා උන්නේ දැඩි සත්කාර ඒකකයේය.

"මොළේ කුඩුලු..."

කිසිවෙක් කීවේය. මම දෙතුන්වර සිහි නැතිව ගියෙමි. පුංචි කාලයේ පටන් මට උන්නේ තාත්තා විතරය. අම්මා තාත්තා කීවේ තාත්තාට විතරය. ඔහු නැති වුණොත් මා අනාථයකු වන්නේය.

"අද සර් හිටිමයෙ අප්සට් එකේ.. මොකක් හරි ලොකු ප්‍රශ්නෙක..."

සාජන්ට් දීපානන්ද කීවේය. දුහැන්යා මගේ මුහුණ බැලුවාය.

"එකත් එකට උඹේ අර කොල්ලා ඌ නිසා තමයි... කවුද ඌ..? ඇත්ත කියපං දැන්වත්... උඹ ඌට කැමතියි... තාත්තා අකමැතියි..."

දුහැන්යා දොඩවන්නීය.

"තමුසෙට පිස්සුද..?"

නිමසර තරමක් තදින් කෑගැසුවේය. මම දෙපා මත හිස ඔබාගෙන හැඬුවෙමි. නැන්දා මාමා හා අකී අයියා ද රෝහලට ආහ.

"මොකද මේ උනේ...? අනේ මල්ලියෙ..."

නැන්දා හැඬුවාය.

"මේ සේරම මූ නිසා..."

මාමා අකී අයියාට දොස් කීවේය. අකී අයියා නතර වුණේ මගේ ඉදිරියේය. ඔහුගේ නැන්දාගේ මාමාගේ හඬ මිස තවම මම ඔවුන් නොදුටුවෙමි.

"ශෝබා..."

අකී අයියා කතා කළේය. මම හිස නොඑසවීමි.

"ශෝබා.. බය නොවී ඉන්න... මං ඉන්නවනෙ..."

අකී අයියා කිවේය.

"තමුසෙ හිටියා කියලා ශෝබාට ඇති වැඩේ... ආ..."

මා හිස එසවූයේ නිමරසගේ ඒ කතාවටය. අකී අයියාගේ තරහ මුහුණත් නිමසරගේ සිනා නැති මුහුණත් දැක මම බිය වීමි.

අකී අයියා හිනැහුණේය. නිමසර දෙස බලා උන්නේය. දුහැන්යා නිමසරට දොස් කීවාය.

"ඒ අය තමන්ගෙ අය... ඇයි ඔයා පැටලෙන්නෙ...?"

දුහැන්යා කීවාය. මම බොහෝ හැඬුවෙමි.

"යං පුතේ ගෙදර..."

නැන්දා කීවාය. මම බැරි බව කීවෙමි.

"මුරණ්ඩු වෙන්න එපා යං.."

නැන්දා මා අතින් අල්වා ගත්තාය. නිමසර දුක් ඇසකින් බලා උන්නේය.

"ඔයා ඉන්න අකී... අපි මේ කෙල්ල එක්ක ගෙදරට යනවා.."

නැන්දාත් මාමාත් කොළඹ පැමිණියේ කවදාද කොහොමද..? මම දැන නොඋන්නෙමි. සමහර විට තාත්තා ගැන දැනගෙන ආවා වන්න ඇත. මගේ අහිංසක තාත්තා බේරා දෙන්න. මම ඉල්වීමි. නැන්දාත් මාමාත් එක්ක පිළියන්දල ගෙදරට එන්න මට සිදුවිය.

"අයියට තියෙන සල්ලි කාටද ඇත්තට තියෙන්නෙ..? මෙච්චර ලස්සන ගෙයක්..."

මාමා කීවේය.

"තාත්තා බොහොම දුක් විඳලයි මේ ගේ මට හැදුවේ.."

මම තරහින් කීවෙමි.

"නෑ නෑ පුතේ, අපි කිව්වද මෙව අපරාධ සල්ලි කියලා..."

නැන්දා කතාව වෙනතකට ගෙන ගියාය. මම කාමරයට වැදී ගත්තෙමි.





"මොකට ඇවිද්ද...?"

උක්කු අම්මා තරමක කෝපයෙන් කීවාය. මම කතා නොකළෙමි. රාත්‍රියේ මට නින්ද යන්න ඇත.

"අනේ දෙයියනේ... මගේ මල්ලී.. මොන අපරාධයක් ද වුණේ...?"

මම තිගැස්සී ඇහැරුණෙමි. ගෙදර එකම වැළපිල්ලකි. මට හුස්ම ගන්නට පවා අමතක විණි.

"ශෝබා... මගෙ කෙල්ල තනිවුණා නේද...?"

මම යහනින් බිමට පැන සාලය වෙත දිව ගියෙමි. අකී අයියාත් නිමසරත් දුහැන්යාත් උන්හ.

"මේ ඇයි මොකද...?"

මා අසන්න ඇත. නිමසර දුක්බර බැල්මකින් උන්නේය. නැන්දා දිගටම හැඬුවාය.

"අනේ ශෝබා අම්මත් නැති කෙල්ල..."

මම නිමසර ළඟට දිව ගියෙමි. නිමසරගේ අත් දෙක අල්වා ගත්තෙමි.

"නිමසර... මොකද වෙලා තියෙන්නෙ..? මගෙ තාත්තා හොඳින් නේද..? එයා හොඳින් නේද..?"

නිමසර බිම බැලුවේය.

"කියන්න නිමසර මගෙ තාත්තා... එයාට මං නැතුව බෑ නිමසර..."

ඒත් නිමසර කතා නැත.

"කතා කරන්න නිමසර.. මට මොනා හරි කියන්න..."

නිමසර මගේ හිස ගෙන ඔහුගේ පපුවට තද කර ගත්තේ ළඟ උන්නු අය ගැනවත් නොතකාය.

"මං ඉන්නවනෙ ශෝබා..."

දුහැන්යාගේ දෙතොල් වෙව්ලා යනු මම දුටුවෙමි.

"මට තාත්තා ඕනෑ.. මට තාත්තා බලන්න ඕනෑ.."

මම කෑගැහුවෙමි.

"එයා මැරිලා... තේරුම් ගන්න එයා යන්නම ගිහින් ශෝබා..."

"බොරු බොරු බොරු..."

මම නිම්සරගෙන් මිදුණෙමි. කෑගැහුවෙමි. හැඬුවෙමි. පොළවේ හැපි හැපී හැඬුවෙමි. ඒත් සත්‍යය එය විය. මගේ තාත්තා මිය ගොස්ය. දුහැන්යා මා කාමරයට එක්ක ගියාය. මම යහනට වැටී හැඬුවෙමි.

"අඬන්න එපා ශෝබා... අපි ඔයා එක්ක ඉන්නවනෙ..."

දුහැන්යාත් කීවාය. ඒත් මගේ තාත්තා වෙනුවෙන් නාඬා කොහොමද..? අම්මාගේ මතකයක්වත් නොඑන්නට මා බලා ගත්තේ ඔහුය. ඔහු ආයේ විවාහයක් කර නොගත්තේ මා නිසාය. මා බලා ගත්තේ ඔහුගේ ඇස් දෙක වගේය. අනේ එවන් පියකු වෙනුවෙන් නාඬා ඉන්නේ කොහොමද..? තාත්තාගේ දේහය රැගෙන ආවේ හොරණ මහ ගෙදරටය. අකී අයියා සියලු බර කරට ගත්තා වාගේ එහෙ මෙහෙ දිව ගියේය. දුහැන්යාත් නිම්සරත් මා ළඟින්ම උන්හ. ආයතනවල ඉහළ නිලධාරීහු තාත්තා බලන්නට ආහ. මම යහනින් හිස නොඑසවීමි. නැන්දා විලාප තබමින් හඬන හඬ ඇසිණි. ඔවුන් තාත්තාගේ මරණයේ වගකීම භාරගත යුතු යැයි මට සිතුණේ ඇයි..? තාත්තා ගෙදරින් ගියේ බැණගෙය. හිතට එක එක දේ ආවත් මම කතා නොකළෙමි. ඒවා හිතේ ඇතිවී මැකී ගියේය. බත් කටක් වතුර උගුරක් නොබී මම දුර්වලව උන්නෙමි. දුහැන්යා ඇවටිලි කළාය. ඒත් වතුර උගුරක් පමණක් බී මම ඔවුන් සැනසුවෙමි.



# 5

**සු**දු කොඩිවැල් - පාවඩ - ගරු බුහුමන් මැද තාත්තා අවසන් ගමන් ගියේය. ජීවිතය හිස් වී ගියා සේ දැනිණි. මම තාත්තා නැතිව හිස් වූ සුවිසල් ගෙය දෙස හිස් හැඟීමෙන් බලා උන්නෙමි. නැන්දාත් මාමාත් අකී අයියාත් ගෙදර සියලු අයිතිවාසිකම් ගෙන උන්හ.

"සුදූ බේබී.."

උක්කු අම්මා මගේ යහන ළඟට ඇවිත් බලා උන්නාය.

"උක්කු අම්මා..."

"සුදූ බේබී... මුළු ගෙදරම පාළු වුණා... ඒක ඇත්ත... ඒත් බේබී ටිකක් ඇහැ කන ඇරලා වැඩ නොකළොත් බේබිට නරකක් වෙයි... මට පේන්නේ අර අකී මහත්තයාගෙ කට්ටිය මෙහේ බින්න බහින්න වගේ කල්පනාව...."

කිසි දෙයක් කියන්න කරන්න හිතක් හෝ ධෛර්යයක් මට වූයේ නැත.

"ඒ ගොල්ලො ඕනෑ දෙයක් කර ගන්නාවෙ උක්කු අම්මා..."

උක්කු අම්මා ඉන් එහා කිසින් නොකීවාය. තාත්තාගේ මරණයෙන් පසුව සති දෙකක් පමණ ගෙවිණි. ඒ සති දෙක ඇතුළතදී නැන්දා හා මාමා ඇවිත් හොරණ ගෙදර පදිංචි වූහ. මම කිසිවක්ම නොකීවෙමි. අකී අයියාත් ඕනෑ එපා හැම දෙයම සොයා බලන්න

වෙහෙසුණේය. තාත්තාගේ හත් දවසේ දානයෙන් පසුව මම දුහැන්යාව හෝ නිමසරව නොදුකිමි.

"උක්කු අම්මා..."

උක්කු අම්මා කුස්සියේ උයමින් උන්නාය.

"බේබි..."

"මං මේ කල්පනා කළේ පිළියන්දල ගෙදරට යන්න..."

උක්කු අම්මා බලා උන්නේ සැකයෙනි.

"නැන්දලා මෙහෙ හිටපුවාවෙ... මායි උක්කු අම්මයි යමු.."

මම කීවෙමි.

"මෙහේ වතුවල ආදායම... ඕවත් බලන්න එපායැ..."

"ඒවා මාමා බලා ගනී..."

"එහෙනම් බේබිම කියන්න..."

උක්කු අම්මා කීවාය. මම සාලයට ගියෙමි. තාත්තා නැතිව මා අසරණ වී ඇතැයි මට සිතිණි. මා ගියේ නැන්දා හමුවන්න උනත් නිමසර හා දුහැන්යා ඒ වෙලාවේම ගෙට ගොඩ විය.

"වාහනයක් නතර වෙද්දි මං හිතුවෙ අපේ අකී කියලා..."

නැන්දා කීවාය.

"එන්න දුහැන්යා.."

මම කීවෙමි. දුහැන්යාත් නිමසරත් සාලයේ සෙටියේ හිඳ ගත්තේය. නැන්දා මා ළඟින් හිඳ ගත්තාය.

"ඔය ළමයි දෙන්නා කසාද බඳින්නලු ඉන්නෙ නේද..?"

නැන්දා ඇසුවාය.

"ඔව්..."

දුහැන්යා කීවාය.

"ඒක හොඳා..."





"ඒක නෙමෙ ශෝබා... මං මේ ආවෙ ටික දවසකට ඔයාව අපේ ගෙදර එක්ක යන්න.. ඔන්න බෑ කියන්න බෑ..."

එහෙම වෙනසක් මටත් උවමනා වී තිබිණි.

"ඒක නම් හොඳයි..."

මට කියවිණි. නැන්දා මුහුණ අකුලා ගත්තාය.

"අකී පුතාගෙන් අහන්න ළමයො... නැත්නම් පරල වෙයි..."

නැන්දා කීවාය.

"ඒ මොකටද..? අකී අයියා මගෙ බාර කාරයද..? උක්කු අම්මා මගෙ යාළුවන්ට බොන්න මොනා හරි ලෑස්ති කරන්න..."

මම කීවෙමි. දුහැන්යා හිනාහුණාය. නිමසරගේ මුහුණේ සතුටක් තිබිණි.

"එහෙනම් ඔයා ලෑස්ති වෙන්න.."

දුහැන්යා කීවාය. මම හිනැහී සාලයෙන් පිටවී කාමරයට ගියෙමි. පාට ඇඳුම් කිසිවක් නොගෙන සුදට හුරු ගවොම් කිපයක් තෝරා ගෙන මම එය බෑගයක අසුරා ගත්තෙමි. දණිස තරම් වූ සුදු පාට ගවොම හැඳ, දිග කොණ්ඩය කරළකට ගෙතිමි. මා සාලයට එද්දී දුහැන්යා කේක් කෑල්ලක් කමින් උන්නාය.

"රෙඩිද...?"

මම හිස සැලුවෙමි.

"උක්කු අම්මා මං ටික දවසක් දුහැන්යාගෙ ගෙදර යනවා..."

උක්කු අම්මා දුකින් හිස සැලුවාය. තාත්තා උන්නා නම් මා මෙහෙම අයාලේ නොයනවා ඇතැයි ඈ සිතනවා ඇත.

"යන්නම් නැන්දා..."

මම කීවෙමි.

"එඩ්‍රස් එකවත් දෙන්න... ෆෝන් නම්බර් එකත් එක්ක... අකී යකා වෙයි... අනේ මංදා ළමයො..."

නැන්දා කීවාය. මම වාහනයට නගිද්දී දුහැන්යා නැන්දාට ලිපිනය දුන්නාය. නිම්සර මගේ බෑගය පිටුපස අසුනේ තැබුවේය. ඒ ඇස්වල වූයේ අනුපමේය වූ ආදරයයි. ඔහු කාරයේ දොර හැරියේ මගේ අත තදට අල්වමිනි.

"මං ඉන්නවනෙ..."

ඔහු කීවේය. මම රියට නැග්ගෙමි. දුහැන්යාත් නිම්සරත් ඉදිරි අසුන්වල හිඳ ගත්හ. රිය ඉදිරියට ඇදිණි.

"හෙට මායි නිම්සරයි තව අපේ යාළුවො සෙට් එකකුයි නුවරඑළි යනවා... ඒකයි... ඔයාවත් එක්ක ආවෙ..."

දුහැන්යා මගදී කීවාය. මම මුදු සිනා පෑවෙමි.

"අපි ශෝබාට ශානුව යාළු කරල දෙමු.... දෙන්න නියමෙට මැච් වෙනවා නේද...?"

"විකාර නැතුව ඉන්න දුහැන්යා..."

නිම්සර කීවේය.

"මං කිව්වෙ කෙල්ලගෙ දුක යන්නත් එක්ක..."

"තමන්ගෙ අම්මටයි තාත්තටයි දෙන්නටම ශෝබාට හිටියෙ තාත්තා... ඒ දුක නැති කරන්න පුළුවන්ද කොහේවත් ඉන්න කොල්ලෙකුට..."

නිම්සර පොතක් කියවන්නා වාගේ මා කියවීය. ඔහුට එතරම්ම මා හඳුනා ගන්න හැකි වීම මට සතුටක් සැනසීමක් විය. දුහැන්යාගේ නිවස විශාල එකකි. ඉහල මාල තුනකින් යුක්ත එය නියම ව්‍යාපාරික නිවසකැයි මට සිතිණි.

"එන්න... බහින්න..."

දුහැන්යා ඉදිරියෙනුත් මා ඇයට පිටුපසිනුත් නිම්සර අපට පිටුපසිනුත් ආවේය.

"අම්මා..."

දුහැන්යා කෑගැසුවාය. ඉස්කෝලේ කාලේ වගේම ඇ





දඟකාරය. මැදි වයස් සුදු කාන්තාවක් ආවාය. ඇගේ මුහුණ සිනාවෙන් දිලිසිණි.

"අම්මා මේ තමා මගේ යාළුවා ශෝබා..."

"අනේ ලස්සන සිදේවි ළමයා. එන්න දුව..."

දුහැන්යාගේ මව මේධාංගනී වූවාය. පියා විමල් අතුකෝරළය. ඔහු ව්‍යාපාරිකයෙකි.

"ඔහොම බයවෙලා ඉන්න ඕනැ නෑ ශෝබා අපේ ගෙදර හරියට කුරුල්ලෙක් වගේ ඉන්න පුළුවන්..."

දුහැන්යා කීවාය.

"ඒ වයසෙ හැමෝම ඔයා වගේ දඟයෑ..."

මේධාංගනී ඇන්ටි කීවාය. මම හිඳ ගත්තෙමි. නිම්සරත් මා ළඟින් හිඳ ගත්තේය. මා වේදනාවෙන් බව හැඟුණු නිසාදෝ ඔහු ඇස් වලින් මට මොනවාද කීවේය.

"අපටත් දුකයි දූගෙ තාත්තා ගැන..."

මම මෘදු සිනා පෑවෙමි.

"හෙට මේ ට්‍රිප් එකක් ලෑස්ති කරන්.. අනේ මංදා... ශෝබා කොහොමද මේ වගේ නැට්ටුක්කාරියෙක් යාළුව කර ගත්තෙ..?"

මේධාංගනී ඇන්ටි කීවාය. මම සිනාවීමි.

"එන්න ශෝබා.., අපේ අම්මට පිස්සු..."

ඈ මුළු ගේම මට පෙන්නුවාය.

"ලස්සනයි..."

මම කීවෙමි.

"ඔය ලස්සනයි කිව්වට ආස නෑ. ඔයා ඉතින් වාම් ඒවටනෙ ආස..."

දුහැන්යා මා තේරුම් ගෙනය. නිම්සර අපූරු බැල්මක් හෙළුවේය.

"මාත් යන්න ඕනෑ..."

"එහෙනම් නිම... ඔයා හවස අපේ ගෙදර එන්න... හෙට උදේ මෙහේ ඉඳන්ම යං... අරෝෂ්ල වෑන් එක අරන් මෙහෙටම එයි..."

"මං යන්නම් ආන්ටි..."

නිමසර යන්න ගියේය. දූහැන්යා මට කාමරයක් පිළියෙල කළාය.

"මේක ඔයාට... එහා රූම් එකේ මං..."

මම හිනැහුණෙමි.

"හැම එකටම හිනා වෙනවා. මුකුත් කියනවකො..."

දූහැන්යා කීවාය.

"හොඳයි..."

"යං එළියට...."

දූහැන්යා හොඳ මිතුරියකි. මා ඇයට වංචාවක් කරනවා නොවේදැයි සිතිණි. නිමසර හදවතේ මහා ඉඩක් අරගෙනය. ඔහු නැතිව ජීවත් වන්නට බැරි තරම්ය. ඒත් ඔහු අයිති දූහැන්යාට නොවේද..?

"ඒක නෙමේ දූන් ඔයා කැම්පස් යනවද..?"

"ඔව්..."

"ඒක හොඳයි වෙනසකටත් එක්ක... මායි නිමසරයි ඉක්මනට මැරි කරනවා... කොල්ලො විශ්වාස කරන්නත් බෑ බං..."

මම හිස පහත් කර ගත්තෙමි. නිමසර හැන්දෑවටත් කලින් ආවේය.

"වෙනද එන්න කිව්වම ගෙන්න ගන්න බෑ. අද බලන්නකො අම්මී... වේලාසනම..."

දූහැන්යා කීවාය.





"ඔයාව නම් නෙමේ නිමසරට ගැළපෙන්නෙ ශෝබාව තමයි..."

මේධාංගනී ඇන්ටි කීවේ පුදුම කතාවකි. නිමසර මගේ දෙස බැලුවේය.

"මරනව මං ශෝබාව..."

දූහැන්යා කීවාය.

"ශෝබාව නෙමේ නිමසරව මරන්න..."

මේධාංගනී ඇන්ටිත් නිමසරත් දූහැන්යාත් මිතුරන් වාගේ හැසුරුණාහ. මට තාත්තා සිහිවිණි. ඔහු අකාලේ මිය ගියා නොවේද..?

"බලන්නකො නිම... ශෝබා පන්සලකට යන්න වගේ සුදු ඇඳුම් දෙක තුනක් අරන් ඇවිත්..."

"ඔයා ශෝබාට ට්‍රිප් එකක් යන බව කිව්වද..? නැතෙ..."

නිමසර ඇසුවේය.

"මට වඩා ශෝබාගෙ ඇඟ. මගෙ ඇඳුම් අඳින්නත් බෑ... මං දූන් වොෂ් එකක් දාගන්නත් ඕන... ඔයා ශෝබා එක්ක ගිහින් එයාට ඇඳුම් ටිකක් ගන්නවද...?"

දූහැන්යා ඇසුවාය.

"දූක්කද පුතා කපටි කෙල්ල... එයා ගියොත් එයාගෙ සාක්කුව හිස් වෙන නිසා පුතාව මේකට පටලනවා...."

"එයාගෙන් ගියාම මොකද මගෙන් ගියාම මොකද...?"

"යමු...."

නිමසර මට කීවේය. මම ඉස්සර වීමි. නිමසර කාරයේ දොර හැරියේය. මම ඉදිරි අසුනේ හිඳ ගත්තෙමි. බොහෝ දුර ඔහු හෝ මා කතා කළේ නැත. නිමසර මගේ අත් දෙක තදින් අල්වා ගත්තේය.

"ශෝබා..."

මම කතා නොකළෙමි. හදවත බොහෝ වේදනාවට පත් වී තිබිණි. එයට හේතු කියන්න මම නොදන උන්නෙමි. වාහනය

නතර කළ නිම්සර මා තුරුළු කර ගත්තේය. මම ඔහුගේ පපුවට හිස තබාගෙන හැඬුවෙමි.

"මගෙ තාත්තා..."

මට කියවිණි.

"මං ඉන්නවනෙ... ඔයා දුක් නොවී ඉන්න ශෝබා... මං කවදාවත් ඔයාව අතාරින්නෙ නෑ.."

"ඒත් දුහැන්යා..."

"දැන් ඒවා ගැන හිතන්න එපා.. මං කවදාවත් දුහැන්යාට ආදරේ කළේ නෑ... ඒක දුහැන්යා තේරුම් ගනී..."

මම තවත් කතා නොකළෙමි. නිම්සර ආයෙ රිය පණ ගැන්නුවේය.

"මට සුදූ විතරයි අඳින්න පුළුවන්... මගෙ තාත්තා වෙනුවෙන් මං එහෙම කරන්නෙ.."

මම කීවෙමි. නිම්සර මට සුදට හුරු ඇඳුම් කීපයක්ම ගත්තේය. ඔහු හැම කඩයකටම ගියේ මගේ අත අල්වාගෙනය. ඇත්තටම මට තනිකමක් නොදැනිණි. ඔහු ළඟින් ඉන්නවා නම් මුළු ජීවිතයම සම්පූර්ණ නොවේද...?

"මොනව හරි කියන්න.."

නිම්සර වාහනයට නැග කීවේය.

"තනියම ඉද්දි පාළුයි.."

"මං ඔයාව තනි කරන්නෑ..."

"ඔයා කැම්පස් යන්න එපා..."

"ඒත් නිම.. සර..."

"මට නිම කියන්න..."

මට සිනා නැගිණි.

"ඇති යන්නම හිතාවුණා... ඔයා හිනා වෙද්දි ශෝක්..."





නිම්සර මගේ ඔඩොක්කුවට හිස තබාගෙන මගේ මුහුණ බැලුවේය.

"මං ඔයාට හුඟක් ආදරෙයි ශෝබා..."

එය මම දැන උන්නෙමි. ඒත් ඔහුට මට ආදරය කරන්න ඉඩ ලැබේවිද..?

"තව එකක්... දැන් අකීල හොරණ නතර වෙලාද..?"

"හ්ම්..."

"ඔයා... පිළියන්දල එනවා නේද..?"

"ඔව්..."

"එන්න... මං හැමදාම ඔයා බලන්න එන්නම්..."

මම හෙමින් නිම්සරගේ හිසකේ අතගෑමෙමි. ඔහු දෑස පියාවාගෙන උන්නේය. ඔහු එහෙම ඉද්දි ලස්සනය.

"ශෝබා... ඉස්සර කැත කෙල්ල..."

නිම්සර කීවේය.

"දැනුත් කැතයි..."

මම හිනැහුණෙමි.

"හා... ඉස්සර ඔයා විහින් කැත වුණා... දැන් ඔයා දුහැන්යාට වඩා හැඩයි ලස්සනයි..."

"ඔයා ආදරේ මගෙ ලස්සනටද..?"

නිම්සර ඇස් හැර හිනා විණි.

"මං ඔයාට මුලින්ම ආදරේ කළේ ඔයා උකුණෝ පෙරන් ඉස්කෝලෙ එද්දි... මතකද...?"

මට ලැජ්ජා හිතුණේ නැත.

"උක්කු අම්මා තමා සේරම කළේ..."

"ඒ උනාට ඒ කාලෙ ඔයා බබෙක් වගේ මං ආසයි... හරි

ශෝක්..."

"අපි යංද..?"

"මට ඔයා එක්ක හුඟක් කතා කරන්න ඕනෑ.."

"පස්සෙ..."

"එහෙනම් මට කිස් එකක් දෙන්න..."

"නිම... සර..."

"ප්ලීස්..."

මම සිනාවී ඔහුගේ එක කම්මුලක් සිප ගත්තෙමි. නිම්සර මගේ හිසට අත තබා මදෙස බලා උන්නේය.

"ඇයි...?"

"මං ඔයාට ආදරේ කරන තරම ඔයා කවදාවත් දැන ගන්න එකක් නෑ... ඒකයි..."

නොවේ එය මම දැන උන්නෙමි. ඔහුගේ ඇස්වල ඒ ආදරය බොහෝ තිබිණි. ඔහු මිසක් මේ ලොව මට වෙන කවුරත් නම් සිටීද..?



# 6

විනෝද චාරිකාවට සහභාගි වූයේ නිම්සරගේ හා දූහැන්යාගේ මිතුරි මිතුරියන්ය. සුඛෝපභෝගී වෑන් රියට අප නැගුණේ හිමිදිරියේය. දූහැන්යා හා නිම්සර එක් අසුනක හිඳ ගත්හ. සැවොම පෙම්වතුන්ය. පෙම්වතුන් නොවුණේ ශනු විතරය.

"ශෝබා තනියෙන් ශනු..."

දූහැන්යා කෑගැසුවාය. ඒ වෙද්දිත් මම ඔහුව නොදක සිටියෙමි. මා ළඟින් හිඳ ගත්තත් මම ඔහුගේ ඩෙනිම් කලිසම මිස ඔහු නොදුටිමි. දූහැන්යා හා නිම්සර අපට ඉදිරි අසුණේය.

"සාධු සාධු ශනුට මේ ට්‍රිප් එක ගිහින් එද්දි හොඳක්ම වේවා..."

පිරිමි ළමයි සිනාසුණහ. දූහැන්යා අප දෙසට හැරුණාය.

"දැක්කද කොල්ලගෙ මූණ.? ෂාරුක් තරම්ම සෙන්සිටිව්.."

මට ඔහු දෙස බැලුණේ ඉබේටමය. ඇත්තටම මා දුටු ලස්සනම කඩවසම්ම තරුණයා ඔහුයි කීම බොරු නොවේ. එතරම්ම ඔහු දෙස බලා සිටිය හැක. ඔහු හිනැහුණේය. මම පෙරලා සිනා නොවී ඉදිරිය බැලිමි. නිම්සර මගේ දෙස බැලුවේ තරහින්ද දුකින්ද නොදනිමි.

"කොහොමද ශෝබා...?"

දූහැන්යාට කට තියාගෙන ඉන්නට බැරිය. වාහනයේ ටික

දුරක් යද්දී ගීත ගයන්න පටන් ගත්හ. අලුත් සිංදු පැරණි සිංදු වේග රිද්ම ගීත ඇසිණි.

"ගායකයව ළඟ තියාගෙන ඉන්නෙ මෙහෙට එවපං දුහැන්යා..."

"බැහැ සඳුන්..."

නිමසර හැරී බලා මදෙසත් බලා කීවේය.

"කියන්නකො..."

දුහැන්යා කීවාය.

"බැහැ..."

"මේ නගරය කියන්න..."

මම ඉදිරියට නැමී නිමසරට කීවෙමි. නිමසර සිනා විණි.

"මේ... නගරය ඔබ මා මුණ ගැසුණු නගරයයි... මේ... නගරය මා ඔබ වෙන් කෙරුණු නගරයයි..."

නිමසර ගැයුවේය. ඇස් දෙක පියවා ගෙන අසා හිඳීමට තරම් ඒ හඬ පපුවට වැටිණි. හුස්මක් හුස්මක් ගානේ ඒ හඬ මට දැනිණි.

"බලපංකො මූ ශෝබා කියපු ගමන් සිංදුව කියපු හැටි..."

"ඒයි දුහැන්යා බලාගෙන..."

පිරිමි ළමයි වදේ ගැසුහ. මම මදහසක් නංවාගෙන උන්නෙමි. නිමසර හැරී බැලුවේය. මම සිනා වී උන්නෙමි.

"ඔයා ශෝබාද...? දුහැන්යා කියනවා..."

ඔහු කතා කළේය. මම පිළිතුරු නොබැන්දෙමි.

"මං මොරටු කැම්පස්... ෆයිනල් ඉයර්..."

"ඇත්තද...?"

"ඔයත් මොරටු කැම්පස් එකට සිලෙක්ට්වුනු නේද...?"

"ඔව්..."





"එහෙනම් දකින්න ලැබෙයි..."

"ඔව්..."

මම වැඩිය කතා බහ නොකළෙමි. වෑන් රිය බෙල්ලන්විල රජ මහා විහාරය ළඟදී නතර විණි. අපි බෝධිය අසලට ගොස් වැන්දෙමු. තාත්තා සිහි වී මගේ දෑසින් කඳුළු කඩා වැටිණි. දුහැන්යා නිමසරගේ අතක පැටලී සිටිනු දක ඒ දුක තවත් වැඩි විය.

"ඇයි කඳුළු..?"

ඔහු මා ඉදිරියේ උන් බවක් මම නොදුටුවෙමි.

"න් නැහැ..."

"තාත්තා නැතිවුණාලු නේ..."

"ඔව්..."

"පව්..."

මම ඔහුගේ මුහුණ බැලුවෙමි.

"ඔයා ධෛර්යවන්තයි..."

ඔහු කීවේය. නිමසර අප ළඟට ආවේ දුහැන්යාගේ අතක බැඳිගෙනමය. මම ඒ පැටලුණු අත් දෙස බලා උන්නෙමි. නිමසර එය දුටුවේය.

"ශෝබා අඬනවා..."

ඔහු කීවේය.

"ඇයි ශෝබා...?"

දුහැන්යා ඇසුවාය.

"නැහැ..."

නිමසර වහා දුහැන්යාගෙන් අත ඉවතට ගත්තේය. ඔහු හා නිමසර කතා කරමින් ඉදිරියට ගියෝය. මම ඒ දෙදෙනා දෙසම බැලුවෙමි. එකම උසය. එකම මහතය. නිමසර කඩවසම්ය. ලස්සනය. ඒත් ඔහුටත් වඩා ආකර්ශනයක් ඔහු ළඟ වේ. ඔහු හරිම

සංවේදිය.

"මොකද බලා ඉන්නේ හිතට ඇල්ලුවද...?"

දුහැන්යා ඇසුවාය.

"ජීවිතේ ආදරේ ඇතිවෙන්නෙ එක සැරයයි.."

මම කීවෙමි. දුහැන්යා අපූරු බැල්මක් හෙළුවාය.

"ඒ ආදරේ ඇතිවෙලාද කියල කියපංකො..."

මම මෑදු සිනා පා දුහැන්යාගේ අත අරගෙන ඉදිරියට ගමන් කළෙමි. ශනු දිගු කාලයක් ගෙන මා වෙතට ආවේය. නිම්සර බලා උන්නේය.

"ආ.... මේක අරන් බෝධිය නාවන්න..."

මම ගත්තෙමි.

"වැඩේ හරි වගේ... මාර සැලකිලිනෙ..."

මම බෝධිය වටා ගොස් පැන් කළයෙන් බෝධිය නැව්වෙමි. නිම්සර ඈතට වී බලා උන්නේය. කළ ප්‍රාර්ථනයක් නැත. තාත්තාගේ මතු ආත්මය සැපවත් වේවායි පැතිමි. මතක නැති අම්මාව සිහි කළෙමි. මා වෙනුවෙන් යමක් ඉල්ලනවා නම් ඒ දුහැන්යාට අසාධාරණයකි. කුහුඹියකුටවත් වරදක් කරන්න දුන් මට බියය.

"මොනවද ප්‍රාර්ථනා කළේ..?"

"තාත්තා ගැන..."

ශනු හිනැහුණේය.

"වෙන..?"

"අම්මා මතක් කළා..."

"වෙන..?"

"මුකුත් නෑ...."

"ඔයා වෙනුවෙන්..."





"මුකුත්ම නෑ... මං කවදාවත් මං වෙනුවෙන් මුකුත්ම ඉල්ලල නෑ..."

ශනු කතා කළේ නැත. අපි ආයේ වාහනයට නැග්ගෙමු. නිම්සරගේ මුහුණ මත ආලෝකයක් වූයේ නැත. ඔහු මදෙස නොබලාම උන්නේය. දුහැන්යා පිටුපසට ගොස් සිංදු කීවාය.

"ශනු ඔතන ඉන්නෙ එනවකො..."

සඳුන් කෑගැසුවේය. ශනුත් නැගිට ගියේය. නිම්සර මගේ ළඟට ඇවිත් හිඳ ගත්තේය. දෙයියනේ දුහැන්යා මොනවා හෝ සිතාවි යැයි මට සිතිණි.

"ඇත්තටම ශනුට හිත ගිහින්ද...?"

නිම්සර ඇසුවේය. ඔහු තරහ ගස්සන්න මට සිතිණි.

"හිත යන තරම් ලස්සනයි..."

මම කීවෙමි. නිම්සර අත් බැඳගෙන උන් නිසා මගේ ඇඟේ ගෑවෙන අතින් මගේ අත් ගොබය රිදෙන්න කෙනිත්තුවේය.

"ඔයාට ඉරිසියයි..."

"ඔව්... මට ඉරිසියයි..."

"එහෙනම් ඔයා දුහැන්යාගෙ අතක එල්ලිලා යද්දි මට හිතෙන්නෙ මොනවද...?"

"ඒ එයා මං නෙමේ..."

"ඔයත් ෂෝක් එකට ගියේ..."

නිම්සරට සිනා නැගිණි. අපේ කතාබහ පිටතට ඇසුණේ නැත. අපි නුවරදී දවල් ආහාර ගත්තෙමු. නිම්සර හැමවෙලාවේම මා ළඟ ගැවසෙන්න උත්සාහ කළේය. මම ශනු මගහැර උන්නෙමි. ඒත් මගහරින්න මගහරින්න ඔහු තවත් මා ළඟට ආවේය.

"ඇත්තටම ඔයාට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවද...?"

ශනු ඇහුවේය. ඒ නුවරඑළියේදීය.

"ඔව..."

මම පිළිතුරක් දුන්නෙමි.

"බොරු... කෝ එයා...?"

"එයා හදවතේ..."

"මං දුහැන්යාගෙන් අහනවා..."

නිමසර ආයේ මට ළං වූයේ හග්ගල මල් වත්තේදීය.

"ශනූ මොනව හරි ඇහුවද...?"

"හ්ම්..."

"දුහැන්යාගෙන් ඇහුවා ඔයාට පිරිමි ළමයෙක් ඉන්නවද කියලා..."

මම කිසිවක් නොකියා නිමසර දෙස බැලුවෙමි. ශනූ හා දුහැන්යා අප ළඟට දිව ආහ.

"බොරු එපා ශෝබා, උඹට බෝයි කෙනෙක් නෑ.."

දුහැන්යා කීවාය.

"ඇයි නැත්තෙ... ඉන්නවා..."

මම කීවෙමි. ශනූ අඳුරු කරගත් මුහුණ පෑවේය. දුහැන්යාගේ මුහුණ වෙනස් විණි.

"කවුද...?"

ඈ ඇසුවාය. මම කතා නොකළෙමි.

"කියපං එයා කවුද..."

"එයා මගේ හදවතේ ඉන්න කෙනෙක්..."

මම කීවෙමි.

"එයාගෙ නම..."

"නම වැඩක් නෑ..."

"ශෝබා ශෝබා...."

"ඇයි අර ළමයට කරදර කරන්නේ...? පිස්සුද දුහැන්යා.."





නිමසර නිසා මම එතනින් මිදුණෙමි. නුවරඑළියේදී අපි ගෙයක් ගත්තෙමු. තද සීතල දුනිණි. සාලයේ පෙම්වත්තු කැකෝ ගසමින් උන්හ. නිමසරත් මමත් ශනූත් හිඳගෙන උන්නෙමු. දුහැන්යා ඇවිත් නිමසරගේ උකුලේ හිඳ ගත්තාය.

"පිකාරද...?"

"සීතලයි හලෝ..."

"දුහැන්යා..."

කියා නිමසර ඈ ඉවතට කර නැගිට යන්න ගියේය. දුහැන්යාත් පිටුපසින් යන්න ගියාය. මමත් ශනූත් ඉතිරි වීමු. සීත ඇඳුම් ඇන්දත් ඒ සීතල මට ඔරොත්තු නොදෙන තරම් විය.

"මට නිමසරව තේරෙන්නෙ නෑ..."

ශනූ කීවේය. මම ඇස් ඔසවා බැලුවෙමි.

"නෑ මං කිව්වෙ ඌ දුහැන්යාට ආදරෙයිද කියල මට හිතෙනවා..."

"ඇයි...?"

මම බියවීමි.

"නිමසරව මං හොඳට අඳුරනවා... ඌ මහ අමුතු එකෙක්... දුහැන්යා පිස්සු කෙල්ලෙක්... මංද මොකක් හරි රැවටීමක් වගේ..."

"ඒ දෙන්නා ආදරේ කළේ ඉස්කෝලෙ කාලෙ ඉඳන්..."

"ආදරේ අඳුනගන්න පහු වෙනවලුනෙ..."

ශනූ කීවේය. රාත්‍රී ආහාරයෙන් පසුව ගැහැනු ළමයි පිරිමි ළමයි තමන්ගේ පෙම්වතුන් එක්ක කාමරවලට ගියහ. නිමසරත් දුහැන්යාත් මමත් ශනූත් වූයෙමු.

"තව කාමර දෙකයි තියෙන්නෙ..."

දුහැන්යා සිනාසුණාය. නිමසර මදෙස බැලුවේය.

"එකක මායි නිමසරයි... අනික ඔය දෙන්නා..."

"පිස්සුද..?"

නිමසර කෑගැසුවේය.

"ඒකනේ..."

ශනුක හිනැහුණේය.

"දුහැන්යා... එකක් ඔයා ඔය හිතන සැහැල්ලුවට මං කැමති නෑ... ඔයාට කොල්ලෙක් ඕනෑ නම් ඔයා ඕනෑ එකෙක් එක්ක කාමරේකට යන්න... ඒත්... හිතෙන හිතෙන කොල්ල එක්ක ශෝබාව කාමරවලට යවන්න දෙන්නෑ මං..."

දුහැන්යාගේ මුහුණ අඳුරු විය. මේ ගැටුම ගැන මම බිය වීමි.

"මං කිව්වේ..."

"තව මුකුත් කියන්න එපා..."

"දුහැන්යාට පිස්සුනෙ නිම්සර... මං සාලෙ ඉන්නම්.... ශෝබා නිදාගන්නාවෙ..."

"එහෙනම් ශෝබා දුහැන්යා එක්ක රූම් එකකට යන්න.. අනිකට මායි ශනුයි යන්නම්.."

නිම්සර කීවේය. දුහැන්යා අඬන්න ඔන්න මෙන්නව උන්නාය. කාමරයට ගියත් ඇ මා එක්ක නොදෙඩුවාය. ඊළඟ උදයේත් සතුටක් නැතිව උන්නාය. අපි නුවරඑළියේ දින තුන හතරක් උන්නෙමු. සතුට අමතකව ගියා වාගේ දුහැන්යා කල්පනාවේ උන්නාය.

"මොකද මේ...?"

මම ඇසීමි.

"නෑ..."

"බොරු. හිත දුකින්.."

මම කීවෙමි.

"ඔව්... ශෝබා... ඇත්තම නම් ඔව්..."

"ඇයි..?"





"එයා මට ආදරේ නෑ..."

"නිමසර...?"

"ඔව්... එයාගෙ හිතේ වෙන කවුරු හරි ඉන්නවා..."

මම තිගැස්සීමි.

"පිස්සුද...? ඔයා බයවෙලා...."

මම කීවෙමි.

"නැහැ... නිම්සරව මං බලෙන් තියන් ඉන්නව වගේ..."

දුහැන්යා තවත් කිසිවක් නොදෙඩුවාය. මම තව කතා නොකළෙමි. නිම්සර හා ශනු අප ළඟට ඇවිත් හිඳ ගත්තෝය. නිම්සර හිඳ ගත්තේ මා ළඟිනි.

"ඔයා ඉඳගන්න ඕනෑ අතන..."

මම කීවෙමි. නිමසර මගේ මුහුණ බැලුවේය. දුහැන්යාත් බැලුවාය. මම එතනින් ඉවත් වූයෙමි. හිත බියගෙන උන්නේය. නිම්සර මා ළඟට ඇවිත් කතා කරද්දිත් මම බිය වීමි.

"ඒයි... ආ..."

නිම්සර මා ළඟට ආවේ, ලුණුමිරිස් ගෑ රොටී අරගෙනය. මම ගත්තෙමි.

"හරිම රසයි..."

"මටත්..."

නිමසර මා බාගෙට කෑ රොටිය කෑවේය. දුහැන්යා දුටුවාය. ඇ මා ළඟට ආවේ රොටී බාගයක් ඉතිරි කරගෙනය.

"ආ..."

එය නිමසරට ඇ අත දිගු කර දුන්නාය.

"මං කෑවා..."

නිමසර කීවේය. දුහැන්යාගේ මුහුණ දුකින් බර විණි.

"කෝ මට දෙන්න..."

මම එය උදුරගෙන කැවෙමි. අපි ලෝකාන්තය බලන්න ද ගියෙමු. නිම්සර පුංචි ලෝකාන්තය කෙළවරටම ගියේය.

"වැටෙයි..."

මට කියවිණි. දුහැන්යා මගේ මුහුණ බැලුවාය. ශනු ද බැලුවේය. මා බියවුණු නිසා එහෙම කියවෙන්න ඇත. දූනුගේ ලැජ්ජාවකි. නිම්සර සිනාවී ආවේය.

"බයයි එහෙනම්... හැබැයි... ඔන්න මං කැමති දේ නොලැබුණොත් මං මේකෙන් නමා පනින්නෙ..."

"මොකක්ද ඔයා කැමති දේ..?"

දුහැන්යා ඇසුවාය.

"ආදරේ..."

"ඔයාගෙ ආදරේ මං..."

දුහැන්යා නිම්සරගෙ ගෙළ බදා ගත්තාය. නිම්සර හෙමින් හෙමිහිට ඉවත් විණි.

"ඇත්තට නම් මං ඔයාට ආදරේ කරන්නෙ නෑ දුහැන්යා..."

නිම්සර කිවේ පුදුම කතාවකි. දුහැන්යා වහා මදෙස බැලුවාය. ශනු පුදුමයට පත් වූයේ නැත. මම තිගැස්සී උන්නෙමි.

"නිම්සර ඔයා. ඔයා..."

"මේ ටික කියන්න මං අවුරුදු ගාණක් තැවුණා... ඇත්තටම මං ඔයාට ආදරේ කරන්නෙ නෑ..."

"ඉස්කෝලෙ කාලෙ ඉඳන් මාත් එක්ක තිබුණු සම්බන්ධෙ.."

දුහැන්යාගේ නෙතින් කඳුළු වැටිණි. නිම්සර මේ මොනවද කළේ..?

"ඔයා මගේ යාළුවෙක් විතරක් උනා... මගෙ ආදරේ ඔයා නෙමේ කියලා මං දැනං හිටියා... ඔයාට කවදාවත්ම එයාගෙ තැන ගන්න බැරි වුණා..."





දුහැන්යා කිසිවක් නොකීවාය.

"මං ඔයාව කසාද බඳින්න පොරොන්දු වුණා... ඒ ගෙදරට බයට..."

දුහැන්යා කතා කළේ නැත.

"මං මේ ගමන එද්දිම හිතුවා ඔයාට ඇත්ත කියන්න ඕන කියලා..."

මම හුස්ම හිරවුණා වාගේ බලා උන්නෙමි. දුහැන්යා දිව ගියාය. දුහැන්යා අප අසලටවත් නොආවාය. නිම්සර තනිව අසුනේ හිඳ උන්නේය.

"මං කිව්වා නේද ඇත්ත..."

ශනු කීවේ මටය.

"ඇත්ත..."

"ඔව් නිම්සර දුහැන්යාට ආදරේ නෑ කියල..."

ශනු මතක් කර දුන්නේය. මම කතා නොකළෙමි.

"දැන් මොනව වෙයිද..? ගෙවල් වලිනුත් දන්නවනෙ.."

"ඒක තමයි..."

"මං දුහැන්යාට කතා කරන්නම්... ඔයා නිම්සරට කතා කරන්න.."

ශනු එහෙම කියා යන්න ගියාය. ඔහු රථයේ පිටුපසට යද්දී මම නිම්සර ළඟින් හිඳ ගත්තෙමි. ඔහු බැලුවේවත් නැත.

"මොනවද කළේ...?"

"කරන්න ඕනෑ දේ..."

"ඒත් නිම්සර..."

"ඒත් මෙත් එපා... මට ඕනෑ දේ කළා..."

"ඊට පස්සෙ..."

"ඒවට මංම මූණ දෙනවා..."

"එතකොට මං කවුද..? මං ඒවට එකතු වෙන්න එපාද..?"

නිම්සර මදෙස බැලුවේය. ඔහුගේ ඇස් රතු වී තිබිණි.

"පුංචි කාලෙ ඉඳන් දුහැන්යා මං ගැන බලාපොරොත්තු තියන් හිටියා..."

"ඒක තමයි මාත් කියන්නෙ..."

"මට ඔයාව ඕනැ.. මං දන්නෙ එච්චරයි..."

"මං නැති උනානම් ඔයා දුහැන්යාව බඳිනවා නේද...?"

"ඔව්... එයා මගෙ හොඳම යාළුවා නිසා..."

නිම්සර කීවේය. මම දිග හුස්මක් පිට කළෙමි.



# 7

නිම්සරගේ දෙනෙත් වල පසුතැවීමක් වූයේ නැත. තමන් කළ දේ වරදක් බව ඒ දෑස් වල කොහේ හෝ ලියවී තිබුණේත් නැත. ඒ දෑස් වල වූ බිය නැති කම දුක බිය හිතුණේ මටය.

"ඇයි නිම්සර... මෙ තරම් ඉක්මන්...?"

මගේ වචන ඉවර කර දමන්නට ඉඩ ලැබුණේ නැත. නිම්සර මුවට ඇඟිල්ල තබා මට කිසිවක් නොකියන්නට යැයි කීවේය. විනෝද චාරිකාව මේ තරම් සිත් රිදවීමකින් අවසන් වේ යැයි මම නොසිතුවෙමි. ඉදිරියට කුමක් වේවිද... දුහැන්යා මේ දේවල් කොහොම දරා ගනීවිද ? කොහොම ඉවසාවිද ? අප දුහැන්යාගේ ගෙදරට එද්දී රාත්‍රිය උදා වී තිබිණි. වාහනයෙන් අවසානටම බැස ගත්තේ මා හා දුහැන්යාත් නිම්සරත්ය. දුටු දෙයින් මම හීතියට පත් වූයෙමි. අප ඉදිරියේ උන්නේ අකී අයියාය. දුහැන්යාත් නිම්සරත් මගේ මුහුණ මාරුවට බැලූහ. මම අකී අයියා ළඟට නොගියෙමි. ඔහු මගේ ළඟට ආවේය.

"නගිනව වාහනේට..."

ඔහුට ඒ තරම් හයියක්.

"ඇයි...?"

මම ඇසුවෙමි.

"ඇයි...? මාමා මලා... තමුසෙ ඒ උණුසුම යන්නත් කලින් රෝන්දෙ ගහනවද...?"

"මෙ අකී අයියා..."

"නගිනවා වාහනේට..."

අකී අයියා කෑගැසුවේය. නිමසර මා ළඟට ආවේය.

"කරදර වෙන්න ඕනැ නෑ... අපි ශෝබාව එක්ක ආවෙ. අපිම එයාව ගෙදර ඇරලන්නං..."

නිමසර කීවේය. අකී අයියා හෙලුවේ නිමසර දවා අළුකරන බැල්මකි.

"මේ මල්ලී.. මං හොඳින් මේ කියන්නෙ... අපේ පවුලේ ප්‍රශ්න වලට මැදිහත් නොවී ඉන්න... ඒක ඇඟට ගුණයි.. ශෝබා නගින්න වාහනේට..."

තවත් මා මෙහි රැඳුණොත් නිමසර හා අකී අයියා රණ්ඩු වකට පැටලෙනු නියතය.

"ඉන්න මං ඇන්ටිට කියලා එන්නම්..."

මම කීවෙමි. දුහැන්යාගේ අම්මා වැඳ මම දුහැන්යාගේ අත අල්වා ගත්තෙමි. දුහැන්යා මගේ අත තද කර ගත්තාය.

"ගිහින් එන්නං..."

මම කීවෙමි. ඈ හිස සැලුවාය. මම නිමසර දෙස බැලුවෙමි. ඔහු ඉවත බලා ගත්තේය.

"ගිහින් එන්නං නිමසර..."

නිමසර බැලුවේවත් නැත. මම ඇඳුම් බෑගයත් ගෙන වාහනයට නැග්ගෙමි. අකී අයියා කිසිම කතා බහක් කළේ නැත. ගෙදර තියා ඔහු ආවේ හොරණටය. නැන්දාත් මාමාත් උක්කු අම්මාත් වාහනය දුක සාලයට ආහ. මම ඇඳුම් බෑගයත් ඔසවාගෙන තරහින් ගෙට ගොඩවීමි.

"ඇයි නැන්දා අකී අයියා මාව හොයන් ආවෙ...?"





මම තරහින් ඇසුවෙමි.

"මං ආවෙ මට ඕනැ නිසා... අම්ම තාත්තගෙන් අහලා නෙමේ..."

"එහෙමද..? එහෙනං මගේ දේවල් වලට ඇඟිලි ගහන්න එපා මීට පස්සෙ, තේරුණාද...?"

මට කියා ගන්නට ලැබුණේ එපමණය. අකී අයියාගේ රළු අත් මගේ කම්මුල මත 'චටාස්' හා අතැරිණි.

"පුතා..."

නැන්දා කෑ ගැසුවාය.

"අනේ දෙයියනේ අතක් උස්සලා හදපු දරුවෙක්ද..?"

උක්කු අම්මා හඬන්න වූවාය. මගේ ඇසින් කඳුළක් වැටුණේ නැත.

"ආයෙ උඹ උඹට ඕනැ විදිහට නෙමේ... මට ඕනැ විදිහට ජීවත් වෙයං. මොකද මමයි උඹව කසාද බඳින්නේ..?"

අකී අයියා කෑගැසුවේය. උක්කු අම්මා මුවට අත තබා ගත්තාය.

"එහෙම වෙයි මං මළොත්..."

මම කීවෙමි. අකී අයියා ආයේ මට ගහන්න පැන්නේය. ඒත් උක්කු අම්මා මා වැළඳ ගත්තාය. ඒ පහර නතර විණි.

"මේ උක්කු අම්මගෙ පඩි ගෙවල ගමට යවන්න තේරුණාද..?"

අකී අයියා කීවේ නැන්දාටය. උක්කු අම්මා බියව බලා උන්නාය. ඉන්පසු අකී අයියා හැසිරුණේ ඔහුට රිසිසේය. තාත්තාගේ සියලු දේපළ ඔහු තමාට උවමනා පරිදි හැසුරුවාලුවේය.

"ශෝබට ෆෝන් එකක් තියෙනවද..?"

අකී අයියා මගෙන් ඇසුවේය.

"නැහැ..."

මම බොරු කීවෙමි. ඉන්පසු මට සිදුවුනේ මගේ ජංගම

දූරකථනය විසන්ධි කොට තබා ගන්නටය.

"අනේ තාත්තා..."

මම තාත්තාට දුක කියමින් හැඬුවෙමි. සතියක් පමණ ගෙවිණි.

"කවුද තමුසෙට මෙහෙට එන්න පර්මිෂන් දුන්නෙ..?"

අකී අයියාගේ හඬය.

"මං ආවෙ ශෝබා මීට් වෙන්න.."

ඒ නිම්සරය. මම යහනින් බිමට පැන්නෙමි.

"ශෝබාව හම්බවෙන්න කාටවත් බෑ.."

"මේ අකී අයියා මං ආවෙ ශෝබා හම්බ වෙන්න.."

"ඉතිං බෑ කිව්වනෙ..."

"ඇයි තමුසෙ එයාගෙ තාත්තද...?"

"නෑ ඩෝ.... මමයි ඒකිව බඳින්න ඉන්නේ.."

කී අකී අයියා නිම්සරව බිම දමාගෙන ගහන්න වූවේය. මම කාමරයේ සිට සාලයට දිව ගියෙමි.

"ඔය ළමයව අතාරිනවා අකී.."

නැන්දා කෑගැසුවාය. උක්කු අම්මා හැඬුවාය. මම බිම වැටුණු නිම්සරව වැළඳ ගත්තෙමි.

"නිමසර..."

ඔහුගේ මුවින් ලේ බිඳු ගලා ගියේය.

"තමුසෙට හොඳක් වෙන්නෑ.."

"එහාට පලයං ශෝබා.."

"බෑ මාවත් මරපං...."

"මරනව තමයි බැල්ලී..."

කී අකී අයියා මට පයින් ගැසුවේය. නැන්දා කෑ ගැසුවාය.





මාමා එතනට නොආවානම් මොනවා වේදැයි හිතා ගත නොහැකි තරම්ය.

"බූරුවෙක්ද.... උඹ..? ආ..."

මාමා අකී අයියා තල්ලු කර දැම්මේය. අකී අයියාගේ සපත්තු පහරට මගේ නළල ඉදිමී තිබිණි. මම නිම්සර නැගිට්ටවා ගත්තෙමි.

"මොනවා හරි කරන්න උක්කු අම්මා..."

"නෑ මට  හොඳයි. මුකුත් නෑ..."

නිම්සර සෙමින් හිඳ ගත්තේය.

"මූට මෙතනින් යන්න කියන්න.."

"එයාව තමයි මං බඳින්න ඉන්නේ... තමුසෙ කොහොමද එයාව එළවන්නේ...?"

මම කෑගසා කීවෙමි.

"අරකිගෙ දත් ටික බඩට යවනවා මං..." .

"පුතා..."

ඒත් මාමා ඉඩ නොදී ඔහු අල්ලා උන්නේය.

"පුතා... නිමසර මෙතන ප්‍රශ්න වැඩි නොකර ඔයා යන්න.."

මාමාත් නැන්දාත් කීහ.

"මං යන්නං... හැබැයි... ශෝබා ඔයත් මේක හොඳට මතක තියා ගන්නවා.... මං ආයෙ එන්නෑ..."

නිමසර යන්න ගියේය. මම හඬමින් කාමරයට දිව ගියෙමි. උක්කු අම්මා මගේ ඉදිමුණු නළල තැවුවාය.

"අනේ දෙයියනේ, මේ ගෙදර මෙහෙම දේවලුත් වෙනවනෙ..."

උක්කු අම්මා හඬයි. ඒත් මගේ ඇස් දෙකට නම් කඳුළක්වත් ආවේ නැත. තාත්තා මේ වගේ නෑදෑයින් ළඟ අප දමා යන්නට ගියේ ඇයි..?෴

"අපි මොකද සුදූ බේබි කරන්නෙ..? පොලිසියටවත් යමුද..?"

"පොලිසිත් උගෙ නමට හරවගෙන ඇති...."

ඇත්තටම මට හිතුණේ එහෙමය. අකී අයියා ඒ තරමම දරුණුය. හොඳින් මිස කිසිවක් තරහින් කර ගන්න ලැබෙන්නේ නැත.

කාමරයට වී නොඉඳ මම මිදුලට බැස්සෙමි. මල් පැළයටකට සාත්තු කළෙමි. ගේ දොර අස් පස් කළෙමි.

"කැම්පස් පටන් ගන්නත් ළඟයි..."

මම අකී අයියාටත් ඇහෙන්න නැන්දාට කීවෙමි.

"ගෑනු ළමයි කැම්පස් යන්න ඕනැ නෑ කියලා අකී අයියා කියන්නේ..."

නැන්දා කීවාය. මම ඇස් ලොකු කර බැලුවෙමි.

"නැන්දා මං හරිම ආසාවෙන් ඉගෙන ගත්තේ. මං අනිවාර්යයෙන්ම කැම්පස් යනවා..."

මම කීවෙමි.

"කැම්පස් යන්නෙ නෑ තේරුණාද..?"

අකී අයියා කීවේය.

"ඒක පුදුම වැඩක්නේ.."

මම තරහින් කීවෙමි.

"පුදුම වෙන්න දෙයක් නෑ... මං ඔයාව ඉක්මනටම කසාද බඳිනවා..."

අකී අයියා කීවේය. මම කාමරයට දිව ගියෙමි. දොර වසා ගත්තෙමි. හැඬුවේ නැත. තරහක් ඇවිලී තිබිණි. මම නිම්සරට දුරකථන ඇමතුමක් ගත්තෙමි.

"හෙලෝ..."

නිම්සර කතා කළේය.





"මේ හොරෙන් ගත්තේ.."

"මොනවද මේ වෙන්නෙ ශෝබා..?"

"මට මෙහෙම ජීවත් වෙන්න බෑ.... මූං මට කැම්පස් යන්න දෙන්නෙත් නෑ... මාව කසාද බඳිනවද...?"

මම හැඬුම් ස්වරයෙන් කීවෙමි.

"අපි මොකද කරන්නේ...? මට ඔයා හම්බ වෙන්න ඕනැ..."

"මං කොහොමද එන්නේ..? මට මේ මොකද වුණේ නිම්සර..?"

මම කීවෙමි. කිසිවෙකුගේ පා ගැටෙන හඬක් ඇසිණි. මම ඉක්මනට දුරකථනය විසන්ධි කොට එය සැඟවීමි. දොර හැරියේ අකී අයියාය. ඔහු කාමරය පුරා බැල්මක් හෙළුවේය.

"කවුද කතා කරනව ඇහුණා.."

"මං තනියම කතා කරනවා..."

මම කෝපයෙන් කීවෙමි.

"තව ටික දවසක් තනියම කතා කරන්න... ඊළඟට මං ඉන්නවනෙ..."

ඔහු කීවේය. මට ඇත්තටම අකී අයියා අප්පිරියා විය. ඔහුට උවමනා වුණේ අප බිය ගන්වාගෙන ඉන්නටය.

"මං කසාද බඳිනකං වත් කැම්පස් යන්නං..."

මම අකී අයියාට කීවෙමි. ඔහු කිසිවක් නොකියා යන්න ගියේය.

"අපි මෙහාට වෙලා ඉඳලා හරි යන්නෙ නෑ අකී. ඔයාවයි ශෝබාවයි එකලසක් කරලා අපි නුවරඑළි යනවා..."

"එක අතකින් ඉක්මනට වෙඩින් එක ගත්තොත් හොඳයි නේද...?"

අකී අයියා ඇසුවේය.

"ඒකනෙ පුතා අපිත් කියන්නෙ... මේව එකල්සක් වෙන්න

එපැයි..."

තැන්දා කීවාය. උක්කු අම්මා මා සොයා ආවේ හොර රහසෙනි.

"ඇහෙනවද කනට...?"

"ඇහෙනව..."

"ඌව නම් කසාද බඳින්න එපා..."

"මං මොනාද උක්කු අම්මා කරන්නෙ...?"

"නිම්සර මහත්තයා මොකද කියන්නේ...?"

"එයා මොනවා කරන්නද..? එයා තාම රස්සාවක්වත් හරියට කරන්නැතේ..."

යතුරු පැදියක් මහ හඬකින් යන හඬ ඇසිණි. එය ආයේ හරවා ගියේය. දෙතුන් වරක්ම යතුරු පැදිය එහෙට මෙහෙට යද්දී අකී අයියා මිදුලට බැස්සේය.

"ඒ ගමන මොකාද...?"

නිම්සරවත් දූයි හිතුණත් මම මිදුල දෙසවත් නොබැලීමි. නිම්සර එක දවසක් හෝ හමුවන්නේ කොහොමද ? මට තේරුණේ නැත. අකී අයියාගේත් මගේත් හඳහන් බැලුවේ තැන්දාය.

"මාස තුනක් යනකං හොඳ නැකතක් නෑ..."

තැන්දා කියනවා ඇසිණි. එය මට මහත් සැනසීමක් විය. ඇත්තටම මම සතුටු වූයෙමි.

"මං මේ කල්පනා කළේ අම්මා මෝට බයික් එකක් හවසට හවසට මේ පාරෙ ඇවිදිනවා..."

"මටත් ඇහෙනවා.."

"බලමු මොකක්ද කියලා..."

සමහර විට නිම්සරද දන්නේත් නැහැ. මම නිම්සරට දුරකථන ඇමතුමක් ගත්තෙමි.





"ඔයා නේද මේ පැත්තේ බයික් එකේ යන්නෙ...?"

මම ඇසුවෙමි.

"ඔයා මාව දැක්කද...?"

"අකී අයියා ඔයාව අල්ලන්න හදනවා. එන්න එපා..."

"මං ඕකව මරනවා..."

"නිම්සර තේරුම් ගන්න..."

"ඇයි මොකද කරන්නෙ...?"

"අපට මොනා කරන්නත් මාස තුනක් තියෙනව... මාස තුනකින් තමයි මගෙයි අකී අයියගෙයි එන්ගේජ්මන්ට් එක ගන්න හදන්නේ..."

මම කීවෙමි.

"ඕව වෙන ඒවා නෙමෙ..."

නිම්සර කීවේය.

"දූහැන්යා කතා කළාද...?"

"නැහැ.... මං අපේ තාත්තා එක්කත් කතා කළා..."

"දූහැන්යට අකමැතියි කිව්ද..?"

"ඔව්..."

"ඉතිං..."

"මුකුත් නෑ.... අකමැති නම් කරන්න එපා කිව්වා..."

"දූහැන්යා පව්...."

"ආදරයක් නැතිව එයාට බොරු ආදරයක් තව පෙන්නුවා නම් ඒක නේද පව්..."

"ඇත්ත. ඒත්..."

"දූහැන්යා මාව අමතක කරයි..."

නිම්සර හිත හදා ගන්න වාගේ කීවේය.

"හැම තිස්සෙම ෆෝන් ඕෆ් කරන් ඉන්නේ.... පුළුවන් වෙලාවට ගන්නං..."

මම කීවෙමි.

"මට ඔයාව බලන්න ඕනෑ.."

"අනේ මංදා නිම්සර ආයෙ එහෙම දවස් ඒවිද..?"

"එනවාමයි..."

නිම්සර කීවේ ස්ථිරවය.

"ඔයත් නැති වුණා නම් මං මැරෙනවා.."

මම ඇත්තටම කීවෙමි.

"මං කවදාවත් නැති වෙන් නෑ.... මෝඩ කතා කියන්න එපා..."

නිම්සර කීවේය.

"අරයා එයි තියන්නං..."

"හ්ම්.... මට ඔයාව බලන්න ඕනෑ..."

"බලමු...."

මම දුරකථනය තැබීමි. අකී අයියා ගෙදරින් නොගොසින් ඉන්නේ මා ප්‍රවේසම් කරන්නටද ? ඒත් ඔහු ගෙදරම උන්නේය. රබර් ඉඩම් ගැන බැලුවේත් මාමාය. අකී අයියා වෙනදා වගේ ඔහුගේ මිතුරු කාණ්ඩ සොයා ගියේත් නැත.

"මිනිහා බයේ ඉන්නේ බේබි පැනලා යයි කියලා..."

උක්කු අම්මා කීවාය.

"මේක හරි වැඩක් වුණානේ උක්කු අම්මා..."

"ඒකනම් එහෙම තමා.... ඒත් ඌව නම් කසාද බඳින්න එපා..."

"අනේ උක්කු අම්මෙ මේ මොනවද වෙන්නෙ..?"





"වෙන දේකට අපි මූණ දෙමු බේබි... මෙ උක්කු අම්මත් ඉන්නවනේ..."

මම නාගන්නට පුංචි ළිඳට ගියෙමි. රතුපාට දිය රෙද්ද හැඳගෙන නෑවෙමි. අකී අයියා මතු වුණේ කොහෙන් දැයි නොදනිමි. ඔහු තොල කට ලෙව කාගෙන බලා උන්නේය.

"ඇයි..?"

මම තරහින් ඇසුවෙමි.

"දූත් කසාද බඳින්නත් හිතෙනවා."

එහෙම කියා අකී අයියා ළිඳ ළඟ පඩිය බැස්සේය. මම පුංචි ළිඳ වටවූ කණ්ඩිය ළඟට වුණෙමි. ඔහු මා වෙතටම ආවේය. ඒ ඇස්වල වුණේ නපුරු පෙනුමකි.

"මේ මොකද...?"

"ඔයා මත්තෙ පිරිමියෙකුට මැරෙන්න පුළුවන්..."

මම බාල්දිය බිමට අතහැර එකනින් පැන දිව්වෙමි.

"සුදූ බේබි සුදූ බේබි..."

උක්කු අම්මා කෑ ගැහුවේ මා ගාල කඩාගෙන දිව යද්දීය.

"ඇයි මේ...?"

මම නතරවීමි. ඇස් වලින් හෝ ගා කඳුළු කැට වැටිණි. මා කියන්නට ගිය දේ පිට වුණේ නැත.

"ඇයි මේ..?"

"අරූ ආවා...."

"අකී...?"

"ඔව්...."

"දෙයියනේ...."

මම කාමරයට ගොස් රෝස පාට ගවොම ඇන්දෙමි. ඊළඟට යහනට වැටී හැඩුවෙමි. අකී අයියා ගෙට ගොඩ වෙන හඬ ඇසිණි.

"අකී ඔහොම ගෙදරටම වෙලා ඉඳලා හරියනවද...?"

නැන්දා ඇසුවාය.

"අපට මොනවයින් අඩුවක්ද...?"

අකී හිනාවිණි. උක්කු අම්මා කෝපයෙන් උන්නේය. මම නිමසරට ආයේ දුරකථන ඇමතුමක් ගත්තෙමි.

"ශෝබා..."

" අරූ මං නාන තැනටත් ආවා..."

"අකී..."

"ඔව් නිමසර..."

"තව දවස් දෙක තුනක් ඉන්න.... මං මොනව හරි කරන්නං.."

නිමසර කීවේය.

"මෙකා මට ඉන්න දෙයිද...? හරි අමුතුයි නිමසර..."

"ප්‍රවේසමෙන් ඉන්න. මං මොනවම හරි කරනවා. ඔයා මා එක්ක එනවද...?"

නිමසර ඇසුවේය.

"ඔව්...."

මම පිළිතුරු දුන්නෙමි. නිමසරට හිනා ආවේය.

"ඇයි...?"

"නෑ ඔයා හොඳයි...."

"මං ඔයාට ආදරෙයි..."

"ඒක මං දන්නවා ශෝබා..."

"මට ඔයා වෙනුවෙන් ඕනෑ දෙයක් කරන්න පුළුවන්..."

"මටත් එහෙමයි... ඔයාව මං ඔය අගාධෙන් ගොඩ ගන්නවාමයි..."

නිමසර කීවේය. මගේ ඇසට කඳුළක් නැගිණි. නිමසර වාගේ





පෙම් කරනා කෙනෙකු මුණ ගැසුණේ මගේ වාසනාවකටය. එය මම ඇදහිමි. කකුළුවා නටන්නේ වතුර රත්වී නටන තුරු පමණ වාගේ අකී අයියාගේත් ඔය දඟලීම ළඟදීම නැතිවී යනු ඇත.

"මට ඔයාව ඕන..."

නිමසර කීවේය.

"මටත්...."

"නාඩා ඉන්න..."

"ඔයත්..."

අපි එහෙම කියා දෙදෙනාම හැඬුවෙමු. දෙවියනි, මෙහෙම ජීවිතයක් ලැබුණේ ඇයි...?

# 8

අකී අයියා මා විවාහ කර ගන්න සියලු කටයුතු සූදානම් කර ඉවරය. නිම්සර එනතුරු මම බලා උන්නෙමි. ඔහුගේ ජංගම දුරකථනය වැඩ කළේ නැත. මෙහෙම වන්නේ ඇයි.? කළ යුතු දෙයක් සිහි නොවේ. මා දන්නේ අකී අයියාගේ මනමාලිය වන්න මට බැරි බව විතරය. මම රැය නොබලා කාටත් රහසේ ගෙයින් එළි බැස්සෙමි. පපුව සෙලවේ. ඇස් වලින් කඳුළු වැටේ. මට ශානු අයියා සිහි විණි. මම ඔහුට කතා කළෙමි.

"ඇයි නංගී ප්‍රශ්නයක්ද...?"

"අයියා මං පාරෙ.... ඔයා ඉක්මනට එනවද...?"

"මට තැන කියන්න මං එන්නම්..."

මම ශානු අයියට මා ඉන්නා තැන කීවෙමි. ඊළඟට කළේ හඬමින් බෑගය ද තුරුළු කර ගැනීමය. පැයකට වැඩි කාලයක් ගෙවිනි. ශානු අයියා ආවේ සුදු පාට වෑන් රථයකිනි.

"නගින්න..."

මම තුරුළු කරගත් ඇඳුම් බෑගයත් එක්ක වාහනයට නැංගෙමි. වාහනයට නැඟි මදෙස ශානු අයියා බැලුවේ වේදනාවෙනි.

"එයාගෙ ෆෝන් එක වැඩ කරන්නෑ අයියා..."

"එයා..."





"නිම්සර..."

"අපි බලමු...."

ශානු අයියා කීවේය. ඔහු මා එක්ක ගියේ ඔහුගේ ගෙදරය. මා දුටු ඔහුගේ දෙමාපියෝ පළමුව කලබල වූහ.

"කලබල වෙන්න එපා මේ මං යාළු ගෑනු ළමයා නෙවේ... මගෙ යාළුවෙක් විතරයි..."

ශානු අයියා ඔහුගේ දෙමාපියන්ට කීවේය.

"මගෙ තාත්තා මැරුණා. මාව නැන්දා බලෙන් කසාද බන්දන්න හදනවා. එයාගෙ පුතාට... එයා නරක මනුස්සයෙක්.... තාත්තවත් කැමති වෙලා හිටියෙ නෑ..."

මම විස්තර කළෙමි.

"මේ ළමයට කන්න දීලා නිදා ගන්න දෙන්න..."

ශානු අයියා ගේ තාත්තා කීවේය. කෑම නොවේ මට උවමනා වුනේ නින්දය. මම නිදා ගත්තෙමි. ශානු අයියා කෙතරම් උත්සාහ කළත් නිම්සර හමුවුණේ නැත.

"මං නිම්සරගෙ ගෙදර යනවා... කලබල නොවී ඉන්න..."

ශානු අයියා මට කීවේය. මම බලා උන්නෙමි. ශානු අයියා ආවේ තනිවමය. ඒ මුහුණේ සොවක් තිබිණි.

"ඇයි අයියා...?"

"නිම්සර රට ගිහින්..."

"නිම්සර..."

"ඔව්...: දුහැන්යාත් එක්ක..."

පපුව හිරවිණි. හුස්ම ගන්න බැරි තරම් විණි. මම හඬමින් කාමරයට දිව ආයෙමි. කෙතරම් හැඬුවත් දුක අඩුවක් වූයේ නැත.

"දූන් හිත හදාගන්න ළමයො... ඉගෙන ගෙන තැනකට එන්න.."

ශානු අයියාගේ අම්මා ආරති කිව්වාය. මම කඳුළු ඇස් වලින් නතර කර යහනින් නැඟ උන්නෙමි.

"ඔව් ඔයා ඉගෙන ගන්න නංගී... අපි ඉන්නවානෙ..."

ශානු අයියා කීවේය. මම මහා දුර ජීවිතයක් ගැන හීන නොඇහිඳ උන්නෙමි.



# 9

**හ**ඬා දොඬා හදවත මට්ටු කර ගන්නට මා දූන උන් ශිල්ප මදිය. හෝ ගා හඬන්නට හදන හදවත මෙල්ල කරගන්නට මා උගත් හරඹ මදිය. මේ තරමට ආදරේ හැල්ලු කොට මා දමා යන්නට තරම් ඔහුට හිතක් ආවේ කොහොමද...?

"මට හිතා ගන්නවත් බෑ... මූ මෙහෙම දෙයක් කළේ ඇයි...?"

"එයා ආදරේ කළේ මට නෙමේ දූහැන්යට... ඒකයි ඇත්ත.."

"නැහැ... නංගී.... ඒ ඇත්ත නෙමේ... මෙතන මොකක් හරි උනා... මං හිතන්නේ අකී එයාගෙ කට්ටිය දම්මල මූගෙ ගෙදරට ප්‍රශ්න ඇති කළා... ඒකයි එහෙම තීරණයක් ගන්න වුණේ... අපි බලාගෙන ඉමු..."

ශානු අයියා කීවේය. සරසවි ඇරඹිණි. මමත් ශානු අයියාත් එකට සරසවි ගියෙමු. ඒ ජීවිතය මට ප්‍රිය විය. හැම හුස්මක් ගානේම නිම්සරට ආදරේ කිරීම ගැන පසුතැවිලි නොවී ඉන්නට මට හැකි වුණේ ඉගෙනීම නිසාය. සරසවිය තුළ මට මහා ලොකු සමාගමක් උන්නේ නැත. මා විතරය. නොවේ නම් ශානු අයියා විතරය. ඒ මා සරසවියට ගොස් සයවන මාසයය.

"ශෝබාව හොයන් කොල්ලෙක් ඇවිත් හොඳ හැන්ඩිසම්..."

මගේ දෙපා පණ නැති විය. සිහිවුණේ නිම්සරවය. ඇස්වලට

කඳුළුත් නැගිණි. ඔහුට මා මතක් වී තියේ. මා සොයා ඇවිදින්ය. හදවතේ වූ සියලු දුක්ඛ දෝමනස්සයන් පහ වී ගියේය. දෙපා වලට අලුත් පණක් ඇවිත්ය. සතුට ඇස් වලින් ඇද හැළෙයි.

"ඒයි ශෝබා... කොල්ලා ගැන කිව්ව ගමන් කෙල්ලගෙ මූණ කිරිපාට වුණා නේද...?"

තිමතා සිනා වූවාය. මම ඇයට සිනා අහුරක් දී නිමසර දකින්නට ගියෙමි. ඔහු එක්ක කියන්න කොතෙක් දේ වේද..? ඔහුගෙන් අසන්නට කොතෙක් දේ වේද..? මම කැන්ටීමෙ හැම තැනම බැලුවෙමි. ඔහු නොවේ. සමහර විට පාරට වී ඇත. මම පොත් ටිකත් තුරුළු කරගෙන කරලූ බෑගයත් උරහිසට තද කරගෙන පාරට ආවෙමි. මේ අප ගෙදර යන වේලාව නිසා ශානු අයියා මා සොයනවාත් විය හැක. මම සුදු පාට නවීන පන්නයේ කාරයක් දුටුවෙමි. සිනා ආවේ ඒ නිමසරගේ වන්න ඇත කියාය. මා ළංවෙද්දී කාරයේ දොර හැරිණි. මම එබුණෙමි. දෙපා පණ නැති වී ගියේය. හුස්ම හිරවිණි. ආපසු හැරී දිව යන්න උවමනා උනත් ඊට ඉඩ නොදී අකී අයියා මා කාරයට නංවා ගත්තේය.

"අතාරිනවා මාව..."

මම කෑගැසුවෙමි. ඒත් කාරය වේගයෙන් ඉගිලිනි. මම වාහනයෙන් පනින්න දඟලුවෙමි. ඒත් අකී අයියා මගේ කම්මුලට තද පහර කීපයක්ම ගැහුවේය. මතක තිබුණේ එපමණය. ඊළඟට සිහිය එද්දී මා උන්නේ හොරණ මගේ ගෙදරය. මගේ කාමරයේය. මගේම යහනේය. විශ්වාස කරන්න මගෙ පයට ගෙදර ඇති බල්ලෙකුට වාගේ දම්වැලක් දමා තිබිණි. මට හැඬුණේ එය දුටු විටය.

"උක්කු අම්මා... උක්කු අම්මා..."

කියමින් මම විලාප තැබුවෙමි. ඒත් කාමරයේ දොරවල් හැරුණේ නැත. ඇස්වල කඳුළු ඉවර වී යනතුරු මම හැඬුවෙමි. මගේ ජංගම දුරකථනයත් අකී අයියා ඔහු නමට පවරාගෙන තිබිණි. ශානු අයියා රාත්‍රියේ හොරණ ගෙදරට ඇවිත් අකී අයියා එක්ක රණ්ඩු කරනවා ඇසිණි.





"මං පොලිසි යනවා..."

ශානු අයියා කෑගැසුවේය.

"පොලිසි යන්නේ උඹේ ගෑනි කියලද...?"

අකී අයියාත් නැමුණේ නැත. නිමසර කඩා බිඳ දමා ගිය ජීවිතය ඉතිං තව කුමකට ගොඩ නගා ගන්නදැයි මම සිතුවෙමි. ජීවිතය නීරස වී දැනෙන්නේ ඇයි...? පහුවදා උදයේ මගේ පා මාංචු ගැලවිණි. නැන්දා මා නාන කාමරය වෙත එක්ක ගියාය.

"කලබල නොකර හිටිං දුවේ... දන්නවනෙ අපේ එකාගෙ හැටි... උඹව මරාවි. ගිහිං හොඳ කෙලී වගේ නාගෙන වරෙං..."

මම කාටවත් කරදර නොකර කාමරයට වැදී නෑවෙමි. කාමරයට ආ මට රෝස පාට සාරියක් ඇන්දුවේත් මගේ කොණ්ඩය හැදුවේත් නැන්දාය. මම කතා නොකර උන්නෙමි. මගේ තාත්තාත් නිමසරත් මා අතැර ගියහ. මගේ කියන්න දන් කිසිවෙකුත් නැත. කිසිවෙකුත් නැත. රැකගන්නට දෙයක් නැත්තේ අහිමි වෙන්නට දෙයක් නැති නිසාය.

"බලන්නකො අපේ කෙල්ලගෙ ලස්සන. සුරංගනාවියක් වගේ.."

නැන්දා මා අන්දවා හැඩ බලනා ගමන් කිවාය. ඇස් දෙකින් එකම කඳුළක් වැටුණේ නැත. මගේ ඉරණම ගැන දුකක් දැනුණේ නැත. විවාහ රෙජිස්ට්‍රාර්වරිය ගෙදරට ආවාය. කිරිබත් කැවුම් සුවඳ පැතිරිණි. අකී අයියා කළු කලිසමට සුදු පාට කමිසයක් හැඳ උන්නේය. ඔහුට දුරකථන ඇමතුමක් ආවේ ඒ වෙලාවේය.

"මොනවා... ඉන්න මං විනාඩියෙන් එනවා... මේ දැන් මං එනවා බොස්..."

අකී අයියා කීවේය.

"අම්මා මං පැය බාගෙන් එනවා..."

"පුතා... නැකත් වෙලාව..."

"අම්මා... මං එනවා... ඉක්මනට එනවා..."

අකී අයියා පිටව ගියේය. ඔහුගේ වාහනය පිට වූයේත් කිරිපාට කාරය අපේ මිදුලේ නතර වූයේත් එකම වෙලාවකය.

"ඒ කවුද ඒ...?"

නැන්දා ඇසුවාය. කාරයෙන් බැස්සේ නිමසර හා ශානු අයියාය. මගේ ඇස්වලින් කඳුළු වැටුණේ නැත. නිමසරගේ රුව හිතට සතුටක් හෝ සැනසීමක් වූයේත් නැත. හදවතේ ඊයේ දැනුණු කම්පනය - ඒ රාත්‍රිය පුරා සතකු වාගේ දම්වැලකින් බැඳ බලාපොරොත්තු රහිතව ශූන්‍ය කළ හීන ශෝබා අමුතු සත්වයකු කළා වගේය.

"ශෝබා..."

කී නිමසර පළමුව මා කිටි කිටියේ වැළඳ ගත්තේය. ඊළඟ මොහොතේ මගේ අතින් අල්වා ගත්තේය.

"මේ මොනවද..? මේ අතාරිනවා... අපේ දුව..."

නැන්දාත් මාමාත් කෑ ගැසූහ.

"දුව..."

නිමසර ඒ වචනය කීවේ බොහෝ ඇදය.

"තමුසෙලා වගේ උන් නැන්දා මාමා කියන නමටත් අගෞරවයක්... එන්න ශෝබා..."

නිමසර මා අතින් ඇද්දේය. මාමාත් නැන්දාත් එකම වචනයක් නොකීවෝය.

"නගින්න..."

මම පිටුපස අසුනේ හිඳ ගත්තෙමි. රිය අසුනේ උන්නේ ශානු අයියාය... නිමසර මා ළඟින් හිඳ ගත්තේය.

"කසාද බඳින්න ද හැදුවෙ..?"

නිමසර ඇහුවේ මගේ මුහුණට එබීය. මම කතා නැතිව ඒ නෙත් බැලුවෙමි. පසුව පැලී යන්න හදන්නේ ඒ බැල්මටය. ඒත් මම ඒ බැල්ම මගහැර පාර දෙස බැලුවෙමි.





"කරදර ගොඩක් වුණා... තාත්තා මාව අරන් රට ගියා... ඒත් තාත්තා රවට්ටලයි මං ඊයේ ලංකාවට ආවෙ... ගෙදර නොගිහින් කෙළින්ම ශානුව හම්බවුණ එක හොඳයි කියල හිතෙන්නෙ දැන්... ශානු කිව්වා කැම්පස් එකේදි ඔයාව අරන් ගිහින් කියල... ශානු පිළියන්දල ඔයාගෙ ගෙදරට ගියාම එහේ උක්කු අම්මා හිටියලු... එයා තමයි කියලා තියෙන්නෙ ඔයාව අද කසාද බන්දනවා කියල හොරණ ගෙදර ඉන්න වැඩකාරි කිව්වලු... අපිත් පොඩි ප්ලෑනක් ගැහුවා... ඌරගෙ මාළු ඌරගෙ ඇඟේ තියලම කපන්න... ඒකයි අපි ඔයාගෙ ගේ ළඟට ඇවිත් අකීට අකීගෙ බොස් විදිහට කෝල් කළේ... දන්නවද අකී ඩ්‍රග්ස් බිස්නස් එකක් කරන්නෙ... ලංකාවෙ ලොකුම මුදලාලි කෙනෙක් එක්ක... මුදලාලිගෙ පුතා ඩ්‍රග්ස් එක්ක අහුවෙලා ඉක්මනට එන්න කියල කෝල් කළේ... ඌ ගියා අපි ආවා..."

නිමසර දිග කතාවක් කෙටියෙන් නිම කළේය.

"ඌ මෙක ලේසියෙන් අතාරින එකක් නෑ නිමසර..."

"ඔව්..."

"මං කියන්නද උඹ ගෙදර යන්නත් එපා..."

"උඹයි ශෝබයි අපේ ගෙදර හිටපන්..."

"ඇයි බං මේක ඌට ගිය රටනෙ එනකොට..."

"ඒ මොනව උනත් අකී දරුණු මිනිහෙක්...."

ශානු අයියා කීවේය. අමිතා අම්මා මා දැක සතුටු කඳුළක් හෙළුවාය. හේමන් තාත්තා ද එහෙමය. ඔවුන් මා නැති එක දවසට මහා දුකකින් උන් බව පෙනිණි.

"දුනුයි මගෙ ඇඟට ලේ ටිකක් ඉනුවෙ කෙල්ලගෙ මූණ දැකල... මේ මනමාලි වගේ ඇඳගෙන..."

අමිතා අම්මා කීවාය. මම මඳ සිනා පෑවෙමි.

"යං යං ගේ ඇතුළට..."

හේමන් තාත්තා ඉස්සර විණි. මා එන්න ආ හැටි ශානු අයියා

කිවේ හිතැහෙමිනි. අකී අයියා එහෙම රැවටෙන මිනිසකු නොවේ. මේ රැවටීම ඔහු ලේසියට අත් හරින්නේද නැති බව මම දැන උන්නෙමි.

"ඌ නිම්සරගෙ ගෙදර යයි... ඒත් ආන්ටි කියයි නිම්සර රට කියලා..."

"එහෙන් දැනගනීද ශානුගෙ ගේ...?"

නිම්සර කීවේය.

"නැහැ... මං ආන්ටිට කෝල් කරල කියන්නං... මාව අඳුනන්නෑ කියන්න කියල...."

ශානු අයියා නිම්සරගේ මවට කතා කළේය. නිම්සර ආ බවත් ඔහු තම නිවසේ බවත් කීවේය.

"දැන් ඉතින් මොනව හරි තියෙන හැටියට කාල ඉන්න..."

අම්තා අම්මා කීවාය. කෑමේ පිරියක් මට වූයේ නැත. මම මගේ කාමරයට ගියෙමි. යහනට වැටුණෙමි. සපත්තු ගැටෙන හඬක් ඇසිණි. ඔය නිම්සරය.

"ශෝබා..."

නිම්සර මා ළඟිනි. මම කොට්ටයේ මුහුණ ඔබාගෙන උන්නෙමි.

"මාත් එක්ක තරහ වෙලාද...? හිතනවද මං ඔයාව අමතක කරල රට ගියා කියල.... හැම අතින්ම අපේ තාත්තා මාව හිර කළා... ඒත් මං පැනලා ආවා.... ඒ ඔයාව බලන්න..."

නිම්සර කීවේය. මට දුක නොදැනේ. අකී අයියාගෙන් මට ගැලවීමක් නැත.

"ශෝබා... මාස ගාණක් ඔයාව දැක්කෙ නෑ... මට කතා කරන්න ඕනෑ..."

"ඊයෙ රෑම ඇහැරලා... මට ඉන්න දෙන්න ටිකක්..."

මම කීවෙමි. නිම්සර තවත් මට කරදර නොකර යන්න ගියේය.





ඔහු යන හඬක් ඇසිණි. මට දුක නොදැනුණා නොවේ. ඔහු මා සොයා ආවේය. මට ඔහු පිළිගන්න යුතුකමක් තිබිණි. ඒත් හදවත ඊට හරස් වී ඉන්නේ ඇයි..? මම කෙටි නින්දකින් ඇහැරී ඇඳ උන් සාරි ගලවා ගවුමක් හැන්දෙමි. ශානුගේ ගෙදරට වාහනයක් ආවේය.

"මළා නිම්සර අම්මා එනවා...."

ශානු අයියා කියනවා ඇසිණි. මම ඉක්මනට කාමරයේ දොර වසා ගත්තෙමි. නිම්සරගේ මව උස් හඬින් කතා කළාය.

"අපිව අමාරුවෙ දාන්න එපා ශානු...."

ඈ කතා කළේ නොරිස්සුමෙනි.

"අපේ ළමයිව අපි මෙහෙම හැදුවෙ නෑ ගෙවල් වලට ගිහින් අනුන්ගෙ ගෑනු ළමයි උස්සගෙන එන්න... නිම්සර එනවා යන්න..."

"අම්මා කිසිදෙයක් නොදැන කියවන්න එපා..."

"එන්න යන්න.... ගෙදර..."

"අම්මා..."

"කතා මුකුත් එපා පුතා.... එනවා යන්න... අරහෙ තාත්තා මට කෝල් කරනවා... ඔයා තාත්තවයි දූහැන්යවයි දෙන්නවම රවට්ටල ලංකාවට ඇවිත්ලු..."

"මං එන්නං අම්මා යන්න..."

"පුතා ඔයා හිතුවක්කාර වෙලා මට කියලා මේ ගෙදර වැඩිහිටි මිනිස්සුන්ට බන්නන්න එපා..."

"හරි යං... යං... මං ගිහින් එන්නං ශානු..."

නිම්සර ඔහුගේ මවත් එක්ක පිටවී ගියේය. පපුවට අලුත් බරක් දැනිණි. නිම්සර එක්ක එක විනාඩියක් කතා කරන්න බැරි වීම ගැන දුකක් දැනිණි. මම දොර හැරගෙන සාලයට ගියෙමි.

"නිම්සර දෙමව්පියන්ට බයෙන් හැඟුණු හොඳ කොල්ලා පව්..."

ශානු අයියා කීවේය.

"ඒක නම් ඇත්ත... අපට උනත් හරියට සලකල කතා කරන්නෙ... ඒකයි ඔය යන්න ගියේ..."

අමිතා අම්මා කීවාය.

"හරි හරි එයා එයි.. දුව කාල ඉන්නකො...".

හේමන් තාත්තා කීවේය. ඔවුන් රිදවන්න බැරිකමට මම බත් කටක් දෙකක් කෑවෙමි.

"මේ තත්ත්වෙ උඩ කැම්පස් යන එක බයයි..."

අමිතා අම්මා කීවාය.

"ඒක නම් ඇත්ත..."

ශානු අයියාත් පිළිගත්තේය. දෙදිනක් යන තුරු නිම්සර ආවේ නැත. ඔහු ආවේ ආයේ මව එක්කය. ඔවුන් එද්දී මම සාලයේ උන්නෙමි.

"මෙයාට මේ මිසිස් අමිතව හම්බ වෙන්න ඕනැම කිව්ව නිසා මං එක්ක ආවා..."

ආගිය තොරතුරු හා වැදගත් නැති තොරතුරු දෙපාර්ශවයෙන්ම කතා බහ කෙරිණි. විවාහය මාතෘකාවට ආවේ ඉන්පසුය.

"අපි නම් ඉතිං නිම්සරට දූහැන්යාව කසාද බන්දවන්න තීරණේ කරල ඉවරයි... වෙන මොනවා හිතේ තිබුණත් වැඩක් නෑ..."

කිසිවකු ඈ කීමට කිසිවක් කීවේ නැත. නිම්සර නැගිට ඇවිත් මා ළඟින් හිඳ ගත්තේය.

"කවුද මේ දුව.. ශානු බඳින්න ඉන්න ගෑනු ළමයා නේද..?"

"ඔව් ආන්ටී..."

ශානු අයියා කීවේය.

"ළඟදී කසාද බඳියි මගෙ හිතේ..."





"ඔව් එහෙම හිතා ඉන්නෙ... අම්මා ඇන්ටිලාට මොනවා හරි බොන්න දෙන්න... ශෝබා..."

ශානු අයියා මට කතා කරගෙනම කාමරයට ගියේය. මම නිම්සර දෙස නොබලාම ශානු අයියා පිටුපසින් ගියෙමි.

"මං මෙහෙට එන්න කිව්වේ නිම්සරත් ආවොත් ඔයාට වචනයක් කතා කරන්න පුළුවන් නිසා..."

ශානු අයියා කීවේය. මම හිස සැලුවෙමි. විනාඩි පහළොවකට පමණ පසුව නිම්සර මගේ කාමරයට ආවේ දොරත් වසාගෙනය. මම ඒ මුහුණ බලා උන්නෙමි.

"මොකද...?"

නිම්සර ඇසුවේ ඇස් වලිනි. මම කතා නොකළෙමි. නිම්සර මගේ ළඟට ඇවිත් යහනේ හිඳ ගත්තේය.

"අම්මා එයි...."

"නෑ... ආන්ටී එක්ක කයියක්..."

"අකී අයියා එහේ ආවද..?"

"ඔව්.... අම්මා කිව්වා මං ලංකාවෙවත් නෑ... ඕගොල්ලන්ට වැරදිලා කියලා... ශනුගෙ ගෙවල් ඇහුවා... අම්මා දන්නෑ කිව්වා..."

"මට කැම්පස් යන්න විදිහකුත් නෑ..."

"ඔයා කැම්පස් යන්න එපා.... මං ඔයාව මගෙ ළඟට ගන්නවමයි එතකං ඉවසන් ඉන්න..."

"ඔයා ආයෙ රට යනවද...?"

මම ඇසුවෙමි.

"ඔව්... අම්මගෙන් වදේනෙ..."

ඔහුට මා අතැර යන්න පුළුවන යන හැඟීම මට ඇතිවිණි.

"මං ඔයාට ආදරෙයි... මාව බලාගෙන ඉන්න... මං කසාද බඳින්නෙ ඔයාව විතරයි..."

නිම්සර කීවේ මා ඔහුට කුරුළු කර ගනිමිනි. කඳුළක් වැටිණි.

"මට ආයෙ එන්න බැරි වෙයි.... යන්න ඉස්සර එන්න බැරි වුණොත් මුකුත් හිතන්න එපා. මං ඔයාට හුඟක් ආදරෙයි ශෝබා..."

නිම්සර කීවේය. ශානු අයියා කාමරයේ දොරට ගැහුවේය.

"දොර ඇරපං...."

නිම්සර දොර හැරියේය. ශානු අයියා කාමරයට ආවේය.

"ඇන්ටි උඹව ඇහුවා ඒකයි..."

නිම්සර නැගිට ගත්තේය.

"මං ගිහින් එන්නං..."

මම හිස සැලීමි. මොනවා හෝ කියන්න උවමනා උනත් මුව ගොලු වී තිබිණි. දෙදණේ මුහුණ හොවා හඬන්නට තරම් බොළඳ සිතක් ඇති විණි. ඒත් මම නොකළෙමි. නිම්සර ගිය පසු හදවත පාළු විය. සරසවි අධ්‍යාපනය අතරමඟ නතර විණි. මම අම්තා අම්මාට ගෙදර දොර වැඩට උදව් කළෙමි. මිදුල වත්තපිටිය ලස්සන කළෙමි. මා අතින් වගා කෙරුණු බෝග දැක අම්තා අම්මාත් හේමන් තාත්තාත් සතුටු වූහ.

"ඔය වගේ ගෑනු ළමයි තමයි අද රටට ඕනැ..."

"එහෙම කොහෙද නේනෙ.?. බලන්නකො අමුඩයක් වගේ කොට කැල්ලක් ඇඳගෙන රටට සේරම පෙන්න ගෙන ගෑනු ළමයිට ඔන ඇවිද ඇවිද ඉන්න විතරයි..."

හේමන් තාත්තා කීවේය. මේ සියලු දේ දෙස උපේක්ෂාවෙන් බලා උන්නේ ශානු අයියාය. නිම්සර ආමයේ පිටරට ගොස් තිබිණි. ඔහු යන්න පෙර මට දුරකථනයෙන් කතා කළේය.

"මං එනකං ඉන්න ශෝබා... මං ඔයාව කසාද බඳිනවා..."

"පරිස්සමින් යන්න..."

මා කීවේ එපමණය. සමහර විට සමහර අනාගත දේවල් ගැන ලොකු බලාපොරොත්තු තබාගෙන ඉන්නට මා අසමත් වන්නට





ඇත.

"අපේ ඉස්සරහ මිදුලයි පිටිපස්සෙ වත්තයි දැක්කම තේරෙනවා මේ ගෙදර ගෑනු ළමයෙක් ඉන්නවා කියලා..."

හේමන් තාත්තා කියවයි.

"ලකුණු අරයට නේද...?"

ශානු අයියා හිනැහේ. මට ජීවිතය රසවත් වී දැනෙන්. කිසිවක්ම දැන් දුරට හිත හිතා කරදර කරගන්න මා අකමැතිය. ශානු අයියා අවසන් විභාගය ලීවේය. ඔහුට උසස් රැකියාවක් ලැබිණි.

"දැන් ශානු අයියට තියෙන්නෙ හොඳ කෙල්ලෙක් හොයලා කසාද බඳින්න විතරයි..."

මම කීවෙමි.

"ඒක ඇත්ත... ඒත් ඔයා වගේ හොඳ කෙල්ලෙක්..."

ශානු අයියා කීවේය. ගෙදර දුරකථනය නාදවිණි. මම එයට දිව ගියෙමි. එනිසා ඒ කතාව අතරමඟ නතර විණි.

"හෙලෝ..."

"ශෝබා..."

ඒ නිම්සරය. ඔහු රට ගියාට පසුව මට කතා කරන දෙවන වතාවය.

"මොකද හති දාන්නෙ...?"

නිම්සරට දැනිණි.

"නෑ මං දුවං ආවෙ..."

මම කීවෙමි.

"කොහොමද...?"

ඔහු ඇසුවේය.

"වරදක් නෑ... ඇයි අද දැහැන්යා නැද්ද..?"

"නෑ එයාට ටිකක් අසනීප වෙලා..."

"ඉතිං ඔයා එයාව හොඳට බලාගන්න එපෑ...."

මම තරහට කීවෙමි.

"ඉරිසියාව..."

නිම්සර කීවේය.

"වැඩෙමයි..."

"ඕව වැඩක් නෑ... ඔයාට කම්මැලිද..?"

"නැහැ..."

මම නිම්සරට කීවෙමි.

"මට අමතක උනා ශානු ඉන්නෙ. මොකටද කම්මැලි වෙන්නෙ...?"

"පව් කතා කියන්න එපා නිම්සර..."

"සොරි සොරි.."

නිම්සර හිනැහුණේය.

"ඔහේ හොඳද...?"

"වැඩක් නෑ බබෝ. මට නම් මගෙ රට තරම් මුකුත් වටින්නෑ..."

"මෙච්චර බිස්නස් තියෙද්දි ඇයි ඒවා බලා ගන්නෙ නැතුව..."

"මං ඩිග්‍රිය අරන් එන්නං... ඉක්මනට එනවා...."

"හුගක් බලාපොරොත්තු දෙන්න එපා නිම්සර..."

මම කීවෙමි.

"බලාපොරොත්තු දෙන්නේ ඒව මට බරක් නොවන නිසා..."

"කියන එකයි කරන එකයි අතර ලොකු වෙනසක් තියෙනවා...."

"පැහිලනෙ... ඒකනෙ මුකුත් කරන්න බැරි..."





නිම්සර කීවේය. මට හිනා නැගිණි.

"මං මෙහේ වචනවා..."

"මට ශානු කිව්වා... ඒ කියන්නෙ හොඳ ගොවි හාමිනේ කෙනෙක්..."

නිම්සර හිනා විණි. මමත් එයට හවුල් වීමි.

"මට ඔයාට හැමදාම කතා කරන්න බෑ..."

"මං දන්නවා නිම්සර...."

"මං කතා නොකළත් මුකුත් හිතන්න එපා..."

මම "හා" කීවෙමි. නිම්සර බොහෝ වෙලා කතා කළ පසු දුරකථනය විසන්ධි විය.

"මොනවද නිම්සර කියන්නේ...?"

ශානු අයියා මා පිටුපසින් උන් බවත් දැනුණේ නැත.

"මාව කසාද බඳිනවලු..."

"ඌ බොරු කරන එකෙක් නෙමේ ඔයාට ආදරෙයි..."

ශානු අයියා කීවේය. ඒත් කතා කරද්දි ශානු අයියා මට මුහුණ දුන්නේ නැත. ඒ නෙත් බරට බිමට බරවී තිබිණි. මට හේතු තේරුණේ නැත. කුමක් හෝ දෙයක් නිසා ශානු අයියා දුක් විඳිනවා යැයි මට සිතිණි.

# 10

**ව**සර දෙකකට වැඩි කාලයක් ගෙවිණි. ඒ කාලය පුරා සිදුවූ වැදගත් සිදුවීම් නැති තරම්ය. මම අමිතා අම්මාගේ ගෙදර දූව තරමටම ළං වීමත් ඒ ගෙදර සියලු වැඩපල මා අතින් සිදු වීමත් ඇරෙන්න වෙන විශේෂ සිදුවීමක් වූයේ නම් නිම්සර එකම දවසක්වත් මා අමතා කතා නොකිරීමය. හදවතින් වැළපුණා මිසක මම දුකවත් පිටතට නොපෙන්වීමි. මේ කොළඹ වූවාට පර්චස් විස්සකට වැඩි ශානුගේ ගෙදර ගෙවත්තේ මම බෝග වගා කළෙමි.

"කෙල්ලගෙ අත් ගුණේ..."

අමිතා අම්මා කීවේ එහෙමය.

"මට නම් දුක කෙල්ලගෙ ජීවිතේ ගෙවෙනවට... කැම්පස් යන්න පුළුවන්කම තිබිලත් ඒකවත් කර ගන්න බැරි උනානෙ..."

හේමන් තාත්තා දුක් වූයේ මගේ අධ්‍යාපනය කඩා කප්පල් වීම ගැනය. මම ඒ සියලු දේ අභිබවා යමින් කම්පා වූයෙමි.

"මටනම් හිතාගන්න බෑ නිම්සරට මොකද වුණේ කියලා... ආන්ටිලත් හෙමිහිටම රට ගියා... මෙහේ ගේ දොරත් දාලා.."

ශානු අයියා විටෙක කීවේය. ඒ ආරංචි දැන් පරණ ඒවාය. නිම්සරගේ අම්මාත් ගේ දොර දමා ආයේ නොඑන්නට පිටරට ගිය බව ඇසූ දා මම වේදනාවට පත් වූයෙමි.





"නිම්සර මාව අමතක කළා..."

මා සිතුවේ එහෙමය.

"දූ... ශෝබා ඔයාට කෝල් එකක්..."

වසර දෙකකට පසු මට අමතන්නේ කවුද...? ශානු අයියා නම් හැමදාම ගෙදරින් ගියාට පසු මට කතා කරයි. ඒත් ඒ මගේ ජංගම දුරකථනයටය. ගෙදරට කතා කරන්නේ කවුද...?

"ශානු අයියාද...?"

මම සැකයට ඇසුවෙමි.

"නෑ දරුවො..."

මම රිසීවරය කන තබා ගත්තෙමි.

"හෙලෝ..."

එහා ඉම මොහොතකට නිහඬ විය.

"හෙලෝ..."

මම ආයෙම කතා කළෙමි.

"ශෝබා..."

පපුව හෝස් ගෑවේය. හුස්ම ගැනීම මොහොතකට නතර වූවා සේය.

"කතා කරන්න ශෝබා... මං නිම්සර..."

මම ඒත් කතා නොකළෙමි.

"ශෝබා..."

"අවුරුදු දෙකකට පස්සේ..."

මම සිහි කළෙමි.

"ඔව් ශෝබා..."

"ඉතිං..."

හදවත ගැහේ. ඒත් මම එය නොපෙන්වීමි.

"මට සමාවෙන්න ශෝබා... මං ඔයාට මහ වරදක් කළේ.. මට පොරොන්දු ඉෂ්ඨ කරගන්න බැරි වුණා..."

ඔහු කියවූවේය. ඔහුම දුක් වූවේය.

"කොහොමද ජීවිතේ...?"

මම අහන්නට දෙයක් නැති කමට වාගේ ඇසුවෙමි.

"මං දූහැන්යාව කසාද බැන්දා... මට වෙන කරන්න දෙයක් නැතිවුණා..."

ඒ සවන් වලට ඇසුණේ මොනවාද...? මා අතින් රිසිවරය බිම වැටිණි.

"ශෝබා... ශෝබා..."

කියන හඬ ඇසීත් මම එය එහෙමම තබා කාමරයට දිව ගියෙමි. දොර වසා යහනට පැන්නෙමි. හඬා ගන්නටවත් ධෛර්යයක් වූයේ නැත. මේ තරම් ලොකු රැවටීමක මා උන්නේද...? හැම දවසම අලුත් දවසක් සේ සලකා ගෙවා දමන්නට හැකි වුණේ ඔහු ගැන හිතාය. නිම්සර මා විවාහ කර ගනීවි යන බලාපොරොත්තු මතය. ඒත් ඒ සියලු බලාපොරොත්තු ඔහු බිඳ දැමූ අපුරුව. මම කොට්ටය බදාගෙන යහනේ පෙරළී උන්නෙමි. එකම එක කඳුළක් නොසොල්වා උන්නෙමි.

"දූ... ඔයා දවල්ට කෑවෙත් නෑ නේද...?"

අම්තා අම්මා ඇසුවාය. මම දොරවත් නොහැරීමි.

"දූව... දූව...."

"මං ඉන්නවා..."

"මොකද දොර වහන්...?"

"නිදි අම්මා..."

"හා පුතේ... ඇයි අසනීපෙන්ද...?"

මම කතා නොකළෙමි. මේ වෙලාවේ උවමනා වූයේ තනිව ඉන්නටය. තනිව වැළපෙන්නටය. නිම්සර මගේ ජීවත් වීමේ එකම





බලාපොරොත්තුවය.

"ශෝබා... ශෝබා..."

ශානු අයියා වේලාසන ඇවිත් උන්නේය.

"ශෝබා දොර අරින්න...."

"මට තනියම ඉන්න ඕනැ..."

"දොර අරින්න හොඳ ළමයා වගේ..."

මම දොර නොහැරීමි.

"මොකද වුණේ අම්මා...?"

"දන්නෑ පුතා.... උදේ කෝල් එකක් ආවා... ෆෝන් එක තිබුණෙත් බිම... ශෝබා දොර වහන් කාමරේ..."

අම්තා අම්මා කීවාය.

"ශෝබා දොර අරිනවද...? නැත්නම් මං මේක කඩලා දාන්නද...?"

ශානු අයියා බොරුවට දොඩවන්නෙකු නොවේ. ඔහු කියන දේ කරයි. මම යහනින් නැගිට දොර හැරියෙමි.

"මොකද මේ ඇසුත් රතු කරං...?"

"මං ඇඬුවෙ නෑ..."

මම ශානු අයියාට කීවෙමි.

"අඬල නෑ... ඇස් ගින්දර වෙලා... අඬන්න එනකොට දුක යයි.. පපුවෙ තියෙනවට වඩා... ඉස්සර වුණ දේ කියන්න... කවුද කතා කළේ...?"

ඔහු ප්‍රශ්න වැලක් ඇහුවේය. මම ශානු අයියාගේ පපුවට හිස තබා ගත්තෙමි. ඊළඟ නිමේෂයේ මා කළේ වැළහින්නියක් වාගේ හඬන එකය.

"ඇයි ඇයි මේ...?"

"එයා... නිම්සර..."

"නිම්සර.... කතා කළාද...? මොකද කිව්වේ...?"

"එයා කසාද බැඳලා... දූහැන්යාව..."

"මොනවා...? ඌම ඔයාට කිව්වද...?"

"ඔව් ශානු අයියා... එයාට කරන්න දෙයක් තිබුණෙ නැලු..."

මම හඬමින්ම ළඟ වූ පුටුවකට වැටුණෙමි. හඬනවා හැරෙන්න මා වෙන කුමක් කරන්නද..? ශානු අයියා මට මුහුණ නොදී මගෙන් ඉවතට ගියේය. අඩු තරමේ මා අස්වසන්නට වත් ඔහුට තිබිණි. ඒත් ඔහු කිසිවක්ම නොකීවේය. මම ඔහු සොයා ඔහුගේ කාමරයට ගියෙමි. ඔහු යහනේ හිඳගෙන දෙඅත් පටලවාගෙන උන්නේය.

"ශානු අයියේ..."

"එන්න..."

ඔහු මට කාමරට තුළට කතා කළේය. මම කාමරයේ බිත්තියට පිටදී උන්නෙමි.

"නිම්සර දූහැන්යාව කසාද බැන්දා කියලා මට ඇන්ටි කෝල් කරල කිව්ව.... මං කිව්වා නිම්සරට බොහොම ස්තූතියි කරපු දේට කියල කියන්න කියල..."

එහෙනම් ශානු අයියා සියල්ල දැන හිඳය.

"දූන් ගොඩක් කල්ද...?"

"මාස තුනකට වැඩි..."

"එයා එහෙම කළේ ඇයි...?"

"ඔක පෝසත් මිනිස්සුන්ගෙ පුරුද්දනෙ ශෝබා..."

"මගෙ ජීවිතේ තේරුම මොකක්ද දූන්...?"

ශානු අයියා වහා මදෙස බැලුවේය.

"ඔයාවට කාටද වටින්නෙ නොවටින්නෙ කියලා ඔයාමයි තේරුම් ගන්න තිබුණෙ..."

ශානු අයියා කීවේය. මට ඔහු කියන දේවල් තේරුණේ නැත.





එක දිගට දවස් ගාණක් මම නොකා නොබී හඬමින් උන්නෙමි.

"හිත හදාගන්න අමාරු නම් යං පන්සලට... අද පන්සලේ හොඳ බණක් කියනවා..."

අම්තා අම්මා කීවාය.

"යං..."

මම අම්තා අම්මාට කීවෙමි. හිත හදා ගන්නට හිත ගලක ගසා ගන්නට හැකි නම් මම එය ද කරන්නෙමි. හැන්දෑවේ මමත් අම්තා අම්මාත් පන්සල් ගියෙමු.

"තණ්හා පච්චයා උපදානං... සිත දුඩිව බැඳුණේ තණ්හාව නිසා... තණ්හාව කියන්නේ ඇලීමටයි..."

නායක හාමුදුරුවෝ බණ දේශනා කළහ. මම බොහෝ දේවල් උගත්තෙමි. බණ අසන්න ඇවිත් උන්නේ වියපත් කාන්තාවන්ය. ඒත් මේ බණ ඇසිය යුතුව තිබුණේ තරුණ අප යැයි මට සිතිණි. ගෙදර ආවේ ගෙදරින් ගිය ශෝබාට වඩා වෙනස් කෙල්ලකි. යමක් දරා ගන්න හෝ අලුතෙන් ජීවිතේ අරඹන්න දූන් ශෝබාට හැක. නිම්සර ඔහු අතීතය විතරක්ය.

"බණ ඇහුවට පස්සේ දුව සතුටින්. ඒක මූණෙන් පේනවා..."

එය සත්‍යයකි. දුක නැත්තටම නැති වූවා නොවේ. නමුත් දූන් හිත සැහැල්ලුය. හැම හැන්දෑවකම මම අම්තා අම්මා එක්ක පන්සල් ගියෙමි. පෝය දාට සිල් සමාදම් වූයෙමි. ජීවිතයේ ඇත්ත ඇති සැටියෙන් දැන ගන්නට නම් අහිමිවීම, වේදනා, කරදර, ජීවිතය එක්ක අත්වැල් බැඳ ගත යුතුය. මේ සියලු දුක් මම හිසින් හදවතින් පිටුවහල් කළෙමි.

"ශානු අයියත් එන්නකො අපි එක්ක පන්සල් යන්න..."

"අනේ බෑ... මට තියෙන වැඩ ඇති..."

ශානු අයියා කීවේය.

"කිසි හැඟීමක් නැති කෙනෙක්..."

මා සිතා නොවේ. ඒත් මට කියවිණි. එදා හැන්දෑවේ අප පන්සල් යන්න එළියට බහිද්දී ශානු අයියාත් ආවේය.

"මාත් එනවා...."

ශානු අයියා කීවේය. අමිතා අම්මා සිනා වූවාය. ශානු අයියා සංවේදී කෙනෙකුයැයි මට සිතිණි. මේ මුල්ම වතාවට මා ඔහු තේරුම් ගත්තාමද..? නොවේ ශානු අයියා මා ගැන කෙතරම් වද වුණිද..? ඔහු මා දුක් විඳිද්දී මා එක්ක දුක් වූවේය. මා වේදනා විඳිද්දී වේදනා වින්දේය. මගේ තනි නොතනියට උන්නේය.

"සුදු ඇඳන් පන්සල් යද්දී ඔයා හරිම ලස්සනයි ශෝබා..."

ශානු අයියා කීවේ පන්සලේදීය.

"මට හිතාගන්න බෑ..."

ඔහු ඊළඟ වචන කියන්නට ගොස් නතර කර ගත්තේය.

"මගෙ හිත රිදෙන්නෑ දැන් ඕනෑ දෙයක් කියන්න..."

මම කීවෙමි. ඒත් ශානු අයියා නොකීවේය.

"ඔයා කැමතිද මාව කසාද බඳින්න..?"

ශානු අයියාගේ ඊළඟ යෝජනාව මා පුදුම කළේ නැත. ඔහු මා ගැන උනන්දු වන බව මම දැන උන්නෙමි.

"ඔයා කල්පනා කරලා කියන්න.... අකමැති උනත් තරහ නෑ.... ඒත් මං ඔයාට ආදරෙයි..."

ජීවිතේ වෙනසක් මමත් බලාපොරොත්තු වුණෙමි. විවාහ වී පවුලක් වී මගේ සැමියා එනතුරු නොඉවසිල්ලෙන් බලා ඉන්නා යුගයක් ගැන පුංචි කාලෙත් මගේ සිහින විය. නිමසර එක්ක එවන් හීන මා කොතරම් දුටුවාද..? දැන් ඒ සියලු හැඟීම් අවසන්ය. අලුත් නැවුම් ජීවිතයක් ගැන මා සිතිය යුතුව තියේ. ඒ ජීවිතය මා යා යුත්තේ දන හැඳුනුම්කම් ඇති කෙනෙකු සමගිනි. එහෙනම් එයට නියම සුදුස්සා ශානු අයියාය.

"මේ සැරේ අවුරුදු ජයට ගන්න මං හිතුවා..."





අමිතා අම්මා කීවාය. අලුත් අවුරුද්දට කැවුම් කොකිස් විතරක් නොවේ හැම කෑමක්ම අම්මා හැදුවාය. මීට පෙර අවුරුදු වල මෙතරම් ජයට අවුරුදු තිබුණේ නැත. ශානු අයියාත් ගේ දොර අස්පස් කරන්නට මට උදව් කළේය.

"මට නම් බෑ ශෝබා වගේ ලස්සනට අස් කරන්න..."

"පිරිමි දන්නේ ගෙවල් කැත කරන්න විතරයි..."

අමිතා අම්මා කීවාය.

"මං කවදාවත් මගේ ගේ කැත කළාද අම්මා...?"

ශානු අයියා ඇසුවේය. අමිතා අම්මාගේ ඇසට කඳුළක් නැගිණි.

"ඒකනම් ඇත්ත... ශානු පුතා එයාට පුළුවන් විදිහට ගේ දොර ලස්සනට තියාගත්තා..."

අමිතා අම්මා කීවාය. මගේ කොණ්ඩයේ රැඳුණු මකුළු දැලක් ශානු අයියා අතින් ගත්තේය. ඒ ඇස් දෙකට හසු නොවී පලා යන්නට මම හැම වෙලාවේම උත්සාහ දැරුවෙමි. අලුත් අවුරුද්දට කිරි ඉතිරවීමත් කිරිබත සෑදීමත් අමිතා අම්මා කළාය. අපි ඇයට උදව් කළෙමු.

"මේ ඇඳුම ඔයාට..."

ශානු අයියා ගෙනා රෝස පාට සාය හා බ්ලවුසය මම ඇන්දෙමි.

"ලස්සනයි..."

"මගෙ ප්‍රශ්නෙ ලස්සන නැද්ද..?"

ශානු අයියා ඇසුවේය.

"ප්‍රශ්නෙ..?"

"ඔව්... හිතන්න හුගක් කල් දුන්නා..."

මට සිනා නැගිණි.

"ඔයාගෙ අම්මල කැමති නම් මම කැමතියි..."

මම කීවෙමි.

"ශෝබා මේ ඔයාමද...?"

"ඔව්... මං අනාගතේට මූණ දෙන්න ලෑස්තියි..."

මම සිනා වී කීවෙමි. ශානු අයියා මගේ හිසට අත තැබුවේ ආදරයෙනි. මා ශානු අයියාට කැමති වීම ගැන වඩා සතුටු වූයේ ඔහුගේ දෙමාපියන්ය.

"අපි හරී වාසනාවන්තයි... ශෝබා වගේ දූවෙක් ලබන්න..."

ඔවුහු කීවෝය.

"ඔව කල් අරින්න ඕනැ නෑ... පොඩි පාටියක් අරන් එකලාසයක් කරමු..."

"පාටි ඕන නෑ අම්මා.."

මම කීවෙමි.

"ඒකත් ඇත්ත.... ඒත් හොරෙන් බඳිනවා වගේ බඳින්න බැනේ..."

ශානු අයියා කීවේය. විවාහයට දින නියම කෙරුණේ ඉන්පසුය. එය බොහෝ ළඟ දිනයක් විය.

"වෙසක් මාසෙ..."

අමිතා අම්මා කීවාය. ශානු අයියලාට බොහෝ ලොකු නෑදෑ පිරිසක් උන්නේ නැත. එනිසා මඟුල් කියන්න උන්නේ සීමිත පිරිසකි. හෝටලයකදී විවාහ උත්සවය ගන්න කතිකා කර ගත්හ. මේ සියලු දේ ගැන මම උපේක්ෂාවෙන් උන්නෙමි. දුරකථනය හැඬවිණි.

"කවුද බලන්න දූ..."

මම දුරකථනය ගත්තෙමි.

"හෙලෝ..."





"හායි... ස්වීටි... මම දුහැන්යා..."

හදවත කඩා වැටුණා වගේය. ඒත් මට බුදු බණ සිහිවිය.

"කොහොමද..?"

"අපි හෙට උදේ ලංකාවට එනවා..."

"හොඳයි..."

"මොකද නිකං ඇලි මැලි වෙලා... දුකින්ද..? කසාදයක් කරගත්තම හරියනවා... හැබැයි රජෝ අනුන්ගෙ කොල්ලන්ට නම් බැල්ම දාන්න එපා..."

"නෑ මං අනුන්ගෙ කොල්ලන්ට කවදාවත් බැල්ම හෙළුවෙ නෑ දුහැන්යා.... මාත් කසාද බඳිනවා..."

"ඕ ගුඩ් නිව්ස්... කවුද කොල්ලා...?"

"ශානු..."

"මේ අපේ ශානු..."

"ඔව්..."

"ෂෝක්නේ..."

"මං තියන්නං දුහැන්යා...."

මම රිසීවරය තබා සාලයට ආවෙමි.

"කවුද...?"

ශානු අයියා ඇසුවේය.

"දුහැන්යා..."

"මොකද කියන්නේ...?"

"ලංකාවට එනවලු හෙට..."

ශානු අයියා මගේ මුහුණ බැලුවේය.

"ඇයි බය වුණාද...? මං බය වුණේ නෑ... ඉතිං ඇයි ඔයා බයවෙන්නෙ...?"

ශානු අයියා කිසිවක් කිවේ නැත. ඒත් ඒ මුහුණේ සිනා මැකී තිබිණි. ඉන්පසු ශානු අයියා වැඩක් පලක් නොකළ තරමය... මේ තරම් ඔහු ළතවෙන්නේ ඇයි...?

"මම නිම්සර ආවා කියලා වෙනස් වෙන්න තරම් පහත් නෑ ශානු අයියා...."

මම ඇත්තම කීවෙමි. ශානු අයියා මගේ මුහුණ බලා උන්නේය.

"නිම්සර හරි ඉක්මන් තීරණකාරයා..."

ශානු අයියා කීවේය.

"එයාගෙ තීරණ අපට වැඩක් නෑ නේද..?. එයා කසාද බැඳපු කෙනෙක්.."

ශානු අයියා මගේ අත තදින් අල්වා ගත්තේය. ශානු අයියා ගැන මට දුකය. ඔහු ගෙදර ඉන්නවා නම් වැඩිම වේලාවක් කරන්නේ මා දෙස බලා හිඳීමය. ඔහු ගැන මා හිතේ වන්නේ ඇත්තටම ආදරයක් නොවේ. එය ඉක්මවා ගිය භක්තියකි. මා අකී අයියාගෙන් බේරා ගත්තේ ශානු අයියාය. ඔහු මට කෙතරම් පිහිට වූයේද..?

"ඒගොල්ලන්ටත් වෙඩින් එක කියන්න වෙයි...."

ශානු අයියා කීවේය.

"කියන්න ඉතිං.... මොකද බයේද..?"

ශානු අයියා සිනා විණි.

"ඔයා ඔය වැඩ කරන්නේ කේන්තියෙන්.... තරහින්..."

"නැහැ..."

මම එහෙම කියා ශානු අයියාගෙන් ඉවත් වීමි. ශානු අයියා එක්ක විවාහ වෙද්දී නිම්සර ලංකාවට ඒම අහම්බයක් වීද එය එහෙම වීම ගැන මම සතුටු වූයෙමි. එය මට මහා සතුටකි. නිම්සර කළ වංචාව ගැන මා වේදනා නොවිඳි බව ඔහු දැන ගත යුතුය.

"ඔයා කොයි වෙලාවෙවත් ෆෝන් එක ගන්න එපා... මං ගන්නං..."





ශානු අයියා කීවේ පහුවදා උදයේය. නිම්සර ශානුගේ ගෙදරට කතා කළේය.

"ඔව් නිම්සර මං ශෝබාව බඳිනවා... කාඩ්ස් බෙදලත් ඉවරයි.. මං ඔයා ආව කියල දැනගත්තා.... එන්නං..."

ශානු අයියා කීවේය. මඟුල් කියන්නට නිම්සරගේ ගෙදර ගියේ ශානු අයියාගේ අම්මාත් තාත්තාත්ය. ඊට දින දෙක තුනකට පසුව නිම්සරත් දූහැන්යාත් ආහ.

"කෝ අපේ මනමාලි..?"

මා උන්නේ කාමරයේය. දූහැන්යා මා සොයා ආවාය. ඇගේ කොණ්ඩය කොල්ලෙකුගේ වාගේ කොටට කපා රතු පාට කර තිබිණි. කෙටිම කෙටි සායක් හැඳ උන් ඈ මා වැළඳ ගත්තාය.

"අම්මෝ... මේකිගෙ ලස්සන... ඉරිසියාවෙ බෑ..."

මම හිනාවී දූහැන්යාගෙන් ඉවත් වීමි. නිම්සරත් ශානු අයියාත් මගේ දෑස් ඉදිරියේ උන්නෝය. සතුටින් සැපෙන් ඉන්නා බවක් නම් නිම්සරගේ මුහුණේ නොවිණි. ඔහු අඳුරුව ගොසිනි. කෙට්ටු වී ගොසිනි. මහත් අනුකම්පාවක් දැනෙන බැල්මකින් ඔහු බලා උන්නේය. මම ඒ බැල්මට හසු නොවී ඉවත බලා ගත්තෙමි.

"බලන්නකො නිම්සර, කෙල්ල හරිම සතුටින්..."

දූහැන්යා මගේ කම්මුල මිරිකා කීවාය.

"ඇත්තටම මං සතුටින් දූහැන්යා... ශානු වගේ හොඳ මහත්තයෙක් ලැබුණු නිසයි සතුටු..."

මම නිම්සර රිදවනු වස් කීවෙමි.

"ඉතිං කොහොමද... තොරතුරු...?"

"යං ඉඳගන්න දූහැන්යා...."

අපි සාලයට ගියෙමු. නිම්සර කතා කළ දෙයක් නැත. උසුලාගත නොහැකි වේදනාවකින් ඔහු බලා උන්නා විතරය. ඒත් මම නම් හිනාවී කතා කළෙමි. හැම වෙලාවකම ශානුගේ අතකින්

අල්වාගෙන ඔහු ළඟින් ඉන්නට මට උවමනා විය.

"හුඟක් සතුටින් නේද...?"

නිමසර ඇසුවේ මා තනිවන වෙලාවක් බලාය.

"ඔව්..."

මම තනි පිළිතුරක් දුන්නෙමි.

"ඔය සතුටට වඩා මට පේන්නෙ ඔයාගෙ උත්සාහමය තියෙන බොළඳකම විතරයි."

නිමසර කීවේය. දෙපා කඩා වැටෙන්නා වාගේ මට දැනිණි. මම ඔහුගෙන් ඉවත් වී මාගේ කාමරයට ගියෙමි. ආයේ ඔවුන් යන තුරුම සාලයට නොඑන්න සිතා උන්නෙමි.



# 11

රැහැයියන්ගේ දුක්බර හඬින් මීස අවටින් වෙන හා හූවක් නැසුණු තරමය. 'අතීතය මගෙ හදවතේ නැත' කියා දිනපොතේ ලියා තැබුවාට එය කෙතරම් බොරුවක්දැයි සිතිණි. ශාන්තු එක්ක විවාහ වීමට මා ගත් තීරණය නිවැරදි දැයි ආයේ හදවත ප්‍රශ්න කළේය. හේතු නැතිව මම වේදනාවක පැටලී උන්නෙමි. වසර ගණනක් නොදැකි නිමසර දුටු එක් සැනින් මෙලෙස හදවත වේදනා විඳිවී යැයි මා සිතුවෙම්ද..? නොවේ. ඒත් පපුව පැලී යන්නට එයි. විවාහ උත්සවයට දින ළඟය. මුළුතැන් ගෙයින් සාලයේත් උදව්වන අය වැඩ කරන අයගේ හඬ නොනැගුණේ මා දොර වසා උන් නිසාය. මට කිසිවක්ම නෑසිණි. දොරට කීප වරක්ම තට්ටු කරන හඬ ඇසුණේ තවත් පැය භාගයකට විතර පසුය.

"ඔයා නිදිද ශෝබා...?"

ඒ ශාන්තුය. මම නිදි වාගේ උන්නෙමි. එහෙම ඉන්නට හේතු වූවා නොවේ. ඒත් බොහෝ වේදනාවෙන් පෙලෙන හිත ඔහු දුටුවෝතින් යන බිය මට විය. එය මගේ මුහුණින් ඔහු දකිනු ඇත.

"ශෝබාට නින්ද ගිහින්...."

ශාන්තු කා සමඟින් ද කීවේය. ඇත්තට නම් ඒ රාත්‍රිය පුරා මා උන්නේ නොනිදාය. නිමසර සිහි කර කර මා මේ ලබන්නේ සතුටක්ද... දුකක්ද මම නොදන උන්නෙමි. දන් ඔහු දනැන්යාගේය.

දුහැන්යා උන්නේ නිමසරගේ ඇගේ ඇතිල්ලීගෙනය. මම දුක් නොවුණෙම්ද...? ආදරය කළ තරමට වේදනා නොවිඳිනෙමි යැයි කිව හැකිද...?

"ඔයාට ඊයේ වෙලාසන නින්ද ගියා..."

ශානු කීවේ පාන්දර මා තේ බොද්දීය.

"ඔව්.."

"ඒ උනාට මොකද දූවගේ ඇස් ඉදිමිලා රතුවෙලා...? මං හිතන්නෙ සතුටට නින්ද යන්නෑ වගේ..."

අමිතා අම්මා කීවාය. ශානු බැලුවේ අමුතු බැල්මකි. නිමසර ගෙට ඇතුළු වූයේ ඒ වෙලාවේය. ඔහුගේ වාහනය එනවාවත් ඇසුණේ නැත.

"ආ අඩුපාඩුවත් ඇවිත් තියෙන්නෙ..."

හේමන් තාත්තා කීවේ සිනාසෙමිනි. මම වහා ඉවත බලා ගත්තෙමි.

"සොරි බං... කුස්සියටම ආවා..."

නිමසර කීවේය.

"ඒකට මොකද වරෙන් වරෙන්..."

"ආ පුතා තේ එකක් බොන්න. ආ එක හොඳයි නිමසර පුතාත්... මොන තරම් වැඩ තියෙනවද...!"

"ඒකනං ඇත්ත..."

ශානු අයියා කීවේය. නිමසර තේ එක ගත්තේ මගේ මුහුණ දෙස බලමිනි. මම ඉවත බලා ගත්තෙමි. හැකි හැම වෙලාවේම නිමසරගෙන් ඈත් විය යුතුය. ඒ මහා ආදරය - ඇත්තටම අතීතයට හිමි වේදනාත්මක කතාවක් වී ඉවරය. මට කරන්නට තරම් දෙයක් ගේ ඇතුළේ තිබුණේ නැත. මම මිදුලට වීමි. හෙමිහිට සාලය දෙසින් මිදුලට බැස පිටුපස මිදුලට ගියෙමි. හිතන්නට කෙතරම් දේ වේද...? නිමසරගේ විවාහය පිළිගන්නේ කොහොමද..? නොතේරේ.





"ශෝබා..."

නිමසරගේ හඬ ඇසිණි. මම තිගැස්සී බැලුවෙමි. ගහකොළ අතර ඉද්දී පවා හෝ ඔහුව කිසිවෙකුට නොපෙනේ. මම නැඹිලි ගසට මුවා වීමි.

"මගෙන්ද හැංගෙන්නෙ ශෝබා....?"

නිමසර ඇසුවේය. මම කිසිවක්ම නොකීවෙමි. එදා වගේ අදත් හිතුණේ එක සැරයක් නිමසර දෙස බලන්නය. ඒ එක පැත්තකට පීරූ කොණ්ඩය අදත් එලෙස පීරා ඇද්දයි දකින්නය. ඇස් දෙකට කඳුළු ආවේ මගේ බොළඳ සිතිවිලි වලටය. විවාහය යනු ප්‍රේමයට වඩා මහා පවුරකි. ඔහු, ඔහු වටකොට බැඳ ගත්තේ ඒ මහා පවුර නොවේද...?

"ශෝබා..."

නිමසර මගේ ඉදිරියට ආවත් මම ඒ මුහුණ නොබැලුවෙමි.

"ඔයා ශානුව කසාද බඳිනවා... එපා කියන්න අයිතියක් නෑ... ඒත් මං විඳෙනවා..."

ඔහු කීවේය. ඔහු කියන්නේ ආත්මාර්ථකාමී කතාවකි. ඔහුගේ විවාහයෙන් මා විඳවූවේ නැතිද..?

"අපේ අම්මයි ශෝබා සේරම කළේ.... එයා මැරෙන්න ඔන්න මෙන්න හිටියා... මං දුහැන්යාව කසාද නොබැන්දොත් එයාගෙ හුස්ම යයි කිව්වා... මං දුහැන්යාට තේරුම් කළා මං ශෝබාට ආදරේ කරන්නෙ, මේ කසාදෙ තේරුමක් නෑ කියලා... ඒත් අම්මා වෙනුවෙන් ඒ වෙලාවෙ කසාද බැන්දා... ඔයා පිළිගන්නවද මං දුහැන්යාගෙ අතකින්වත් අල්ලලා නෑ.. අල්ලන්නෙත් නෑ... මං ලංකාවට ආවෙත් එයාගෙන් කොහොම හරි අයින් වෙන්න.."

මම ඇස් ඔසවා නිමසර දෙස බැලුවෙමි. දෙවියනි ඔහු මේ කියන්නේ මොනවාද...? මට නිමසර ගැන දුකක් හිතිණි.

"මං කෙල්ලෙකුට කියලා ආදරේ කළා නම් ඒ ඔයාට ශෝබා... ඔයාට විතරයි... තව කාටවත් ආදරේ කරන්න බෑ... ඒ වගේම තමයි වෙන ගෑනියෙකුගෙ හුස්මක්වත් මට එපා... දුහැන්යා ඇඳේ නිදියද්දි

එක්කො මං බිම... නැත්නං වෙන රූම් එකක.... මං මෙහෙම කරන්නේ ඒ කසාදෙ මං පිළිනොගන්නු නිසා... ඒත් ඔයා ශානුව කැමැත්තෙන් බඳිනවා..."

හුස්ම වැටීමත් මට කරදරයක් විය. නිම්සර මගේ අත් දෙකින් අල්වා ගත්තේය.

"මේ කසාදෙ කෙරුණොත් මට මැරෙන්න වෙයි ශෝබා.... දරාගන්න බෑ මට...."

නිම්සර කීවේය.

"මං දුක් වින්දා නිම්සර ඔයා නිසා... මං දුක් විඳිද්දී මට පිහිට වුණේ ශානු අයියා... මාව අර අපායෙන් බේර ගත්තෙත් එයා... එයාගෙ අම්මයි තාත්තයි මට හුගක් ආදරෙයි... මට ඒ අයව රිදවන්න බෑ... මගෙ ජීවිතේටත් වඩා ඒ අයව මට වටිනවා..."

"ඒත් ශෝබා.."

"මට ඒ අයගෙ හිත රිදවන්න බෑ.... මේ කසාදෙ නිසා ඒ අය සතුටින්.... ඒ සතුට නැති කරල දාන්න බෑ..."

මේ තරම් හිතක් පපුවක් නැතිව මා කතා කළේ කොහොමද...? නිම්සරගෙ මුහුණ අඳුරු විණි. වේදනාව යටපත් කරගෙන ඔහු මඳහසත් නැගුවේය.

"මට ඔයා නැතුව බෑ ශෝබා... ඔයා ඒක තේරුම් ගන්න ඕනෑ..."

"ඔයා දූහැන්යාව කසාද බැඳලා ඔයත් ඒක තේරුම් ගන්න ඕනෑ.."

මම කෝපයෙන් කීවෙමි.

"මං එයාගෙන් අයින් වෙනවා සදහටම... ප්‍රොමිස්..."

"මෙහෙමයි... ඔයාට පුළුවන් නම් මං ශානු අයියව බඳින්න ඉස්සරින්දා වෙනකොට දූහැන්යාගෙන් ඩිවෝස් වෙන්න... මං ශානු අයියව කසාද බඳින්නෑ.. එහෙම නැති උනොත් මට කරන්න දෙයක් නෑ..."





මම එහෙම කියා එතැනින් ඉවතට දිව ගියෙමි. නිම්සර එතනම බොහෝ වේලා ඉන්නවා මා දුටුවේ මුළුතැන් ගෙයිදීය. සාමාන්‍ය ලෙස හැසිරෙන්න මොන තරම් උත්සාහ කළත් එය කෙතරම් අමාරුදැයි මට හිතුණේ මොහොතින් මොහොතය. අවසානයේ මම කාමරයට ගොස් යහනේ දිගාවීමි. නිම්සර හා ගත කළ පාසල් කාලය සිහි වී පපුවට මහා බරක් දැනිණි. ඔහු මා වෙනුවෙන් දූහැන්යාව අතහැරියාය. මුළු පන්තියම මා අතහරින කාලයකදී නිම්සර විතරක් මා ළඟින් මා එක්ක හිටියේය. මේවා සිහිවෙද්දී මට හිතුණේ මා නිම්සර වෙනුවෙන් කිසිවක්ම නොකළ බවකි.

"ශෝබා..."

ශානු අයියා කාමරයට ඇවිත්ය.

"මං ඔයාව හෙව්වා..."

"මං කාමරේ හිටියා.."

"ඔව් පස්සෙ මං දැක්කා ඔයා ඇඳේ ඉන්නවා හොඳ නින්දක.."

ශානු අයියා කීවේය. මම හිනාවී යහනේ හිඳ ගත්තෙමි. ශානු අයියාත් මා ළඟින් හිඳ ගත්තේය.

"නිම්සර සෙනෙත් මාමා එක්ක මොනවද ගේන්න ගියා..."

මම හා හ්ම් වත් නොකීවෙමි.

"ශෝබා..."

ශානු අයියා ආයේ කතා කළේය. ඔහු මෙහෙම මා අමතන්නේ හිතේ යමක් කැකෑරෙන විටය. මම ඒ මුහුණ බැලුවෙමි.

"මට ඇත්ත කියන්න නංගී..."

ඔහු කතා කළේ වචන දිගට අදිමිනි.

"මට ඇත්තටම කියන්න ඔයා මාව කසාද බඳින්නෙ කැමැත්තෙන්ද..?"

මම කතා නොකළෙමි.

"ඔයා හිතනව ඇති දැන් මොනවත් කියන්නෙ නොකොහොමද..?

කසාදෙට කාඩ්ස් බෙදලත් ඉවරනෙ කියල... ඒත් නංගී එකට පවුල් කනව කියන්නෙ මුළු ජීවිත කාලෙම එකට ජීවත් වෙන එක..."

මම ඒත් කතා නොකළෙමි.

"කාව හරි රිදවන්න තව කාව හරි කසාද බඳිනවා නම් ඒක සාර්ථක විවාහයක් නෙමේ... ඒ වගේම කසාදෙද ගැන හරි සතුටක් හැඟීමක් නැතිව බඳිනව කියන්නෙත් පස්සේ දුක් විඳිනවා කියන එක..."

ශානු අයියා කීවේය. මම දිගටම මුණිවත රැක්කෙමි.

"ඔයාට කාලය තියෙනවා නංගී... හෙට බඳින දවස උනත්.. එදාට මට අකමැතියි කියලා හිතුණොත් ඔයා මට අකමැතියි කියන්න... මං තරහ නෑ.."

ශානු අයියා ගැන අනුපමේය වූ වේදනාව මුසු හැඟීමක් පහළවිණි. මම ශානු අයියාගේ උරහිසට හිස තබා ගත්තෙමි.

"දුක්වෙන්න එපා.... ඔයා ඔයාගෙ ජීවිතේ හොයා ගන්න නංගී..."

කවුදෝ කාමරයට එබිණි. මම වහා හිස ඇද ගත්තෙමි. ඒ නිමසරය. නිමසරගේ මුහුණේ තරහත් කෝපයක් ඇතුළු වී තිබිණි. ශානු අයියා නැගිට නිමසර එක්ක මොනවාද කියමින් එළියට ගියේය. මම කැඩපත ඉදිරියේ හිට ගත්තෙමි. මගේම පිළිබිඹුව මට දොස් පවරයි. මගේ ජීවිතය ආපස්සට ගොස් තියේ. දවස් ගෙවෙන්නේ නැතිව නතර වෙනවා වැනිය.

"පාළුයි වගේද...?"

අමිතා අම්මා කාමරයට ආවාය.

"මං මේ බැලුවෙ දවස් ගාණක් දූ.. දුකින් වගේ..."

"එහෙම නෑ අමිතා අම්මා..."

"නෑ පුතේ, මොනව හරි තියේ නම් කතා කරල බේරගන්න පුළුවන්..."





"ඇත්තටම අමිතා අම්මා නැත්නම් සමහර වෙලාවට මාත් නෑ... මට ජීවත් වෙන්න පුළුවන් වුණේ ශානු අයියයි අමිතා අම්මලයි නිසා..."

මම කීවෙමි. ජීවිතේ සමහර අවස්ථා වලදී අපට කටුක තීරණ ගන්න සිදු වේ. ආදර සම්බන්ධතා බිඳුණත් ආයේ ජීවිතය ලස්සනට ගෙනියන ගැහැනු ඕනෑ තරම් වෙති. ඉතින් මා මගේ ජීවිතය මගේ සතුට විතරක් හිතා මේ වෙලාවේ ශානු අයියාගේ සතුට ඔහුගේ ජීවිතය විනාශ කර දමන්නේ කොහොමද... නැත. දැන් කළ හැකි දෙයක් නොවේ. නිමසරත් විවාහකයෙකි. මමද යම් තීරණයක් ගත් කෙනෙක්මි. මේ පවුලට ලැජ්ජා කරන්නට මට කිසිම අයිතියක් නැත. ඉතින් නිහඬව කාමරේට වී ඉන්නට මම සිතුවෙමි. හැකි හැම මොහොතේම නිමසරගෙන් ඈත් වී සිටිය යුතුය. හොඳම දෙය දූහැන්යා දැනුවත් කිරීමය. මම දූහැන්යාට දුරකථන ඇමතුමක් ගත්තෙමි.

"කියන්න ශෝබා..."

"ඔයා මෙහෙ එන්නැද්ද...? මට පාළුයි දූහැන්යා... මගෙ ළඟින් ඔයා හිටියනම් කියලා හිතෙනවා..."

"නිමසර මාව දාලා තනියම ගියා... රණ්ඩුත් කරන්... දැන් ඉතින් මං එනවා... ඔයා එන්න කිව්වනෙ..."

දූහැන්යා කීවාය.

"එන්න... අදම... දැන්මම.."

"ඕකේ බබා... මම එනවා..."

මට සතුටක් දැනිණි. දූහැන්යා ගැනත් දුක සිතිණි. එදා සිටම ඈ නිමසරට පෙම් කළාය. ඇගේ ජීවිතයත් සතුටින් ගෙවෙන්නේ නැත. එයට නිමසර වාගේම මාද වැරදිකාරියකැයි මට සිතිණි.

"ශෝබා..."

නිමසර කාමරයට එනතුරු මම නොදුටුවෙමි.

"යන්න එළියට නිමසර... ඔයා මෙහෙම එන එක හොඳ නෑ..."

මම කීවෙමි. නිමසර කිසිවක් නෑසුණා වාගේ මගේ අනෙක් කෙළවරේ යහනේ හිඳ ගත්තේය.

"ඔයා කොහොමද ශානුගෙ පපුවට ඔලුව තියාගෙන හිටියෙ... කොහොමද ශෝබා...?"

මම නෑසූ කන්ව උන්නෙමි. නිමසර හැසිරෙන විදිහ හොඳ නැත. එය භයානකය. ජීවිත කීයක් නැතිවී යාවිද..?

"අඩු ගාණෙ එහෙම ඉන්න ශක්තියක් ආවද ඔයාට..?"

"නිමසර දැන් සේරම වෙනස් වෙලා... මං ඔයාට ආදරෙයි... ඒක මැරෙනතුරුත් හිතේ තියෙයි... ඒත් දැන් මට ඔයා වෙනුවෙන් මුකුත්ම කරන්න බෑ..."

"පුළුවන්..."

නිමසර කෑගැසුවේය. කාට හෝ ඇසේවියැයි මම බියට පත් වීමි.

"විකාරද...?"

"ඔව් මට විකාර.... තමුසෙ මාව විකාර කාරයෙක් කරන්න එපා.... මං මොනවා කරයිද දන්නෑ..."

නිමසර නැගිට්ටේය. කාමරයේ එහා මෙහා ඇවිද ගියේය.

"මට මොනවද කරන්න කියන්නෙ..?"

මම ඇසුවෙමි.

"මේ කසාදෙ නතර කරනවා..."

"ඒක කරන්න බෑ..."

"ඒක කරන්න වෙනවා..."

"බෑ නිමසර.. ඔයා අවුරුදු ගාණක් මං උන්නද මළාද බැලුවෙ නෑ... මට පිහිට වුණේ ශානු අයියා... දැන් සේරම වෙනස්.... ඔයා කසාද බැන්ද කියලා දැන ගත්තට පස්සෙයි වෙනස් වුණේ.."

"මට තිබුණු ප්‍රශ්න ඔයා දැනං හිටියද... මං මං... ඔයා වෙනුවෙන් මොන තරම් ඇඬුවද දුක් උනාද පසුතැවුණද අම්මා





හිටියෙ මැරෙන්න ඔන්න මෙන්න..."

"ඔයා ඔයාගෙ අම්මා ගැන හිතන තරමට මාත් අමිතා අම්මා ගැන හිතනවා නිමසර..."

"ශෝබා..."

"මං වැරදි තීරණයක් ගන්නෑ. ඇයි දන්නවද..? ශානු ගැන නෙමෙ මට වැඩිය දුක මං ගන්න තීරණේකින් අමිතා අම්මලට මොනවා හරි උනොත් මට ඉඳල වැඩක් නෑ..."

"ඔයා මං ගැන හිතන්නෙම නැද්ද..?"

"දැන් ඔයා ගැන හිතන්න මට අයිතියක් නෑ... හැම දේම වෙනස් වුණා..."

"ශෝබා..."

නිමසර පහත් වී මගේ අත් දෙකින්ම අල්වා ගත්තේය. ඊළඟට දණ නමා මගේ අත් දෙක ඔහුගේ පපුවට ඇද ගත්තේය.

"මට ඔයා ඕනෑ... මං දන්නෙ එච්චරයි... කොහොම හරි හොඳින් හරි... නරකින් හරි..."

නිමසර යන්න ගියේ එහෙම කියාගෙනය. ඇත්තටම හිතට ආවේ බියකි. නිමසර කුමක් හෝ වැරදි පියවරක් ගනු ඇතැයි යන බිය මා වෙලාගෙන තිබිණි. විවාහයට තව දවස් කීපයක් නිසා මුළු ගෙදරම ශානු අයියාගේ ඥාතීන්ගෙන් පිරී තියේ. දෙවියනි ඔවුන්ට ලැජ්ජාවක් සිදු වුවොතින් මට හොඳක් වන්නේ නැත.

"හායි ශෝබා..."

දුහැන්යා කීවාය. ඇගේ පැමිණීම මට සතුටක් විය. මම ඇයට තුරුළු වීමි.

"මොකද බයවෙලා වගේ...?"

දුහැන්යා ඇසුවාය.

"අනේ මංදා මට බයයි..."

මට කියවිණි. දුහැන්යා මගේ මුහුණ බලා උන්නාය.

"ඇයි මොකද උනේ...? නිමසර ඔයාට බදින්න එපා කියනවා නේද..?"

"ඔයා කොහොමද දන්නේ...?"

"ඔක කියන්න දෙයක්යැ... මං නිමසරව දන්නවනෙ.."

දුහැන්යා කීවාය.

"මට දැන් හිතෙනවා මං මොකටද ශානුව බඳින්න කැමති උනේ කියලා..."

මම කීවෙමි. දුහැන්යා තැති ගත්තාය. ඈ මගේ උරහිස් තදින් අල්වා ගත්තාය.

"විකාරද...?"

"මං මොකද දුහැන්යා කරන්නෙ..? නිමසර ගැනත් දුකයි..."

මම ඇත්තම කීවෙමි.

"මං ගැන දුක නැද්ද ශෝබා..?. මාත් ගෑනියෙක්... ඒත් නිමසර මාව හිතන්නේ පිට කෙනෙක් විදිහට... අපි කසාද බැන්දට මං තාම කෙල්ලෙක්... ඔයාට මා ගැන දුක හිතෙන්නේ නැද්ද..? කවද හරි එයා වෙනස් වෙයි කියලා හිතලා මං බලා ඉන්නවා..."

"එයා කවදාවත් වෙනස් වෙන්නෑ දුහැන්යා... ඔයාට වඩා එයාව මං දන්නවා..."

මම කීවෙමි. නිමසර කාමරයට ආවේ ඒ වෙලාවේය. දුහැන්යා කතාව නතර කර නිමසර ළඟට හිනැහී ගියාය. නිමසරගේ අතක වෙලුණාය.

"හොරා වගේ මාව දාලා ආවා... ඔන්න මාත් ආවා..."

දුහැන්යා කීවාය. නිමසර තම අත දුහැන්යාගෙන් ඇද ගත්තේ කෝපයෙනි.

"මේ.. ආව නම් පාඩුවේ ඉන්නවා... මං තමුන්ට කිව්වා මට බඳින්න බෑ කියලා. අපේ අම්මව ඉස්සර කරන් මාව බැන්ද නම් ඔය විදිහට ඉන්නවා.."





නිමසර කීවේය. දුහැන්යා නිමසරගෙන් ඈත් වී මා ගාවින් හිඳ ගත්තාය.

"ඔයාගෙ හිතේ තියෙන ඒවා කවදාවත් ඉෂ්ඨ වෙන්නෑ මං ඉන්නකම්..."

දුහැන්යා කීවාය.

"ඇත්ත තමුසෙ කළේ ඒක... මගෙ හිතේ තියෙන සේරම නැති කළේ තමුසෙ.."

නිමසර කීවේය. ශානු කාමරයට ඇතුළු වූයෙන් කතාබහ නතර විණි.

"ආ දුහැන්යා ඇවිත්නෙ... කොයි වෙලේද ආවෙ..? දැක්කෙත් නෑ.."

"ඔයාට ඉතිං අපිව පේන්නෑනෙ..."

"නැහැ දුහැන්යා දන්නැද්ද වැඩනෙ... අපේ අම්මලට හොඳටම කරන්න ඕනැ මේ වෙඩින් එක... පව්..."

ශානු අයියා කීවේය. මගේ පපුව හෝස් ගෑවේය. මම නිමසර දෙස බැලුවෙමි.

"ශෝබා... චුට්ටක් එන්නකො..."

ශානු අයියා කතා කළේය. මම ශානු අයියාගේ පිටුපසින් ගියෙමි.

"ඇයි ඔයා බයෙන් වගේ...?"

"නෑ ශානු අයියා..."

"ඔයාට මූකුත් හංගන්න බෑ... අපි හැමදේම කතා කරලයි කළේ. ඔයා මට මොනා හරි හැංගුවොත් මං ඔයා ගැන කළකිරෙයි.."

"එහෙම නෑ ශානු අයියා..."

"මං චවුන් එකට යනවා... එන්න ඔයත් යන්න... ඇඳුමක් දාගෙන..."

"හා..."

මම ආයේ කාමරයට ගියෙමි. මා යද්දී නිමසර හෝ දහැන්යා නොසිටියහ. මම සුදට හුරු ගවුමක් හැන්දෙමි. දිග කොණ්ඩය පිට දිගට වැටෙන්නට දුන්නෙමි. මොහොතක් කැඩපතට එබුණෙමි. අප්පච්චි උන්නා නම්යැයි සිතිණි. මට ජිවත් වන්න ශක්තිය දුන මැනැවයි සිතිමි.

"ශෝබා එන්න.."

ආයේ ශානු අයියා කතා කළේය. මම ඉක්මනට එළියට ගියෙමි. ශානු අයියාට පිටුපසින් උන්නේ නිමසරය. ඒ නෙත් මා ගිලින්නට වාගේ විය.

"කොහේ යන්නද ශානු...?"

නිමසර ඇසුවේය.

"මේ ටවුන් එකට බං..."

"මාත් එනවා... උඹල එක්ක..."

"යමං ඉතිං..."

මට ශානු අයියා ගැන දුක සිතිණි. නිමසර මේ කරන දේ හොඳ නැත. ශානු අයියා එක්ක නිමසර වාහනයේ ඉදිරියෙන් නැග්ගේය. මම පිටුපසින් නැග්ගෙමි. දහැන්යා පෙනෙන්න නොසිටියාය. ඈ මුළුතැන් ගෙයි වන්න ඇත. ඈ උන්නා නම් ඇවත් එක්ක යන්න තිබිණි.



# 12

මම දුක පෙළ ගස්වාගෙන උන්නෙමි. මටම නොතේරෙන වේදනාවක පටලැවී මම වද වින්දෙමි. ශානු මා වෙනුවෙන් බොහෝ කැප කිරීම් කළ කෙනාය. නිමසර, මගේ හුස්මට සමවැදී උන් පෙම්වතාය.

"කොහෙද යන්නෙ...?"

මම ශානුගෙන් ඇහුවෙමි. පිටුපස හැරී මදෙස බැලුවේ නිමසරය.

"මට හිතුණා ඔයාට වෙන වෙඩින් සාරි එකක් ගන්න..."

"ශානු අයියා විකාරද..?"

මම ඇසුවෙමි.

"නෑ මං ඊයෙ ලස්සන සාරි එකක් දැක්කා අහම්බෙන්..."

"ඒත් ශානු අයියා... අර ගත්ත සාරි එකටත් හුගක් වියදම් කළානෙ... ඇත්තටම බොරුවට සල්ලි වියදම් කරනවට මං කැමති නෑ..."

"මං ලොකු සල්ලිකාරයෙක් නම් නෙමේ... ඒත් මට ඔයා තරම් සල්ලි වටින්නෙ නෑ ශෝබා..."

ශානු අයියා කීවේය. නිමසර ඇස් පුංචි කර ශානු අයියා

දෙස බැලුවේය. ප්‍රසිද්ධ 'සාරි සෙන්ටර්' එකක් ළඟ රිය නතර කෙරිණි. ශානු අයියා මගේ අත අල්වා ගත්තේය. නිමසර අප පිටුපසිනි. ඔහුට රිදෙන බව දනිමි. මේ වෙලාවේ ඔහු රිදවන එක පව්ය.

"මොනවද සර් බලන්නේ...?"

"වෙඩින් සාරි... අර ඩමි එකේ දාලා තිබුණේ..."

"ආ ඒකද..? ඒක නම් ගාණ සැරයි මහත්තයො... ලක්ෂෙට එහා..."

මගේ නෙත් ලොකු විණි. ශානු අයියා මගේ මුහුණ බැලුවේය.

"විකාරද...?"

"මා ළඟ එච්චර සල්ලි නෑ... පනහක් හැටක් තමයි අරන් ආවෙ... ෂත්..."

"ඒක තමයි... ඔය තරම් වියදම් කරන්න මං රැජිණක්ද..? යමු ශානු අයියා..."

මම ආපහු හැරුණෙමි. ශානු අයියාත් හැරුණේය.

"ෂත්... මට ගාණ අහලයි ඔයාව එක්ක එන්න තිබුණේ... මං ළඟ තියෙන සල්ලි වෙඩින් එකට ගාණට... මේ වැඩිපුර සල්ලි ටික..."

"ඒක හොඳයි... ඔය විකාර වැඩ වැඩක් නෑ... මං කැමති නෑ..."

"ඒ උනාට ඒ සාරි එක හරිම ලස්සනයි... ඔයා හුඟක් ලස්සනට ඉඳී..."

අපි වාහනයට නැග්ගෙමු. ශානු අයියා උන්නේ දුකිනි. මටත් ඔහු ගැන දුක සිතිණි.

"කෝ නිමසර...?"

ශානු අයියා ඇහුවේ රියට නැගය. නිමසර පඩිපෙළ බසිමින් සෙනඟ අතරින් එමින් උන්නේය. ඔහු අතෙහි වූයේ වටිනා සාරියක





පාර්සලයකි. මම බියවී බලා උන්නෙමි. නිමසර එය ගෙනැවිත් ශානු අයියා අතේ තැබුවේය.

"නිමසර..."

"මේ... උඹ ආස කළ සාරිය..."

"පිස්සුද..? ඒක ගන්න මං ගාව සල්ලි මදියි... ඒකයි..."

"හරි... මං යාළුවනෙ... තව මුකුත් කියන්න එපා.... ඕක ශෝබාට දීපං..."

ශානු අයියා පිටුපස හැරී පාර්සලය මා අත තැබුවේය. මගේ මුළු සිරුරම ගැහෙමින් තිබිණි. මේ වන්නේ මොනවාද සිතා ගන්නටත් බැරි තරම්ය. මේ දේවල් මෙහෙම වනවාට මගේ ආශාවකුත් නැත. මම සාරිය ගෙනැවිත් කාමරයේ අල්මාරියට දැම්මෙමි.

"කොහෙද අයියෝ ගියෙ...? මං හැමතැනම හෙව්වා.."

දූහැන්යා ඇසුවාය.

"මේ ශා...නු එක්ක එළියට ගියා..."

"අපේ නිමසරත් ගියාද...?"

"මේ... ඔව්... ශානු කතා කළේ..."

මම බොරුවක් කීවෙමි. කාමරයට වී ඉඳී එළියට යන්නැයි කීවේ ශානුය. මා දුක් වන බව ඔහුට දැනුණාදැයි මට සිතිණි.

"ඔහොම කාමරේට වෙලා ඉන්නෙ ඇයි...? අර දූහැන්යත් ඉන්නෙ..."

"නිකං හිටියෙ... මං යන්නං..."

මම කාමරයෙන් එළියට ආවෙමි. මගේ මුහුණට හමුවුණේ දූහැන්යා නොවේ නිමසරය. ඒ පාළු කොරිඩෝරයේදීය. නිමසර මගේ අතකින් ඇදගෙන මා ගබඩා කාමරයට ඇද ගත්තේ මට හිතන්නවත් ඉඩ නොදීය.

"නි.. ම.. සර.."

"ප්ලීස්..."

"මොනවද මේ කරන්නෙ..? ඔයා හොඳ සිහියෙන්ද..? ඔයා හදන්නේ මට ලැජ්ජා කරන්නද...?"

මම කෑගැසුවෙමි.

"ඔයා කියන එකක්වත් නෙමේ... මාව තේරුම් ගන්න..."

"මොනව තේරුම් ගන්නද... ඔයා ඒ සේරම නැති කළා..."

නිම්සර මගේ අත් දෙක මුදා හළේය. ඒත් මම බිත්තියට හේත්තු වී ගත් විදිහටම උන්නෙමි. මේ වෙලාවට මෙහි වෙන කිසිවකු නොඑන බව මම දන උන්නෙමි. යන්තම් අඳුරුය. නිම්සරගේ කහ පාට මුහුණ මට කළුවරට හරි හැටි නොපෙනේ.

"මට දරාගන්න බෑ ශෝබා..."

මම කිසිවක් නොකීවෙමි.

"ශානු හොඳ එකා... ඌ ඔයාට හුඟක් ආදරෙයි... ඒකත් මට තේරෙනවා... ඒත්... මට වාව ගන්න බෑ... ඔයාව අනුන්ට දෙන්න බෑ... අපි මේ ගැන ශානු එක්ක කතා කරමු..."

"විකාරද..?"

"ඔයාට මොනවම හරි කරන්න වෙනවා... නැත්නම් මං ජීවත් වෙන එකක් නෑ.."

"පොඩි බබෙක් වෙන්න එපා... ඔයා හිත හදාගෙන දුහැන්යා එක්ක ජීවත් වෙන්න..."

මම කීවෙමි.

"බම්බුව..."

නිම්සර අත මිට මොළවා බිත්තියට පහරක් ගැසුවේය.

"ඔයා කැමති තීරණයක් ගන්න... ඒත් මං මොනව කරයිද කියල හිතන්න එපා... ඔයාටවත් ශානුටවත් අබමල් රේණුවක කරදරයක් කරන්නෑ.... ඒක මං කරගන්නේ මටමයි.."





නිම්සර කීවේය.

"ඔයා දුන් ඇත්ත තේරුම් ගන්න ඕනෑ.. ඔයාට මාව අයිති නෑ..."

මම කීවෙමි. නිම්සර මගේ උරහිස් අල්වා උරහිසට හිස තබාගෙන හඬන්න වූවේය. ඉකිබිඳිමින් හඬන්න වූවේය.

"යන්න... ශෝබා... ඔයා කසාද බඳින්න... සතුටින් ඉන්න... මාව සදහටම අමතක කරලා දාන්න...."

මම කතා නොකළෙමි. ගබඩා කාමරයෙන් එළියටත් නොගියෙමි.

"යන්න ශෝබා... යන්න..."

ඔහු ආයෙත් කීවේය. ඒත් මම නොගියෙමි. ඊළඟට නිම්සර මා තුරුළු කරගෙන මගේ දෙකොල... මුව සිපගත්තේය. ඔහු මා කිටි කිටියේ තුරුළු කරගෙන උන්නේය.

"මාව අමතක කරලා දාන්න ශෝබා.... ඔයාට පුළුවන් නම් කරලා දාන්න.."

එහෙම කී නිම්සර මා අතැර යන්න ගියේය. මම තවත් මොහොතක් එහෙමම ගබඩා කාමරයට වී උන්නෙමි. මට මගේ හුස්ම ගැනීමේ වේගය පවා ඇසිණි. කළුවරත් වැටී තියේ. ඇස් දෙකින් හෝ ගා කඳුළු වැටී ගොස් තියේ. මම පහත් වී හැද උත් ගවොමින් කඳුළු පිසදා ගත්තෙමි. ඉන්පසුව ගබඩා කාමරයෙන් එළියට ආවෙමි.

"මං හැමතැනම හෙව්වා.... කොහෙද බං ගියෙ..?"

දුහැන්යා මා අතකින් ඇදගෙන සාලය වෙත ගියාය. නිම්සර පෙනෙන්න උන්නේ නැත.

"කෝ දුහැන්යා නිම්සර...?"

ශානු අයියා ඇසුවේය.

"හදිසි වැඩ වගයක් තියෙනවා කියලා ගෙදර ගියේ...?"

"එහෙමද...?"

නිමසර ආවේ නැත. දුහැන්යා දුරකථන ඇමතුම් දුන් නමුදු ඔහුගේ දුරකථනය විසන්ධි කොට තිබිණි. පහුවදා දුහැන්යා ගෙදර ගියාය. ඇ ගිය පසු දුරකථන ඇමතුමක් දුන්නාය.

"දුහැන්යා... නිමසර ඉන්නවා නේද...?"

"නෑ. ශානු.. කොහේ ගිහින්ද මන්දා..."

"හරි... ඔයා එහෙනම් එන්නකෝ..."

"ඕ... කේ... මං එන්නං.."

ශානුගේ මුහුණේ ඇඳුණේ මහා බරක සේයාවකි.

"ඇයි...?"

"මූ ගෙදරත් නෑලු... ඔයාවත් කෝල් එකක් අරන් බලන්න.."

"ෆෝන් එක ඕෆ් කරල නම් මං අරගෙන වැඩක් නෑනෙ..."

මම ගණනකට නැතිව කීවෙමි.

"ඒකත් ඇත්ත... අනේ මංද මේකා මොනව හිතේ තියන ඉන්නවද කියලා..."

ශානු අයියා කීවේ මගේ මුහුණ දෙස බලාගෙනය. නිමසර ගැන හදවතේ ගුලි ගැහී තිබෙන වේදනාව මහා සාගරයක් තරමට ඉහළ නැග නැග එන්නට පටන් අරගෙන තිබිණි. පන්සල් ගොස් ලොකු හාමුදුරුවන්ගෙන් මා ඇසූ බණ මා ඇසූ ධර්මය මට වැඩක් නැති වී ගියා නොවේද...? සියල්ල ප්‍රයෝජනයක් නැති වී ගියා නොවේද...? සියලු ප්‍රශ්න වලට පිළිතුර කාලය බව අසා තිබුණෙමි. එහෙනම් මගේ මේ ප්‍රශ්නය විසඳීමටත් කාලය උවමනාය. ඒත් මේ විවාහය නතර කර කාලය ඉදිරියට තබා ගන්නේ කොහොමද...? මම යහනට ගුලි වුණෙමි. පොරෝනය ඉනේ සිට දෙපා දක්වාම දමා ගත්තෙමි.

"පුතේ..."

අමිතා අම්මා කාමරයට එද්දීත් මා උන්නේ එහෙමය.





"ඇයි පුතේ...?"

"ඇඟට හරි නෑ මට සනීප නෑ වගේ...."

මම කීවෙමි.

"මේ මොකද මේ...?"

"ඔළුව රිදෙනවා හොඳටම..."

"එහෙනම් ඩොක්ටර් කෙනෙක් ළඟට යන්න වෙයි... කෝ මේ ශානු... ශානු.. ශානු..."

අමිතා අම්මා කාමරයෙන් එළියට හනික ගියාය. "දෙවියෝ - බුදුන් ඇත්නම් මට සමාව දෙත්වා..." යැයි මම සිතුවෙමි.

"ශෝබා... ඇයි මේ...?"

"ඔළුව රිදෙනවා... හොඳටම..."

මම කීවෙමි.

"යමු ඩොක්ටර් කෙනෙක් ළඟට..."

"එපා මෙහෙම ටිකක් නිදාගෙන බලනවා..."

"එහෙනම් පෙනඩෝල් බීලා දුම් ටික්කවත් අල්ලලා බලමු.... සෙමටත් වෙනවනෙ..."

ශානු අයියා කිවේය.

"හා හා... මං වතුර හැළියක් ළිප තියන්නං..."

හිසේ සිද්ධාර්ථ තෙල් තවරා නළල් පටෙහි සිද්ධාලේප තවරා දුම් අල්වා පෙනඩෝල් බීවත් මගේ හිතේ අමාරුව අඩු වුණේ නැති බව දැනගත් පසු ශානු අයියා මා වෛද්‍යවරයෙකු වෙත ගෙන ගියේය. වෛද්‍යවරයා මා පරීක්ෂා කළේය. මම හිස බිඳාගෙන හැඬුවෙමි.

"මට හිතෙන්නේ මේ මයිග්‍රේන් කියන තත්ත්වය... එයාට එයාව පාලනයක් නැති තරම් හිස කැක්කුම... අපි තව පරීක්ෂණ වගයක් තියනවා ඒවත් කරල බලමු..."

මට දුක සිතුණේ ශානු අයියා ගැනය. මේ සියල්ල බොරුය. මට කිසිම රෝගයක් වූයේ නැත. ඒත් මම පොළොවේ හැපෙමින් හැඬුවෙමි. මා රෝහල් ගත කළේ එයින් පසුය.

"වෙඩින් එකට දවසයි... කාගෙ ඇස්වහක් වැදුණද දරුවො..?"

අමිතා අම්මා උන්නේ හැඬූ කඳුළිනි. මෙවන් අම්මා කෙනෙකු රිදවීමේ පාපයට මට මතු ආත්මයේත් මගේ අම්මා නැති වනු ඇත. මා මොනවා කරන්නද..? මේ විවාහය නතර කර ඔවුන්ට ලැජ්ජා කරනවාට වඩා අසනීපය නිසා විවාහය කඩාකප්පල් වීම හොඳය. දුහැන්යා එක්ක නිම්සරද මා බලන්න ආවේය. මම ඉවත බලා උන්නෙමි.

"පුදුම වැඩක්නෙ නිම්සර මේ කෙල්ලට වුණේ..."

දුහැන්යා කීවාය. නිම්සර කතා කළේ නැත. දින ගණනක් නිම්සර කොහේ හිටියේදැයි දැනගන්න උවමනා උනත් එය දැන ගන්න මෙය වේලාව වූයේ නැත. ශානු අයියා උන්නේ දැඩි වේදනාවෙනි.

"ඩොක්ටර්ස්ලට ලෙඩේ අහු වෙන්නැත්තෙ ඇයි පුතා..? බලන්නකො ශෝබාට හරිම අමාරුනෙ..."

"බලමු අම්මා... මගෙත් ඔළුව විකාර වෙලා...."

ශානු අයියා කීවේය. මම සැරින් සැරයට විලාප දී හැඬුයෙමි. හිස බදාගෙන හැඬුවෙමි. නිම්සරද බියවී උන්නේය. ඒ ඇස්වල කඳුළු මම දුටුවෙමි.

"පිට රටකටවත් අරන් යමුද..?"

නිම්සර ඇහුවේ ශානුගෙනි.

"කවුරු හරි මේ කෙල්ලට හූනියමක් කරලා..."

අමිතා අම්මා කීවාය. එය එහෙමමැයි ශානු අයියාගේ නෑදෑයෝ පිළි ගත්හ...

"ශෝබා..."

ශානු අයියා මා ළඟටම වී උන්නේය. මා නින්දෙන් ඇහැරුණ





විතරය. හරිනම් අපේ විවාහය යෙදී තිබුණේ අදටය. මා කළ බොරුව මා මේ පවුල දාපු මූලාව මාම රිදවා මාම බිය ගන්වා තිබිණි.

"ඔයාට ඒ ගමන හොඳටම උණනෙ..."

ශානු අයියා කියන තුරු මගේ සියොළඟ ගිනි කබල වගේ රස්නය දෙන බව මට දැනුණේ නැත.

"බලන්නකො ඒ ගමන කෙල්ලට උණ ගන්නවා..."

හේමන් තාත්තාද දැසේ කඳුළු පුරවාගෙන කියවුවේය. දැන් මගේ විවාහ දිනය අවසන්ය. තවත් මේ මිනිසුන් බිය ගැන්විය යුතු නැත. ඉතින් මම කෑගසා නොහැඬීමි. හිස රිදෙන බව කියා විලාප නොතැබීමි.

"දැක්කද..? කසාදෙ දවස ගෙවුණා විතරයි කෙල්ලට ආරක්ෂාවක් කරල තොවිලයක් කරන්න වෙයි..."

"එහෙමවත් කරමු අක්කෙ. මං මේ කල්පනා කළේ... මේ දෙන්නට කසාද බඳින්න තිබුණු එකම නැකැත් දවස ආයෙ කසාද බඳින්න අවුරුදු තුනක් විතර බලා ඉන්න වෙනවා... දෙන්නටම ඊට කලින් කසාදෙ කෙරෙන එක හොඳ නෑ..."

අමිතා අම්මා කීවේ මීට පෙර මා දැන උන් දෙයක් නොවේ. දෙවියනි මගේ ප්‍රශ්න කාලයට බාර දෙන්නට ඔය කාලය හොඳටම ඇතිය. මම තදින් දෑස් පියවා ගත්තෙමි. හොඳින් උණ සුව වූ පසුව මා ආයේ ගෙදර රැගෙන ආවේය. ඇත්තටම මා කළේ බලාගත් අත බලා හිදීමය. එය කාව හෝ රිදවන්න සිතා කළා නොවේ. මා ශානු අයියාට මහා අපරාධයක් කළා යැයි සිතෙද්දීත් - සමහර විට මගේ ජීවිතයට මහා අපරාධයක් කරගත්තා යැයි සිතෙද්දීත් ඇති වූ ශෝකයය. නිම්සරව කෙතරම් දුරට විශ්වාස කරන්නද..? ඔහු දුහැන්යා දික්කසාද කරාවිද..? එහෙම කළත් ඔහු පිළිගන්න මට හැකි වේවිද..? දෙවියනේ මා මහා ගොන්කමක් කළා යැයි සිතෙන්නේ ඇයි..?

"ශෝබා..."

ශානු අයියා මා ළඟ යහනේ හිඳ ගත්තේය. මම යහනේ හිදී ඉරියව් වෙනස් කර හිඳගත්තෙමි.

"ඇයි ඔයා කල්පනා කරන්නේ...?"

"න්... නැහැ..."

"ඇයි නැත්තෙ.... ඔයා හුඟක් කල්පනා කරනවා... අම්මලා ඔයාට තොවිල් කරන්න ලෑස්ති කරනවා..."

"එපා කියන්න අයියා... මට දැන් හොඳටම සනීපයි... ඇයි බොරුවට සල්ලි වියදම් කරන්නෙ...?"

"අම්මට කිව්වට අහන්නෑ..."

ශානු අයියා එහෙම කියද්දීම අමිතා අම්මා මට කිරි තේ එකක් රැගෙන කාමරයට ආවාය.

"බොන්න දූවේ..."

"අම්මා...."

අමිතා අම්මා මා දෙස හිනැහී බලා උන්නාය. තම පුතාගේ මගුල අතරමග කැඩිලාත් ඔවුන් මෙහෙම හිත හදාගෙන ඉන්නේ කොහොමද...?

"කියන්න පුතේ...."

"අම්මා මේ තොවිල් කරන්න හදන එකට නම් මං කැමති නෑ..."

මම කීවෙමි.

"එහෙම කියල..."

"නෑ අම්මා... මං කැමති නෑ... මට දැන් හොඳටම සනීපයි... බොරුවට සල්ලි වියදම් කරන්නත් එපා... අම්මල තොවිලයක් තියන්න හැදුවොත් මං එදාට ශානුත් එක්ක ඇවිදින්න යනවා."

අමිතා අම්මාට සිනා නැගිණි.

"අනේ මං... දා..."

හිනැහෙමින් ඇ යන්න ගියාය. ශානු අයියා කිසිවක්ම කීවේ නැත. ඔහු කුමක් හෝ හිතේ තබාගෙන දුක් විඳිනවායැයි මට





සිතිණි. ඒත් ඒ කුමක්දැයි කුමකටදැයි මට තේරුණේ නැත.

"අපේ කසාදෙ ආයේ කෙරෙයිද ශෝබා..?"

ශානු අයියා මගේ මුහුණ බලාගෙනම ඇසුවේය. ඔහුට දෙන පිළිතුර කුමක්ද..? ආයේ සැරයක් බොරුවක් කියා ඔහු රවටනවාද..? නොවේ. මුණිවත රකිනවා මිස මට වෙන කළ හැකි දෙයක් නොවේ.

"ඇයි මුකුත් නොකියන්නේ..?"

"අම්මා කියනවා අවුරුදු තුනකින්ලු ආයෙ හොඳ නැකතක් තියෙන්නේ..."

මම කීවෙමි.

"ඔව් ආදරේ ළඟ තියෙනව නම් අවුරුදු තුන මොකක්ද..?"

මම කියාගත්තෙමි.

"ඔයා මාව අමතක කරාවිද ශෝබා..?"

"වෙන මුකුත් කියන්නෑ අයියා... ඒත් මං එකක් දන්නවා. මේ ආත්මෙදි නම් මට අයියව අමතක වෙන්නෙ නෑ.."

මම ඇත්තම කීවෙමි. ශානු අයියාගේ ඇස්වල කඳුළු පිරිණි.

"අපිත් එන්නද.... ලෙඩ්ඩු බලන්න..?"

කාමරයට මුලින්ම ඇතුළු වූයේ දහැන්යාය. ඉන්පසුව ඇගේ පිටුපසින් නිම්සරය. මම වහා නිම්සර දෙස නොබලා ශානු අයියාට ළං වීමි.

"කුමාරයයි කුමාරියයි වගේ ඉන්නවානේ කසාද බැඳගත්තනම්..."

දහැන්යා කීවාය. ශානු අයියාගේ මුහුණ තවත් අඳුරු විය.

"අපි කසාද බඳිනවා තමයි දහැන්යා..."

මම කීවෙමි. ශානු අයියාගේ මුහුණ පිපිණි.

"මං හිතුවා ශානුව අතාරින්න බොරු රඟපෑමක්වත් කළාද කියලා..."

"දුහැන්යා... ලෙඩේ බලන්න ආවද වැඩ් කරන්න ආවද..?"

ඒ නිම්සරය. නිම්සර දිගටම දුහැන්යාට බැන්නාය.

"ඇති ඇති... ඔව නවත්තපං..."

ශානු අයියා කීවේය. දුහැන්යාට කියන දේ මතක නැත. මොහොතකින් සියල්ල අමතක වෙයි.

"ඔය හඳහන් ඕනැ නෑ බං උඹල ඉක්මනට බැඳපල්ලා..."

දුහැන්යා කීවේ නිම්සරට ඇසෙන්නය. කිසිවකු එයට කිසිවක් කීවේ නැත. හඳහන් බලන්නේත් ඒ ගැන තීරණය කරන්නේත් අම්තා අම්මා බව අපි දත උන්නෙමු.

"අපිත් ආයෙ ඕස්ට්‍රේලියා යන්නයි හිතා ඉන්නෙ..."

දුහැන්යා ඊළඟට කීවාය. මම ඉක්මන් ඇසින් බැලුවෙමි. නිම්සර ඇස්වලින් කුමක් හෝ කීවේය. මම ඉවත බලා ගත්තෙමි. මොනම විදිහකින්වත් නිම්සරට බුරුලක් නොදී සිටිය යුතුයැයි මට සිතිණි. ඔහු කාලයත් එක්ක ඔහුගේ මුරණ්ඩු තීරණ වෙනස් කරගනු ඇත.

"අපරාදෙ අපි මගුල් ගෙදරට මොන තරම් මහන්සි උනාද...?"

ලොකු අම්මා මුළුතැන් ගෙයි දොඩවමින් උන්නාය. ඒත් ඇ මා දුක කතාව වෙනතකට යොමු කළාය.

"මං හිත්දා හැමතැනම ප්‍රශ්න.."

මම මටම කියා ගත්තෙමි. ඇස්වලට කඳුළු ආවේ මගේ අනාගතයත් ගෙවුණු යටගියාවත් සිහිවිය.

"ශෝබා..."

ආයේ නිම්සර මා තනි කරගත්තේය. මම කතා නොකළෙමි.

"මට ඔයා ගැන දුකයි... ඔයා දැන් සතුටින්ද..?"

නිම්සර ඇසුවේය.

"ඔව්..."





මම නුවුමනාවෙන් කීවෙමි.

"දුහැන්යා කියන්නෙ බොරු.. මං රට යන්නෑ... මං එයාගෙන් ඩිවෝස් එක ඉල්ලල තියෙන්නෙ..."

"ඇයි මට ඕව කියන්නෙ..."

මම නිම්සරගේ මුහුණ දෙස බලා ඇසුවෙමි.

"මට ඉන්නෙ ඔයා විතරක් නිසා..."

නිම්සර කීවේය.

"ඔයාට ඉන්නෙ දුහැන්යා... මේ ජීවිත සේරම පටලවන්න එපා... ඔයාට මට කියන්න තියෙන්නේ එච්චරයි..."

මම කීවෙමි.

"මං ඔයාට හුඟක් ආදරේ කළා... ඒක මගෙ වරදක්... මං ඒක පිළිගන්නවා..."

නිම්සර කතා කළේ වේදනාවෙනි. ඒත් ඒ වේදනාවට හවුල් කාරියක වන්න මට නොසිතිණි.

"ඔයා හුඟක් දුක්ඛ වෙලා. ඉස්සර ශෝබා ඔයා නෙමේ..."

නිම්සර කීවේය.

"මං දුක්ඛ වුණා... කෙල්ලෙක්ට වෙන්න ඕන සේරම උනාට පස්සේ ඒ කෙල්ලට වුණ දේවල් එක්ක මං දුක්ඛ වුණා..."

මම කෝපයෙන් කීවෙමි.

"ඔයා දුක්ඛ වෙන්න හැදුවට ඔයාට එහෙම වෙන්න බෑ.."

නිම්සර කීවේ ඇත්තක්දැයි මා දන්නේ නැත. මගේ මුහුණේ ඔහු කී දෙයෙහි සත්‍යය අසත්‍යය දත ගැනීමේ උවමනාව වූයේත් නැත. ජීවිතය මහා පඹ ගාලක පැටලී ඇත. මේ සියලු දේට වරද කරුවා නිම්සරය. ඔහුම මිස වෙන කවරෙක්ද...?

# 13

ආයේ ජීවිතය පරණ වී තියේ. ශෝබා - ශෝබාවක් නැති ජීවිතයක් ගෙවයි. ඒ ජීවිතයේ සිනාත් නැත. කඳුළුත් නැත. ඔහේ බලාගත් අත බලාගෙන සති ගණන් ගෙවිණි. ඒ කාලය පුරා මම කිසිවකු සමඟ කතා කරන්න හෝ නොගියෙමි. හුදකලා වීම සමහර ප්‍රශ්න වලට ඔසුවකියි මට සිතිණි. නිම්සර දින ගණනක් මා හමුවන්නට පැමිණි බව මම දැන උන්නෙමි.

"ඇයි ශෝබා පේන්න නැත්තෙ...?"

මා නොදැක දින ගණනක් ගිය තැන නිම්සරගේ හඬ මට ඇසිණි.

"අසනීපෙන් පස්සෙ ශෝබා හරියට වෙනස් වෙලා නිම්සර... වැඩිය කා එක්කවත් කතා කරන්නෑ... කවුරුත් කතාවට එනවට කැමති නෑ..."

"එහෙමද.... ඒත් ඔහොම ඉන්න එකේ තේරුමකුත් නෑ නේද..?"

"අනේ මංද බං...."

"අපේ ගෙදර යං.... ශෝබාත් එක්කරගෙන..."

නිම්සර කීවේය. මම යහනට ගුලිවී තව ටිකක් තදට ඇස් පියවා ගත්තෙමි. මහා වේදනාවක් හදවත තියේ. මේ කිනම් වේදනාවක්ද....?





"ශෝබා...."

ශානු අයියා කාමරයට ඇවිත් කතා කළේය. මම ඇස් හැරියෙමි.

"උදේ දවල් රෑ තුනේම නින්ද යන්නැනෙ ශෝබා.... නැගිටින්න... අපි ගමනක් යං..."

මම ඇස් හැරියෙමි.

"ප්ලීස් ශෝබා... මං ඔයාට කරදර කරන්නෙ අඩුවෙන් නේද...?"

මට ඇත්තටම දුක සිතිණි. මම ඇස් ඇරියෙමි. ඇස් ඇර බැලුවෙමි. ඇස්වල දිගු කාලයක් තිස්සේ ඇඳුණු කඳුළු තිබෙන්න ඇත. විරහ වේදනාව තියෙන්න ඇත.

"මං කැමතියි ඔයත් එක්ක ටික දවසකට එළියට යන්න... දුහැන්යලගෙ ගෙදර... දුහැන්යාත් ඉන්නවනේ..."

ශානු අයියාගේ සිත රිදවන්න සිතුණේ නැත. ඒත් මේ වෙලාවේ නිම්සරගේ ගෙදර අප යන එක යුතුද..?

"ඔයා ඇඳගන්න... මං එළියෙ ඉන්නවා..."

ශානු අයියා යන්න ගියේය. මගේ විරුද්ධත්වයක් නොවුණු නිසා මා කැමතියැයි සිතන්න ඇත. මම නාන කාමරයට වැදුණෙමි. ඇඟපත සෝදාගෙන නිලට හුරු ඩෙනිම් ත්‍රීක්වාටර් කලිසමත් සුදු ටී ෂර්ටයත් හැන්දෙමි. මා මෙහෙම අඳිනවා නිම්සර දැක නැත. මට උවමනා ඔහු කුමන ක්‍රමයකින් හෝ රිදවන්නද..? මම සාලය වෙත ගියෙමි.

"ඇති යන්නං එළියට බැස්සා...."

අමිතා අම්මා කීවාය. මම මදහසක් නැගුවෙමි. නිම්සර මගේ හිසේ සිට පාදාන්තය දක්වාම අමුතු බැල්මක් හෙළුවා පමණි. මගේ දිග කොණ්ඩය කරළක්ව ගෙතුවේ අමිතා අම්මාය.

"ඔන්න ඔය හදහන් පැත්තකට දාලා දෙන්න එක්ක කසාද බඳින්න එක්කො.."

අමිතා අම්මා සිනාවී කීවාය. ශානු අයියා සාලයට ආවේ

'යමු' කියමිනි.

"දවස් දෙක තුනක් එහේ ඉන්නවනං ඇඳුම් ගන්නැද්ද..?"

අමිතා අම්මා ඇසුවාය.

"මං නම් බෑග් එකට දාගත්තා.... ශෝබා දාගත්තද..?"

"දාගත්තා..."

මම කාමරයට ගොස් ඇඳුම් කීපයක් බෑගයට අසුරා ගත්තෙමි. හිතේ සතුටක් වූවා නොවේ. මේ ගමන තවත් දුකකට හේතුවක් වේදැයි සිතිණි. ඒත් ශානු අයියාගේ සිත රිදවිය හැකි නොවේ. එනිසා මම මේ ගමනට එකතු වූවෙමි. වාහනයේ යද්දීවත් අප අතර කතාබහක් වූයේ නැත. ශානු අයියා ඔහුගේ රැකියාව ගැන නිමසර එක්ක දොඩවමින් ගියේය. මම රියෙන් එපිටට නෙතු යොමා උන්නෙමි. මේ නිමසර හදන්නේ ශානු අයියාවත් දූහැන්යාවත් දෙදෙනාවම රවටන්න නොවේද...?

"දූහැන්යාටත් සතුටු හිතෙයි ශෝබාව දැකලා..."

නිමසර කීවේ ඔහුගේ ගේ ඉදිරියේ රිය නතර කරද්දීය.

"මේ ගෙවල් උඹලගෙ අම්මා විකුණුව කියලයි ආරංචි උනේ..."

ශානු අයියා කීවේ නිමසරගේ මුහුණ බලමිනි.

"ඒ අපේ අම්මගෙ බොරු... මේව විකුණන්නෑ බං කවදාවත්.... අම්මට ඕනැ උනේ..."

යමක් කියන්න ගොස් නොකියා උන්නේය.

"අම්මට ඕනැ උනේ උඹව රවට්ටල දූහැන්යාට කසාද බන්දන්නද..?"

ශානු අයියා ඔහු නොකී වචන ටික කීවේය. නිමසර කිසිවක් කිවේ නැත.

"ඇත්තටම උඹයි දූහැන්යායි කසාද බැන්දෙ උඹේ කැමැත්තෙන් නෙමේද..?"

ආයේ ශානු අයියා ඇසුවේය. නිමසර වහා පිටුපස හැරී





මදෙස බැලුවේය. ඔහු කිසිවක්ම කිවේ නැත.

"අකමැත්තෙන් කසාද බැන්දත් කැමත්තෙන් කසාද බැන්දත් බැන්දට පස්සේ කරන්න දෙයක් නෑ ශානු අයියා..."

මම කීවෙමි.

"ඒකනං ඇත්ත..."

ශානු අයියා මා නිවැරදි බව කීවේය.

"කසාද බැන්දට පස්සේ පිරිමියට ඕනැ දෙයක් කරන්න පුළුවන් කියල හිතනව නම් වැරදියි... ගැනියෙකුට සමාජෙත් ලොකු දෝෂාරෝපණයක් එනවා ශානු අයියා... පිරිමියෙක් කවදද ඒ ගැන හිතුවෙ..."

මා රියෙන් බැස්සේ එහෙම කියමිනි. ශානු අයියාත් රියෙන් බැස්සේය. ඒත් නිමසර මොහොතක් රියෙන් නොබැස උන්නේය. දූහැන්යා ගේ ඇතුළේ සිට එළියට දිව ආවාය. අප දුටු ඇගේ නෙත් විසල් විණි. සතුටින් ඈ උඩ පැන්නාය.

"වාව්... එහෙනං ඔයාට අපිව මතක් උනා..."

"ඔව්... අපිටම මතක් වෙන්න එපැයි..."

මම කීවෙමි.

"නෑ බබෝ... මං එන්න හිටියා.... කෝ පොඩි පොඩි වැඩ වලට හිර වුණාම මුකුත් කෙරෙන්නෙ නෑ... නෙ..."

දූහැන්යා මා තුරුළු කරගෙන වාගේ ගෙතුළට ඇතුළු වූවාය. මම හැරී බැලුවෙමි. ශානු අයියා පිටුපසින් ආවත් නිමසර තවමත් වාහනයට වී අප දෙස බලා උන්නේය. නිමසර ගැන වේදනාවක් නැතුවා නොවේ. ඔහුත් මාත් සතුටින් හිනාවී ජීවිතයේ සැප දුක බෙදා ගත් කාලයක් විණි.

"ඉඳගනිං... ඔන්න අද යන්න බෑ... සතියක් විතර මෙහේ ඉඳලා ටිකක් ඇවිදල යං..."

දූහැන්යා කීවාය.

"ටික දවසක් ඉන්න තමයි දූහැන්යා ආවෙ... ශෝබාගෙ හිතට හොඳවෙයි කියල හිතුවා...."

ශානු අයියා කීවේය. නිමසර ගෙතුළට ආවේ අපේ ඇඳුම් බෑග් ද අරගෙනය.

"දෙන්නට එක කාමරයක් හොඳ වෙයි මගෙ හිතේ..."

දූහැන්යා හිනැහුණාය. නිමසර විදුලි සැර වැදුණා වාගේ මදෙස බැලුවේය.

"නෑ දූහැන්යා.... එහෙම හොඳ නෑනෙ... අපට කාමර දෙකක්..."

ශානු අයියා කීවේය.

"අනේ උඹල වගේ ආදරවන්තයෝ දෙන්නෙක්..."

මා ඇත්තටම ශානු අයියාට ආදරේ කරනා බව දූහැන්යා පිළි අරගෙන තිබුණි. එය ඇගේ වචන වලින්ම මම දුටුවෙමි. මම හැකි හැම වෙලාවේම දූහැන්යා ළඟට වී උන්නෙමි. හැන්දෑවේ තේ බීමෙන් පසුව දූහැන්යා මා ඇදගෙන මිදුලට ගියාය. මම රෝස පාට ගවොම හැඳ කොණ්ඩය පිට දිගට කඩා දමාගෙන උන්නෙමි.

"ඔයා හරිම ලස්සනයි ඔහොම..."

ශානු අයියා කීවේ මිදුලට එද්දීය. එය දූහැන්යාටත් ඇසිණි.

"හා හා මහත්තයා නෝනට වශී වෙලා වගේ..."

"ඔව් දූහැන්යා මං ශෝබාට වශී උනේ ශෝබාව දැක්ක දවසෙමයි..."

ශානු අයියා කීවේය. නිමසර අප එක්ක වත්තේ උන්නත් ඔහු කතා කළ දෙයක් නැත. ඔහු ඔත්විල්ලාවේ හිදගෙන ඈත බලා උන්නේය. ඒත් විටින් විට මදෙස බලනවා මම දුටුවෙමි.

"ඔයා දන්නෑ ඉස්සර ශෝබාව දැක්කම දුවයි..."

දූහැන්යා කිවාය.

"ඒ කිව්වෙ..."





"ඉස්කෝලෙ යන කාලෙ... තෙම්ච්ච කිසිලි වගේ තෙල් ගාලා... ලෙඩ් පිරිලා ඔළුවෙ..."

දූහැන්යා හිනැහෙයි. මට බැලුණේ නිමසර දෙසයි. ඒ නෙත් වලට කඳුළු එනවා මම දුටුවෙමි. අනේ එහෙම අතීතයක් අපට තිබුණා නොවේද...?

"මේ වත්ත කොච්චර ලස්සනද...? ඇයි මල් ටිකක්වත් හිටවන්නෙ නැත්තෙ..."

මම ඇසුවෙමි.

"වැඩක් නෑ බං... අපි මොනවා හිටෙව්වත් පැළවෙන්නෑ... ඒවටත් අත්ගුණේ ඕනෑ.. උඹට වගේ අපට ඒක නෑ..."

"මට මල් ගෙනත් දෙන්න... මං හිටවන්නං..."

මම කීවෙමි.

"ඕකේ... නියමයිනෙ..."

දූහැන්යා උන්නේ සැහැල්ලුවෙනි. සතුටිනි. ඉසිං පවුල් ජීවිතය සාර්ථකව ගෙන යන්නේ නැත්නම් ඇය මෙතරම් සතුටින් ඉන්නේ කොහොමද...

"ඔන්න මං ලස්සන මල් පැල ගෙනාව නුගත් ඔයාගෙ අත් ගුණේ බලමු..."

ඇත්තය. දූහැන්යා ලස්සන මල් වර්ග කීපයක්ම ගෙනැවිත් තිබුණේය. නිමසර අතේද ලස්සන රෝස පැළයක් තිබිණි.

"මෙක..."

මම නිමසර අතින් සිනාවී එය ගත්තෙමි.

"ඕක සල්ලි දීල ගත්ත එකක් නෙමේ... එහා වත්තෙන් මං හොරෙන් උදුල්ල ගත්තෙ..."

"අනේ නිමසර ඔයානම් හොරෙක් අයියෝ... අයිරා ඇත්ථ ඔය පැළ හදන්නෙ ළමයි හදනවා වගේ... ඔයා කොහොමද මෙහෙම හොර වැඩක් කළේ...?"

දූහැන්යා හිනාවූවාය.

"ඔයා අයිරා ඇන්ටී එක්ක කතා කරද්දී මම පුංචි පැළයක් හෙමින් ගලව ගත්තා... අයිරා ඇන්ටී කයිය ගහද්දී ඔව පේන්නෙ නෑ... මං කා එක ඇතුළට දැම්මා.."

මටත් සිනා නැගිණි. මට වැඩ ගොඩකි. කම්මැලිකමක් දුකත් යන්නට මේ හොඳටම ඇතිය. හිත හදා ගන්නටත් පුළුවන. මම මල් පෝච්චි වල තිබුණු පැළ එහෙමම තබා ඒවාට සාත්තු කළෙමි. දුන් රෝස පැළය වෙනම සිටවූවෙමි.

"තවත් නම් නිවාඩු දාන්න බෑ නිම්සර... මට වැඩට යන්න වෙනවා... හෙට..."

ශානු ඒ රාත්‍රියේ කීවේය.

"අයියෝ..."

දූහැන්යා කීවාය. මම කිසිවක් නොකියා රූපවාහිනිය නැරඹුවෙමි.

"මං ජොබ් එකට යන්නං... ශෝබා හිටපුදෙන්... මං දවසක් ඇර දවසක් එන්න බලන්නං..."

"ඒත් එහෙම හරි නෑනෙ ශානු අයියා..."

"ඇයි හරි නැත්තෙ...? ඔන්න ඔහේ හිටපං බං... අපි අඳුනන්නැති අයද... එකට හිටිය උන්නෙ..."

දූහැන්යා කීවාය.

"ඔව් ඔයා ඉන්න..."

ශානු අයියද කීවේය. ඒත් මගේ හිතට එය හරි මදි වාගේ දැනිණි. එදවස අප මිතුරන්ය. ඒත් අද එහෙම නොවේ.

"ඒක නෙමේ මට කියන්නත් බැරිවුණා.... මගෙ යාළුවෙක් ඉන්නවා පොලීසියෙ... මිනිහා එක්ක කතා කළා ශෝබාගෙ ඉඩකඩම් වල අරුං පදිංචි වෙලා ඉන්න එක ගැන..."

ශානු අයියා කීවේය. මම තිගැස්සී බැලුවෙමි.





"මොකටද...? ශානු අයිය මට ඒව ඕනෑ නෑ... ඒ මිනිස්සුන්ගෙ හෙවනැල්ලක්වත් මට වදිනවට මං ආස නෑ..."

මම කීවෙමි.

"ඒක ඇත්ත... ඒත් උන්ට ඒව එහෙම නිකං දෙන්නෙ ඇයි..?"

"ඒකනං ඇත්ත..."

දූහැන්යාත් කීවාය. මම කිසිවක් නොකීවෙමි. ශානු අයියා පහුවදා උදයේ ගියේය. හැන්දෑවේ හෝ පහුවදා එන බව කීවේය. මට පාළුවකුත් දැනිණි. දුකකුත් දැනිණි. ශානු අයියා රැවටීම පවකියි සිතිණි. දූහැන්යාගේ මල්වත්ත දුන් ලස්සනය. එය බලා ඉන්න ආශා හිතේ. මම මේ පැළ වවන්නට කෙතරම් මහන්සි වූයෙම්ද..?

"මොනාද කල්පනා කරන්නෙ මල් පැළ දිහා බලාගෙන..?"

මා උන්නේ ඔන්විල්ලාවේය. නිම්සර මගේ පිටුපසය. මම තිගැස්සී බැලුවෙමි. කතා කරන්න වචන ආවේ නැත.

"අනුන්ගෙ වත්තක මල් පැළ හිටෙව්වට වැඩක් තියෙනවද...?"

නිම්සර ආයේ ඇසුවේය.

"මට මගෙ වත්තක් නැත්තං අනුන්ගෙ වත්තක හිටවපු මල් පැළේ ගැන උනත් මට දුකක් නෑ..."

මම ඇත්තම කීවෙමි.

"ඔයාට මං ආදරෙයි..."

නිම්සර උන්හිටි ගමන් කීවේය.

"ඔය ආදරේ දුන් ඔයාටවත් මටවත් ප්‍රයෝජනයක් නෑ නිම්සර..."

"ඔයා එහෙනම් ශානුව බැන්දෙ නැත්තෙ ඇයි...?"

නිම්සර ඇසුවේය.

"මං අසනීප උනා... ඔයා දන්නවා ඒක.."

"ඒ බොරු... ඔයා බොරු අසනීපයක් ගත්තා. හේතුව ඔයාටම

තීරණයක් ගන්න බැරිවුණා..."

පපුව හෝස් ගෑවේය. මට ලැජ්ජාවකුත් දැනිණි. දුකත් දැනිණි.

"ඔයා එහෙම දෙයක් කළ එකට මං ඔයාගෙ කකුල් අල්ලල වඳින්න වුණත් ලෑස්තියි... දූන් ඔයාගෙන් මාව වෙන් කරන්න කාටවත්ම බෑ ශෝබා..."

"දොඩෝනවද..?."

මම නිමසර දෙස බලා කෝපයෙන් ඇසුවෙමි. දූහැන්යා සාලයේ සිට එනවා මා දුටුවේ ඒ වෙලාවේය. මම හිනැහුණෙමි.

"මං තේ අරන් ආවා..."

"මොනවටද දූහැන්යා මහන්සි උනේ..?"

මම ඇහුවෙමි.

"මොන මහන්සියක්ද අනේ...?"

දූහැන්යා මට කිරි තේ එක පෑවාය. මම එය අතට ගත්තෙමි. ඈ මා ළඟින් හිඳ ගත්තාය.

"මගෙ මහත්තයා මොනවද කියන්නෙ...?"

දූහැන්යා ඇසුවේ නිමසර ඉදිරියේදීමය.

"එයා ඔයාට හුඟක් ආදරෙයි..?"

මම කීවෙමි. දූහැන්යා හයියෙන් හිනැහුණාය.

"මොන බොරුද..?"

"ඇයි..?"

මම හිනා නැතිව ඇහුවෙමි. දූහැන්යා කතා නොකළාය. නිමසර යන්න ගියේය. දූහැන්යාගේ ඇස්වල කඳුළු ගලනවා මම දුටුවෙමි.

"දූහැන්... ඇයි...?"

"නැහැ මුකුත් නෑ...."





"කියන්න දූහැන්යා..."

"නිකං බබෝ මට ඇඬුණා..."

"ඇයි කියන්න..?"

"නිකං... ආදරේ නැති කෙනෙකුට ආදරේ කරන්නත් එපා ශෝබා... ආදරේ නැති කෙනෙක් ළඟට ළං කරගන්නත් එපා..."

දූහැන්යා කීවාය. මම බියවී උන්නෙමි.

"මට ඔයාව තේරෙන්නෙ නෑ..."

"ඔයාට මාව තේරුම් ගන්න පුළුවන් වෙයි මෙහෙම ඉද්දී..."

එහෙම කියාගෙන දූහැන්යා යන්න ගියාය. උදේ දහයට පමණ දූහැන්යා වාහනය ගෙන කොහේදෝ යන්න ගියාය.

"මං ඉක්මනට එනවා..."

මම පුදුම වී උන්නෙමි. ගෙදර මා හා නිමසර බව දූන දූනත් ඈ එහෙම ගියේ ඇයි..?

"මොනවද මේ වෙන්නෙ...?"

මම මගෙන්ම ඇහුවෙමි.

"එයා දන්නවා එයාට මාව ලබාගන්න බැරි වුණා කියල..."

නිමසර කීවේය. ඔහු මා ළඟින් ඔන්චිල්ලාවේ හිඳ ගත්තේය.

"කොහෙද දූහැන්යා ගියෙ...?"

"දූහැන්යා ගියෙ ඔයාටයි මටයි කතා කරන්න ඉඩ දීලා..."

"ඒ මොන මෝඩ කමක්ද...?"

"දූහැන්යා දන්නවා මං එයාට මැරුණත් ආදරේ නොකරන බව..."

"ඔයා මේ කරන දේ හරි නෑ නිමසර..."

"මං ඔයාට ආදරේ කළා විතරයි..."

"ඔයා කසාද බැඳපු මිනිහෙක්... ඔයා ඔයාගෙ වගකීම

දැනගන්න..."

"අපි ඔය ගැන කතා නොකර ඉමු... මා එක්ක රණ්ඩු නොකර ඉන්න...."

නිමසර කීවේය.

"ඔයා මෙතනින් යන්න..."

මම කීවෙමි.

"බැහැ...."

"එහෙනං මං යනවා..."

මම එහෙම කියා ගෙතුළට ගියෙමි. මගේ කාමරයට ගොස් දොර වසා ගත්තෙමි. නිමසර ගෙතුළට එන හඬක්වත් ඇසුණේ නැත. පැයකට විතර පසු දූහැන්යා ආවාය.

"ඒයි... ඔයා කාමරේද...?"

මම දොර ඇරියෙමි.

"ඔව් මට නින්ද ගියා..."

"නින්ද ගියාද..? නිමසරගෙ කරදරෙන් බේරෙන්න.... කාමරේට ගියාද...?"

දූහැන්යා අත වූ එළවළු කූඩයක් අරගෙන කුස්සියට යන අතර තුර ඇසුවාය. මම කිසිවක් නොකියා ඇගේ පිටුපසින් ගියෙමි.

"මොනවද මේ වෙන්නේ...?"

මම ඇහුවෙමි.

"අපි ගැළපෙන්නෑ... මං මෝඩ වැඩක් කළා... ඔයාගෙ නිමසරව මං කසාද බැන්දා..."

දූහැන්යා මා වැළඳගෙන හඬන්න වූවාය.

"ඔයාට පිස්සුද...? මොනවද මේ කියන්නෙ...? ඔයා කසාද බැඳපු මහත්තයා එයා..."

"නෑ... ශෝබා නෑ... එයා ඔයාගෙ... එයා කවදාවත් මගේ





උනේ නෑ... වෙන්නෙත් නෑ..."

දූහැන්යා කෑගැසුවාය. මම බියවීමි.

"මට මේ බොරුව දැන් තිත්තයි... මං මේ ඇත්ත කියන්නෙ... මං ඩිවෝස් එක දෙනවා... නිමසරට... දෙනවා... ශෝබා..."

"දූහැන්යා..."

"ඒක නේද ඔයාටත් ඕන...?"

"විකාරයෙන් කියවනවද...? දෝඩනවද...?"

"නෑ ශෝබා... මං දන්නවා ඔයා නිමසරව ඕනෑ නිසයි ශානුව බැන්දෙ නැත්තෙ. මට නිමසර කිව්වා... ඔයා කවදාවත් බඳින්නෑ කියලා... ඒක හරි... ඔයා ගැන නිමසර දැනං හිටියා..."

මගේ ඇසින් කඳුළු වැටිණි. නිමසර ද කුස්සියට ආවේය.

"මගෙන් මොනවද ඔයාට වෙන්න ඕන...?"

මම ඇසුවෙමි.

"මං ඔයාගෙන් මගෙ කසාදෙ ඉල්ලුවොත්... නිමසරව ඉල්ලුවොත් ඔයාට දෙන්න පුළුවන්ද...?"

"දූහැන්යා නිමසර ඔයාගෙ... ප්ලීස් මං ඔයාගෙ පවුල කඩලා දාන්නෑ..."

"ඒක තමයි වෙන්නෙ ශෝබා... ඔයා කසාද නොබැඳ ඉන්න තාක්කල්... ඒක වෙන්නෙ... ඉතිං ඔයා නිමසර එක්ක සතුටින් ඉන්න... මං ඩිවෝස් වෙන්නං...."

"දූහැන්යා... ප්ලීස්...."

මම කෑගැසුවෙමි. නිමසර මා ළඟට ආවේය.

"දූහැන්යා මගෙන් ඩිවෝස් වෙනවනං ඒක හොඳනෙ ශෝබා. මේ කසාදෙ එයා බලෙන් කර ගත්තෙ..."

"ඔයා එක වචනයක් කතා කරන්න එපා... තේරුණාද...?"

මම නිමසරට කෑගැසුවෙමි. ඊළඟට මම සාලය දිගේ මගේ

කාමරයට දිව ගියෙමි. නිමසරත් දහැන්යාත් රණ්ඩු කරන හඬ ඇසිණි. මම ශානු අයියාට දුරකථන ඇමතුමක් ගත්තෙමි.

"ඇයි ශෝබා...?"

"දැන් එන්න..."

"ශෝබා... ඇයි...?"

"දැන් එන්න..."

මම කීවෙමි. ශානු අයියා ඊට එහා කිසිවක්ම ඇසුවේ නැත.



# 14

හාත්පස දැඩි අඳුරකි. ජීවිතය ඊටත් වඩා අඳුරුය. දහැන්යාගේ පවුල් ජීවිතය රැක දිය යුතුය. දැන් මගේ ප්‍රේමය හිස් අඳුරු ගුහාවකි. කිසිවකුට දොස් පවරා ඇති ප්‍රයෝජනයක් නැත. වැරදිත් මාය. වරදත් මගේය. ඒ ආදරය කළ වරදය. කැවුම් බැදෙන සුවඳ කොකිස් බැදෙන සුවඳ පැතිරී යයි. මේ හදිසි තීරණයකි.

"ශානු අයියා... අපි තව දවස් දෙකක් ඇතුලත කසාද බඳින්න ඕනැ..."

"ඊත් ශෝබා...."

"ඔයාගෙ කැමැත්ත කියන්න.. නැත්නම් ආයෙ කවදාවත්ම අපි කසාද බඳින්නෙ නෑ..."

"ශෝබා... මං ඔයාව කසාද බඳිනවා...."

අද කැවුම් බැදෙන්නේ ඒ හදිසි තීරණය අනුවය. බොරු ලෙඩ ගෙන මේ විවාහය කඩා බිඳ දැම්මෙත් මාය. අද විවාහය සිදු කරන්නෙත් මාය.

"මොනවද මේ වෙන්නේ...?"

නිමසර ඇවිදින්ය. මගේ කාමරය තිබුණේ අඳුරේය. ඒ අඳුරින් ඇත්වෙන්න දැන් මට බැරිය.

"ශෝබා මං ඔයාට කතා කරන්නෙ... කතා කරන්න... නැත්නම්

මෙතනට මිනිස්සුත් එයි..."

"මොනවද ඔයාට දැනගන්න ඕනැ...?"

මම යහනේ නිදි ඉරියව් වෙනස් කර හිඳ ගත්තෙමි.

"ඔයා ශානුව මෙහෙට කසාද බඳිනවද...?"

"ඔව්... ඉතිං...."

"ඉතිං..."

නිමසර 'ඉතිං' ගැහැව් සැරටය. ඔහු මා ළඟින් හිඳ ගත්තේය.

"ඔයා නැතුව මං..."

"ඔයා මෙහෙම කාමරේ ඉන්න එක හොඳ නෑ. ඒ නිසා යන්න..."

"ශෝබා... ඔයා මේ කරන්නෙ අපි සේරමගෙ මිනී වළවල් කපන වැඩක්..."

"ජීවිතය මරණය... ඒ දෙකම අපි තීරණය කළ යුතු නෑ... ඔයා නිසා මට සේරම නැති වුණා කියල මං ඔයාට බැන්නද...? නෑ. මං දූන් සත්‍යයට මූණ දෙනවා... ඔයා දැහැන්යාගෙ... මෙතනින් යන්න..."

"මෝඩ ගෑනි... මං.... මං...."

නිමසර කාමරයෙන් පිටතට ගියේය. මම ආයේ යහනේ නිදා ගත්තෙමි. ඉතිං සියල්ල නිමය. ප්‍රේමයත් ප්‍රේමයේ මතකයත් නිමය. මම කාමරයේ දොරවල් වසා දැමුවෙමි. ඒ නිමසර ඒවි සිතාය.

"ශෝබා..."

ඇත්තටම ආයේ නිමසර ඇවිදින්ය. ඒත් මම දොර නැරියෙමි. දෙතුන් වරක් නිමසර මට කතා කොට යන්න ගියේය.

"ශෝබා..."

ඊළඟට කතා කළේ ශානු අයියාය. මම දොර හැරියෙමි.

"ඇයි දොර වහන්...?"





"නිකං..."

"මං බයත් උනා..."

"ඇයි බය...?"

"නෑ නිකං..."

ශානු අයියා කාමරයේ විදුලි බුබුල ක්‍රියාත්මක කළේය. කාමරය සුදු පාට විය. කළුපාට සුදුපාට විය. මොහොතක් ඔහු එක එල්ලේ බලා උන්නේය.

"මෙ ගත්ත තීරණේ හරිද ශෝබා...?"

ඊළඟට ඔහු ඇසුවේය.

"ඇයි...?"

"නෑ මට හිතෙනවා..."

"හිතෙන දේ කියන්න..."

මම කීවෙමි.

"මෙ කසාදෙ ඔයාට සතුටක් මිසක් දුකක් වෙනව නම් වැඩක් නෑ..."

"මට සතුටක්..."

මම කීවෙමි. නිමසර කාමරයට ආවේ අප කතා කරමින් ඉද්දිය.

"එන්න නිමසර..."

"මෙකයි ශානු මේ කසාදෙ...?"

නිමසර එය කියා නිම කරන්න කලින් මම මැදට පැන්නෙමි.

"ඔව් ශානු අයියා.... නිමසර දන් ටිකකට කලින් ඇවිත් කිව්වෙත් මේ කසාදෙ කිසිම අඩුවක් නැතුව කෙරෙන්න එයාට ඕනලු... හුඟක් ලස්සනට..."

මම කීවෙමි.

"ඒ ගැන බය වෙන්න එපා නිමසර..."

ශානු අයියා කිවේය.

"මට වැඩ වගයකට එළියට යන්න වෙනවා.... නිමසර එහෙනම් කතා කර කර ඉන්නකො..."

ශානු අයියාත් පුදුමය. නිමසර ගැන බොහෝ දේ හොඳට දනගෙනත් මගේ ජීවිතයේ සතුට දුක ඔහු බව දන දනත් මා ඔහු එක්ක තබා යන්න ගියේය. නිමසර මගේ මුහුණ බලා උන්නේ වේදනාවෙනි.

"ඔයා සතුටින්ද...?"

"ඔව්..."

මම කීවෙමි.

"ඔයා ඇයි මෙහෙම කරන්නෙ ශෝබා...?"

"මට ශානුව ඕනැ ඒකයි..."

"ඔයා ඔය බොරු කියන්නෙ..."

"ඔයා වගේ මං බොරු කියන්නෙ නෑ..."

මම එහෙම කියාගෙන කාමරයෙන් එළියට ගියෙමි. ඊළඟට මා කළේ වැඩියම මුළුතැන්ගෙට වී හිඳීමය. වැඩ කරන ගැහැනුන් එක්ක ඕපා දූප කියවමින් හිනැහෙද්දී මමත් ඒවාට හිනැහුණෙමි. නිමසර දෙතුන් සැරයක් මුළුතැන් ගෙයි එහාට මෙහාට ගියේය. දහැන්යා ආවේ රාත්‍රියේය. ඈ කෙළින්ම මා ළඟට ආවාය.

"මේ මොනවද මේ වෙන්නෙ...?"

"කසාද බඳිනවා..."

"ඔයාට පිස්සුද ශෝබා...?"

"ඇයි කසාද බඳින එක පිස්සුවක්ද...?"

"ඔයා මේ කරන්නෙ හොඳ දෙයක් නෙමෙ..."

"දහැන්යා මං කරන්නෙ හොඳම හරිම දේ...."





ඉන් එහා මම ඇය එක්කත් කතාවට නොගියෙමි. මා මනාලියට අන්දවන කාන්ති අක්කා ආවේ රැය ගෙවී යද්දිය. ඇය එක්ක ආවේ ශානු අයියාය.

"එකම ගෙදර ඉඳන් දෙන්න කසාද බඳිනවා...."

කාන්ති අක්කා හිනැහුණාය.

"ඒක අපේ සිස්ටම් එක..."

ශානු අයියා හිනැහිණි. කෙට්ටුත් නැති මහතත් නැති මගේ හැඩ උස සිරුරට සුදු මංගල සාරිය ලස්සනටම තිබිණි.

"ශානු බයවෙයි... මගෙ කෙල්ල මෙච්චර ලස්සනද කියල..."

හිතමිතුරෝ හිනැහුණහ.

"ඇත්තටම සුරංගනාවක් වගේ... රජ කාලේ කුමාරිකාවක් වගේ..."

කාන්ති අක්කා කීවාය. දහැන්යා කාමරයට ආවේ ඒ වෙලාවේය. ඇය මා දැක ඇස්වල කඳුළු පුරවා ගත්තාය. නිමසරත් ආවේය. පපුව හෝස් ගානවා දැනුණත් මම ඔහේ බලාගෙන උන්නෙමි. ශානු අයියා මා දුටුවේ නැත.

"මට ශෝබා එක්ක කතා කරන්න ඕනැ...."

නිමසර කීවේය. කවුරුත් මුහුණට මුහුණ බැලූහ.

"ප්ලීස්..."

ලැජ්ජාව ඇරඹුනේ දෙපතුලෙනි.

"ඔව්... මටත්..."

දහැන්යා කීවාය. කවුරුත් කාමරයෙන් එළියට ගියහ. ඉතිරි වූයේ දහැන්යා හා නිමසරය. ඔවුහු දෙදෙනා මගේ දෙපසින් වාඩි වූවෝය.

"දන්නවද මමයි නිමසරයි දෙන්නම කැමැත්තෙන් ඩිවෝස් වෙන්න පෙරේද අපේ ලෝයර්ට ඩිවෝස් පේපර්ස් බාර දුන්නා..."

දහැන්යා කීවාය. මම ඇය දෙස නොබැලුවෙමි. මා රවටන්න

නව මොනවා කියාවිද..?

"නිමසර හිතුවෙත් මා ගැන වැරදියට... ඒත් මං හරි නෑ... මං මගෙ යාළුවගෙ ආදරේ කොල්ල කෑවා..."

දූහැන්යා කිවාය.

"මේ අහන්න ශෝබ, ඔයා නැතුව නිමසරට ජීවත් වෙන්න බෑ..."

"ඔය විකාර නතර කරන්න... මං ශානු අයියව කසාද බදිනවා..."

මම කීවෙමි. ශානු අයියා කාමරයට ඇතුළු වූයේ ඒ වෙලාවේය. ඔහුගේ මුහුණේ සතුටක් වූයේ නැත.

"මං සේරම අහන් හිටියේ..."

ඔහු කීවේය. මම දූහැන්යා දෙස කෝපයෙන් බැලුවෙමි.

"ශානු මේ කසාදෙ කෙරෙන එක හරි නෑ... ශෝබා නිමසරගෙ... මං නිමසරගෙන් ඩිවෝස් වෙන්න සයින් කළා... මගෙ කැමැත්තෙන්...."

"ඔය පිස්සු කියෙව්වා ඇති... මං බඳින්නෙ ශානු අයියව..."

මම කෑගැසුවෙමි. ශානු අයියා කිසිවක් කීවේ නැත. ඔහු මා ළඟින් හිඳ ගත්තේය.

"ශෝබා... ඔයාගෙ පිළියන්දලයි හොරණ ගේයි බිස්නසුයි සේරම දැන් ඔයාගෙ. ඊයේ රෑ කට්ටියක් මාමල නැන්දල පුතාල සේරටම වෙඩි තියල... මේ දැන් ආරංචියට මං ගියෙ..."

"මාමා නැන්දා..?"

මම වහා නැගිට ගත්තෙමි.

"ඔව්... ඔය සාරි ගලවන්න... එහේ මළගෙයක්..."

"දෙයියනේ ඒත්..."

"මරණයක්නෙ ශෝබා... ඒ ඔයාගෙම අයනෙ... වෙඩින් එකක් ගන්න බැනෙ..."





ශානු කීවේය. ඇත්තටම මට හැඬිණි. දූහැන්යා මට හැන්දවූ සාරිය ගලවා දැමුවාය. මම හැඬුවෙමි. මට දුක ඒ තොසන්ධාලයා ගැන නොවේ. මාමා හා නැන්දා ගැනය.

ශානු අයියාත් දූහැන්යාත් නිමසරත් එක්ක මම හොරණ ගෙදරට ගියෙමි. අකී අයියා පාතාල කල්ලියකට සම්බන්ධ වී සිටි බැවින් ඔවුන් ඔහුව හා ඔහුගේ දෙමාපියන්ව මරා දමන්නට ඇතැයි පොලීසිය විසින් සැක කරන ලදි. ඇස්වලට කඳුළු බිංදුවක් නැති වූයේ ඇයිදැයි නොදනිමි. නැන්දාගේ හා මාමාගේ ජීවිතවලට බොහෝ දුක් දී මරා දමා ඇති බව දක්නට ලැබිණි.

"දුක්කද..? මේ ඔයාටම කරපුව..."

දූහැන්යා කීවාය. ඒත් මම එකම වචනයක් නොකීවෙමි. දින දෙකක් ඇතුළතදී ඔවුන්ගේ මළ සිරුරු භූමදානය කරන ලදි. හත් දවසේ දානය දෙන තුරු නෑ හිත මිතුරෝ අපේ ගෙදර ගැවසුණහ. ඒ දුර ඥාතීන් මා දන්නා හඳුනන අය වූයේ නැති තරම්ය. දානය දීමෙන් පසුව ගෙදර රැඳුණු අය යන්න ගියෝය. ඉතිරි වූයේ මා හා උක්කු අම්මාය.

"අනේ මගේ දරුවෝ...."

උක්කු අම්මා මා වැළඳගෙන හැඬුවේ දන්ය. ඒත් මම නොහැඬිමි.

"අපි යනවා... සේරම කාලයට විසඳන්න ඉඩ දෙන්න..."

ශානු අයියා කීවේය. මම ශානු අයියා දෙස බලා උන්නෙමි. අම්මා අම්මාත් හේමන් තාත්තාත් මගේ හිස අතගෑහ. එදා වගේම අදත් ඔවුන් මට ආදරේය.

"පුතේ ඔයා මොන තීරණේ ගත්තත් ඔයා අපේ දුවමයි..."

ඔවුහු කීවෝය.

"අපි ගිහින් එන්නං..."

ශානු අයියා දූහැන්යා වාගේම ගෙදර උන් අන්තිම අමුත්තෝත් යන්න ගියහ. ඒත් නිමසර උන්නේය. මළ ගෙදර සියලු වැඩ කළේ නිමසර හා ශානු අයියාය.

"අනේ මහත්තයෝ... මහත්තයා එහෙනං මගෙ කෙල්ල බලා ගත්තා... මං ඒ දවල් අඬ අඬ හිටියෙ...."

උක්කු අම්මා කීවාය.

"ඇත්තටම උක්කු අම්මා මං නෙමේ ශෝබාව බලා ගත්තෙ මගෙ යාළුවා ගානු... එයාට මං ණයගැතියි..."

නිම්සර කීවේය. මම දුක් නොවන ඇසකින් මේ සිදු වූ සියලු දේ දෙස බලා උන්නෙමි. මුළු ගේ පුරාම රැඳී තිබුණේ මගේ ළමා කාලයේත් තාත්තාගේත් උක්කු අම්මාගේත් සුවඳය. මම හෙමින් මිදුලට බැස රබර් වත්ත දෙසට ගියෙමි.

"ඔය පැත්තෙ යන්න එපා බේබි..."

උක්කු අම්මා කිවත් මගේ දෙපා ඇදී ගියේ මගේ අතීතය දෙසටය. මම හෙමිහිට ඇවිද ගියෙමි. ඈත ගල් කුළ අදත් වේ. මම එයට හිමිහිට නැග්ගෙමි. මේ ගල උඩදී මාත් නිම්සරත් හමුවුණා නොවේද...?

"ශෝබා..."

නිම්සර මගේ පිටුපසින් උන් බව මම නොදන උන්නෙමි. මම කතා නොකර ගල උඩ හිඳ ගත්තෙමි. නිම්සරත් ඇවිත් මා ළඟින් හිඳ ගත්තේය.

"කාලය ගියා හුඟක්..."

ඔහු කීවේය.

"ඔව්.... අපි ලොකු වෙලා..."

මම කීවෙමි. මා ළඟට වූ නිම්සර මගේ කෙහෙරැල් අතරින් අතක් යැව්වේය.

"උකුණො නෑ..."

මම කීවෙමි.

"ඒ උනාට මං ආසයි ඒ දවස්වලට..."

නිම්සර කීවේය.





"මාත්...."

මම කීවෙමි. නිම්සර මගේ අත තදින් අල්වා ගත්තේය.

"මට සමාව දෙනවද...?"

"ඔයා වරදක් කළේ නෑ නිම්සර..."

"කළා... මට තිබුණෙ මුළු ලෝකෙම අතෑරලා දාන්න... කොටින්ම මගෙ අම්මවත්...."

ඔහු කීවේය. වියළුණු රබර් කොළ අපේ ඇගේ හැපී බිම වැටෙයි.

"පව්... අම්මලට එහෙම කියන එක පව්..."

මම කීවෙමි.

"ඒත් අම්මා නිසා ඔයා මගෙන් අතෑරුණා..."

"සමහර දේවල් අතෑරෙන්නෙ කවුරුත් නිසා නෙමේ... ඒ අපේ ලැබීම..."

මම කීවෙමි.

"ඔයා දූත් වෙනස් වෙලා..."

"ඔව්...."

මම නිම්සර දෙස බැලුවෙමි.

"ඔයාගෙ තීරණේ කියන්න..."

"මොනව ගැනද...?"

"මං ගැන..."

"දන්නෙ නෑ... ඔයා ගැන දුකයි ඒත්... අනේ මංදා..? මට කාලය ඕනෑ... මට ඔයා වගේම ගානු අයියා ගැනත් දුකයි..."

මම කීවෙමි. නිම්සර කෝප ගත්තේ නැත.

"ඔයා ගානුට දවසක් හරි ආදරේ කළාද...?"

මම කල්පනා කළෙමි. බැරෑරුම් ප්‍රශ්නයකි. ඇත්තටම ආදරය

විවිධ ස්වරූප ගනී. විටෙක දෙමාපියන් දරුවන්ට දක්වන ආදරය දරුවන් දෙමාපියන්ට දක්වන ආදරය - සහෝදරයින් සහෝදරියන්ට දක්වන ආදරය - පෙම්වතුන් ළඟ තිබෙන ආදරය මේ එකින් එක ලිහා බලන්නට ඇත්නම් ආදරය කෙතරම් වෙනත් රූප ගන්නේදැයි මට සිතිණි. එහෙම බැලුවොතින් මා ශානු අයියාට ආදරය කළා නොවේද..? මුළු ලෝකයම මා අත්හැර දමද්දී මගේ ළඟින් උන් ඔහුට මා ආදරය කළා නොවේද..?

"කියන්න ශෝබා.... ඔයා ශානුට ආදරේ කළාද..?"

"ඔව්..."

මම කීවෙමි. නිම්සරගේ ඇස්වලට කඳුළු පිරෙනවා මම දුටුවෙමි.

"ඇත්තටම..?"

"ඔව්...-

නිම්සර එයින් එහා කිසිවක්ම කීවේ නැත. අප අතර කිසිම කතාබහක් වූයේත් නැත. ඔහු මා වරදවා තේරුම් ගත් බව හැඟිණි. ඒත් එය නිවැරදි කරන්නට මට නොසිතිණි. මගේත් නිම්සරගේත් ප්‍රේමයෙන් අපට වූ සතුට කුමක්ද..? ඔහුත් දුකිනි. දහැන්යාත් දුකිනි. ශානු අයියාත් මමත් දුකිනි. අපි සියල්ලෝටම දුක් වෙමු...

"යමු..."

නිම්සර මගේ අත අල්ලාගෙන පියමං කළේය.

"ඔයාට දුකද...?"

මම බොහෝ වේලා ගෙන ඇසුවෙමි.

"නෑ..."

"ඇයි...?"

"ඔයාව මට කියවන්න පුළුවන්.... ඔයා ශානුට ආදරේ කරන්නේ මට ආදරේ කළා වගේ නෙවෙයි... ඒක මං දන්නවා... ඒක වෙනස්ම ආදරයක්..."





මට හිනා නැගිණි. මීටත් වඩා ගැළපීමක් කුමකටද..? ඔහු මා තේරුම් ගෙන තිබිණි.

"ඇයි හිනාවුණේ..."

"ඔයා දූත් තමයි මට ආදරේ කරන්නේ..."

මම කීවෙමි.

"ඔව්... ඉස්සර අපි පොඩියි... ඒ දවස්වල ඔයා ඔහොම දෙයක් කිව්ව නම් සමහර වෙලාවට මං ඔයාට කම්මුල් පාරක් ගහාවි... ඒත් දූත් මං පරිණතයි..."

මට තවත් සිනා නැගිණි.

"ඇයි...?"

"මට බයයි..."

"ඇයි...?"

"ඔය වගේ ලොකුවට හිතන අය එක්ක ජීවත් වෙන්නත් ලේසි නෑ...."

මම කීවෙමි. නිම්සර තව තද කර මගේ අත අල්වා ගත්තේය.

"මාව කවදාවත් ඔයාගෙන් ඈත් කරන්න හිතන්න එපා තේරුණාද...?"

"තේරුණා.... ඒත් මට ශානු අයියා ගැන දුකයි..."

මම ඇත්තම කීවෙමි.

"ශානු හුඟක් දුර කල්පනා කරලා වැඩ කරන කොල්ලෙක්... ඌ පොඩි පොඩි දේවල් ලොකුවට හිතන්නෙ නෑ... දන්නවද...? මට කිව්වා ශෝබා මට කවදාවත් ආදරේ කළේ නෑ... මචං ශෝබා ආදරේ කළේ උඹටයි කියලා...."

නිම්සර කීවේය. මම නිම්සරගේ මුහුණ දෙස බලාගෙන ගෙතුළට ඇතුළු වීමි.

"මහත්තයො..."

උක්කු අම්මා අප ළඟට ආවාය.

"මට පුතා කියන්න උක්කු අම්මා..."

නිම්සර කීවේය. ඈ හිනැහුණාය.

"මං මෙ කියන්න හැදුවෙ... මේ තුන්මාසෙ වැඩ කෙරුණට පස්සෙ අපේ බේබියි මහත්තයාගෙයි වැඩවලත් පිළිවෙළක් උනානම් හොඳ හොඳ...?"

"අපිත් එහෙම තමයි උක්කු අම්මා හිතා ඉන්නෙ..."

නිම්සර කීවේය. ආයේ අලුත් ජීවිතයක් ලැබුණා නොවේදැයි සිතිණි. නිම්සර ඔහුගේ ගෙදර ගියේය. දුහැන්යා ආයේ පිටරටට යන්න සූදානම් වූවාය.

"දුහැන්යා... ඔයා ගැන මට දුකයි..."

මම ඇත්තම කීවෙමි.

"බම්බුව... උඹ වගේ මං ඔය පුංචි ඒවා ගණන් ගන්නෙ නෑ..."

දුහැන්යා කීවාය.

"ඒ උනාට..."

"මං හොඳ කොල්ලෙක් හොයලා කසාද බඳිනවා..."

ඈ හිනැහුණාය. ඒත් ඒ ඇස්වල කඳුළු මම හොඳටම දුටුවෙමි. ඈ මගේ අත තදින් අල්වා අත්හැරියාය.

"මං යන්නම් බබෝ.."

"බුදු සරණයි දුහැන්යා..."

මගේ ගෙළ මුහුණ සිපගත් දුහැන්යා නිම්සර දෙස බැලුවේ ඊළඟටය. ඈ නිම්සරගේ අත අල්වා ගත්තාය.

"ඔයාව මුණගැහුණෙ පුංචි කාලෙ.... එතකොට මට ආදරේ ගැන මුකුත්ම තේරුණේ නෑ.... ඇත්තටම ඔයාව කසාද බැන්දට පස්සෙයි මට ආදරේ තේරුණේ.... ආදරේ කවදාවත් බලෙන් ගන්න බෑ කියලා මට තේරුණා. කවදාවත්ම ආදරේ ඇති කරගන්නත්





බෑ... ඒක ඉබේමයි ඇති වෙන්නෙ..."

ඇගේ ඇසින් කඳුළක් වැටිණි.

"ඒත් මේ ඇත්තමයි... මං ඔයාට ආදරේ කළා... ඒක මට දැන් දැනෙනවා... මං ආදරේ කරන විදිහ දැනගෙන හිටියෙ නැති උනාට මං ඔයාට ආදරේ කළා..."

මගේ ඇසින් කඳුළක් පැන්නේය.

"මං යන්නං...."

දුහැන්යා දුව ගොස් වාහනයට නැග්ගාය. මම නිම්සර දෙස බැලුවෙමි. දුහැන්යාගේ වාහනය පිටවිණි. නිම්සර මගේ ගෙළ වටා අතක් දමා ගත්තේය.

"හැමෝගෙම දුකට අඬනවා.... ඔයා දුක් වෙද්දි කවුද ඇඬුවෙ...?"

නිම්සර ඇසුවේය.

"දුහැන්යා පව්..."

මම කීවෙමි.

"දුහැන්යා ඇත්ත තේරුම් ගත්තා..."

නිම්සර කීවේය. ශානු අයියාට මුහුණ දෙන්නටත් ඔහුට සිදුවූ වරදෙන් ගැලවෙන්නටත් අපොහොසත්ව මම දුක් වින්දෙමි. ඒත් ශානු අයියාත් ඔහුගේ දෙමාපියෝත් මා බලන්න ආවෝය.

"තුන්මාසෙන් පස්සෙ ඔන්න දෙන්න කසාද බඳින්න ඕන..."

හේමන් තාත්තා කීවේය. මම බියවී නිම්සර දෙස බැලුවෙමි. ශානු අයියා හිනැහිණි.

"බයවෙන්න එපා දරුවො... ශානුව නෙමේ.... ඔයයි නිම්සරයි.. තේරුණාද...?"

මම ඇස්වල කඳුළු පුරවාගෙන බිම බැලුවෙමි.

"මං එක උපදෙසක් දෙන්නං... කසාදෙ කියන්නෙ එක එක වෙලාවට වෙනස් කරන දෙයක් නෙමේ... හිතුණ හිතුණ වෙලාවට කරන දේකුත් නෙමේ... හොඳ අවබෝධයක් ඇතුව තමයි කසාද බඳින්න ඕනෑ.... ඒක ඔය දෙන්නම දැනගන්න ඕන... නැත්නම්

ජීවිත කියක් විනාශ වෙනවද...?

අමිතා අම්මා කීවාය. මම ඇගේ දෙපා වැන්දෙමි.

"හරි අපි අපේ දූ කියල හිතල මේ මඟුල ලස්සනට කරනවා.."

"මට සමාවෙන්න ශානු අයියා..."

මම කීවෙමි.

"සමාව ගන්න ඕනැ මං... මං ඔයාගෙ හිත හඳුන ගත්තෙ නෑ..."

ශානු අයියා කීවේ මගේ හිසකේ අවුල් කරමිනි.

"අපි ගිහින් එන්නං..."

ඔවුන් ගිය පසු නිම්සර මගේ මුහුණ බලා උන්නේ ආදරයෙනි.

"ඇයි...?"

මම ඇහුවෙමි.

"නිකං..."

"ඇයි ඔහොම බලන්නෙ...?"

මම ආයේ ඇඬුවෙමි. නිම්සර හිනැහී මා ඔහුගේ පපුවට තුරුළු කර ගත්තේය.

"නිම්සර...."

"මං ආදරෙයි..."

"මාත්..."

මම කීවෙමි. ඇස්වල කඳුළු යන්තම් තැවරිණි. මේ ආදරේ ලබා ගන්නට ආත්ම කීයක් නම් මා බලා සිටියාද...? කොතරම් දුක් වින්දාද...? සුසුම් හෙළුවාද...?

"මුළු ජීවිතේම සතුටින් ඉමු. හාද...?"

"හා..."

නිම්සර මගේ නළලත සිප ගත්තේය. මේ ආදරේ ඉතිං මගේ මුළු ජීවිතය පුරාම ලැබේවා.

නිමි.

RPEi Ika

MANORI SILIKA WIKRAMA AR...

# ශෝභා

මනෝරි සිලිකා වික්‍රමආරච්චි

'මේ හදවත් ගඟ තවම ගලා බසී...
මේ තරම් ව්‍යසන මැදත්,
මේ තරම් දේ සිදුවී තිබියදීත්, කිසිවක්
සිදු නොවූ ගාණට මේ
හදවත් ගඟ ගලා බසී...
මා ලියූව හදේ ගැඹුරින් කියවන
ඔබට...යමක් ලියා තබමි...
සත්‍යය ඔබ දකින දේ නොමෙයි...
මිනිස්සු උපදිනවා... මැරෙනවා...
ආදරේ ඇතිවෙනවා...නැතිවෙනවා...
මල් පිපෙනවා...පරවෙනවා...
ඒකයි සත්‍යය...
හැමදේම නැතිවෙනවා නේද...?'



මළ් : 3584

Rs:275/=

ISBN 978-955-660-622-5

මල්පියලි ප්‍රකාශකයෝ (පුද්) සමාගම
මාවතගම, දංකොටුව.
Tel:031-2258444 Fax: 031-2258431
E-mail:malpiyali@gmail.com